253 වන කාණ්ඩය - 4 වන කලාපය
தொகுதி 253 - இல. 4
Volume 253- No. 4

2017 ජූලි 07 වන සිකුරාදා
2017 யூலை 07, வெள்ளிக்கிழமை
Friday, 07th July, 2017

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**

ජීවනෝපාය අහිමි වූ වෙළෙඳුන්ට අම්පාර බස් නැවතුම්පොළ සංකීර්ණයේ කඩ කාමර ලබාදීම

**පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනා:**

උපාධිධාරීන් සඳහා රැකියා ලබා දීමේදී නිසි ක්‍රමවේදයක් සකස් කිරීම

යුද්ධය නිසා දිවි අහිමි වූ ජනතාව සිහි කිරීම සඳහා අනුස්මරණ ස්මාරකයක් තැනීම සහ සිහිපත් කිරීම සඳහා පොදු දිනයක් වෙන් කිරීම

මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීම සඳහා අධිකාරියක් පිහිටුවීම

පුත්තලම දිස්ත්‍රික්කය ජාතික සහජීවනයේ හා සංහිඳියාවේ දිස්ත්‍රික්කය ලෙස නම් කිරීම

පෙර පාසල් අධ්‍යාපනය නඟා සිටුවීම සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙළක් සකස් කිරීම

---

# பிரதான உள்ளடக்கம்

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**தனி அறிவித்தல்மூல வினா:**

வாழ்வாதாரத்தை இழந்த வியாபாரிகளுக்கு அம்பாறை பஸ் நிலையத் தொகுதியில் கடைகளை வழங்குதல்

**தனி நபர் பிரேரணைகள்:**

பட்டதாரிகளுக்கு வேலைவாய்ப்புக்களை வழங்குவதற்கான ஒழுங்கான முறைமையொன்றைத் தயாரித்தல்

யுத்தத்தின்போது உயிரிழந்த மக்களை நினைவு கூர்வதற்காக நினைவுத்தூபியொன்றை அமைத்தல் மற்றும் நினைவுகூர்வதற்கான பொதுத் திகதி யொன்றைக் குறித்தொதுக்குதல்

போதைப்பொருட்களுக்கு அடிமையானவர்களுக்கு புனர்வாழ்வளிப்பதற்கான அதிகாரசபையொன்றைத் தாபித்தல்

புத்தளம் மாவட்டத்தை தேசிய சகவாழ்வினதும் நல்லிணக்கத்தினதும் மாவட்டமாகப் பெயரிடுதல்

முன்பள்ளிக் கல்வியை மேம்படுத்துவதற்கான முறைசார்ந்த வேலைத்திட்டமொன்றைத் தயாரித்தல்

---

# PRINCIPAL CONTENTS

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:

Provision of Shop Space at Ampara Bus Stand to Vendors who Lost Livelihood

PRIVATE MEMBERS' MOTIONS:

Developing a Proper Methodology to Provide Employment to Graduates

Building a Memorial for the People Who Lost Their Lives due to the War and Declaring a Common Day to Commemorate Them

Establishment of an Authority to Rehabilitate the Drug Addicts

Naming the Puttalam District as the District of National Coexistence and Reconciliation

Formulating a Methodical Course of Action to Uplift Pre-School Education

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2017 ජූලි 07වන සිකුරාදා***
*2017 யூலை 07, வெள்ளிக்கிழமை*
*Friday, 07th July, 2017*

**පූ.භා. 10.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப. 10.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.
The Parliament met at 10.30 a.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය හා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளு மன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)

ගරු කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම 2016 අංක 24 දරන විසර්ජන පනතේ 6(1) වගන්තිය යටතේ 2017.05.01 සිට 2017.05.31 දක්වා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂ අංක 240 යටතේ පරිපූරක සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය මඟින් සිදු කරන ලද පරිපූරක වෙන්කිරීම් පිළිබඳ සටහන ඉදිරිපත් කරමි.

එම පරිපූරක වෙන්කිරීම් පිළිබඳ සටහන රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමා වෙනුවෙන් මම 2013 සහ 2014 වර්ෂ සඳහා රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තා ඉදිරිපත් කරමි.

එම වාර්තා අභ්‍යන්තර පරිපාලන හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු හරින් ප්‍රනාන්දු මහතා - පැමිණ නැත.

ගරු ප්‍රසන්න රණවීර මහතා - පැමිණ නැත.

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 7-1504/'17-(1), ගරු වාසුදේව නානායක්කාර මහතා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු වසන්ත අලුවිහාරේ මහතා (කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த அலுவிஹாரே - கமத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon.Wasantha Aluwihare - State Minister of Agriculture)
ගරු කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සතියක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 12 -1409/'16- (1), ගරු බන්දුල ගුණවර්ධන මහතා.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

## යෝජිත කුරුණෑගල-දඹුල්ල දුම්රිය මාර්ගය: ශක්‍යතා අධ්‍යයනය
### உத்தேச குருநாகல் - தம்புள்ளை புகையிரத வீதி: சாத்தியவளக் கற்கை
### PROPOSED KURUNEGALA - DAMBULLA RAIL ROAD: FEASIBILITY STUDY

1069/'16

**1. ගරු බන්දුල ගුණවර්ධන මහතා (ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා වෙනුවට)**
(மாண்புமிகு பந்துல குணவர்தன - மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில சார்பாக)
(The Hon. Bandula Gunawardane on behalf of the Hon. Udaya Prabhath Gammanpila )
ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) යෝජිත කුරුණෑගල-දඹුල්ල දුම්රිය මාර්ගයේ ශක්‍යතා අධ්‍යයනය සිදු කිරීම ජාත්‍යන්තර තරගකාරි මිල ගණන් කැඳවීමකින් තොරව චීන සමාගමකට පවරා තිබේද;

(ii) නො එසේ නම්, පැවරීමට සැලසුම් කර තිබේද;

(iii) එම ශක්‍යතා අධ්‍යයනය මොරටුව විශ්වවිද්‍යාලයට හෝ වෙනත් දේශීය ආයතනයකට භාර නොදීමට හේතු කවරේද;

(iv) ඒ සඳහා ජාත්‍යන්තර තරගකාරි මිල ගණන් කැඳවීමක් නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) உத்தேசிக்கப்பட்டுள்ள குருநாகல் - தம்புள்ளை புகையிரத வீதிக்கான சாத்தியவளக் கற்கையை மேற்கொள்ளல் சர்வதேச போட்டி ரீதியிலான விலைமனுக் கோரலின்றி சீனாக் கம்பனி யொன்றுக்கு ஒப்படைக்கப்பட்டுள்ளதா என்ப தையும்;

(ii) இன்றேல், ஒப்படைப்பதற்கு திட்டமிடப்பட் டுள்ளதா என்பதையும்,

(iii) மேற்படி சாத்தியவளக் கற்கையை மொறட்டுவை பல்கலைக்கழகத்திற்கு அல்லது வேறொரு உள்நாட்டு நிறுவனத்திற்கு ஒப்படைக்காமைக் கான காரணம் யாதென்பதையும்,

(iv) இதன்பொருட்டு சர்வதேச போட்டி ரீதியிலான விலைமனுக் கோரல் மேற்கொள்ளப்படாமைக் கான காரணங்கள் யாவையென்பதையும்,

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

( ஆ)இன்றேல், ஏன்?

asked the Minister of Transport and Civil Aviation:

(a) Will he inform this House-

(i) whether the task of carrying out the feasibility study of the proposed Kurunegala - Dambulla rail road has been assigned to a Chinese company without calling for international competitive bids;

(ii) if not, whether plans have been made to assign that task in that manner;

(iii) the reason for not assigning the task of carrying out the aforesaid feasibility study to the University of Moratuwa or any other local institution; and

(iv) the reasons for not calling for international competitive bids for it?

(b) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) නැත.

(ii) නැත.

(iii) යෝජිත කුරුණෑගල-දඹුල්ල හරහා හබරණ දුම්රිය මාර්ගයේ ශක්‍යතා අධ්‍යයන කටයුතු ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය විසින් සිදු කොට එම ශක්‍යතා අධ්‍යයන අවසන් වාර්තාව 2009 වර්ෂයේ දෙසැම්බර් මස දී ප්‍රවාහන අමාත්‍යාංශය වෙත භාර දී ඇත.

(iv) මෙම යෝජිත කුරුණෑගල-දඹුල්ල හරහා හබරණ දුම්රිය මාර්ග ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යයනය කිරීමේ කොන්ත්‍රාත්තුව විවෘත මිල ගණන් කැඳවීමෙන් අනතුරුව සාර්ථක අවම මිල ගණන් ඉදිරිපත් කර තිබූ ටෙන්ඩර්කරු වන ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය වෙත ප්‍රදානය කර ඇත. ඒ අනුව එම ශක්‍යතා අධ්‍යයන කටයුතු ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය විසින් සිදු කොට ඇති බැවින් ජාත්‍යන්තර තරගකාරි මිල ගණන් කැඳවා ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීමේ අවශ්‍යතාවක් පැන නොනඟී.

(ආ) පැන නොනඟී.

## CAQ - 1043 හා CAQ - 1047 අංක දරන වාහන මිලදී ගැනීම : විස්තර
### CAQ - 1043 மற்றும் CAQ - 1047 இலக்க வாகனங்கள் கொள்வனவு: விபரம்
### PURCHASE OF VEHICLES BEARING NUMBERS CAQ-1043 AND CAQ-1047: DETAILS

1155/'16

**2. ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය සඳහා CAQ - 1043 හා CAQ - 1047 යන අංක දරන වාහන මිල දී ගෙන තිබේද;

(ii) එසේ නම්, එම වාහන මිල දී ගත් දින කවරේද;

(iii) එක් එක් වාහනය මිල දී ගත් මුදල කවරේද;

(iv) ඒ සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(v) එසේ නම්, එම දිනය කවරේද;

(vi) ටෙන්ඩරයට ඉදිරිපත් වූ ආයතන හා ඔවුන් ඉදිරිපත් කළ මිල ගණන් කවරේද;

(vii) එම වාහනවල මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි මුල් අයිතිකරුවන් කවුරුන්ද;

(viii) ඔවුන්ගේ ලිපිනයන් කවරේද;

(ix) රේගු වාර්තා අනුව මෙම වාහන ආනයනයේදී CIF වටිනාකම හා ගෙවූ මුදල කවරේද;

(x) එම වාහන සඳහා හිමි වූ බදු සහනය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

சுற்றுலாத்துறை அபிவிருத்தி மற்றும் கிறிஸ்தவ சமய அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) சுற்றுலாத்துறை அபிவிருத்தி மற்றும் கிறிஸ்தவ சமய அலுவல்கள் அமைச்சுக்கு CAQ - 1043 மற்றும் CAQ - 1047 ஆகிய இலக்கங்களைக் கொண்ட வாகனங்கள் கொள்வனவு செய்யப் பட்டுள்ளனவா;

(ii ) ஆமெனில், இவ்வாகனங்கள் கொள்வனவு செய்யப்பட்ட திகதிகள் யாவை;

(iii) ஒவ்வொரு வாகனமும் கொள்வனவு செய்யப் பட்ட விலை யாது;

(iv) இதற்கென கேள்விப்பத்திரங்கள் கோரப் பட்டதா;

(v) ஆமெனில், அத் திகதி யாது;

(vi) கேள்விப்பத்திரங்களை முன்வைத்த நிறுவ னங்கள் மற்றும் அவர்கள் முன்வைத்த விலை மனுக்கள் யாவை;

(vii) இவ்வாகனங்களின் மோட்டார் வாகனப் போக்கு வரத்துத் திணைக்களத்தில் பதிவு செய்யப் பட்டுள்ள ஆரம்ப உரிமையாளர்கள் யாவர் ;

(viii) இவர்களின் முகவரிகள் யாவை;

(ix) சுங்க அறிக்கைகளின்படி இவ்வாகனங்கள் இறக் குமதியின்போது CIF பெறுமதி மற்றும் செலுத்தப் பட்ட பணத்தொகை யாது;

(x) இவ்வாகனங்களுக்கு கிடைத்த வரிச்சலுகை எவ்வளவு;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

( ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Tourism Development and Christian Religious Affairs:

(a) Will he inform this House-

(i) whether vehicles numbered CAQ-1043 and CAQ-1047 have been purchased for the Ministry of Tourism Development and Christian Religious Affairs;

(ii) if so, the date they were purchased;

(iii) the price of each vehicle;

(iv) whether tenders were called for the purpose;

(v) if so, the date;

(vi) the institutions that were interested and the prices they submitted;

(vii) the first owner of those vehicles, registered under the Department of Motor Traffic;

(viii) their addresses;

(ix) the CIF value and the amount paid according to the Customs reports when importing these vehicles; and

(x) the tax relief granted for those vehicles?

(b) If not, why?

**ගරු ජෝන් අමරතුංග මහතා (සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜோன் அமரதுங்க - சுற்றுலாத்துறை அபிவிருத்தி மற்றும் கிறிஸ்தவ சமய அலுவல்கள் அமைச்சர்)
(The Hon. John Amaratunga - Minister of Tourism Development and Christian Religious Affairs)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර සභාගත කරනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
ගරු අමාත්‍යතුමනි, පිළිතුර කියවන්නකෝ. කාලය ඉතිරිව තිබෙනවානේ. ගරු කථානායකතුමනි, කාලය ඉතිරිව තිබෙනවා නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, අපි සාමාන්‍ය system එක අනුගමනය කරමු.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු මන්ත්‍රීතුමා, මෙහි සම්ප්‍රදායයක් තිබෙනවා නේ. මට නම් ප්‍රශ්නයක් නැහැ. උත්තරය ලෑස්ති කරලායි තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
System එක වෙනස් කරන්න එපා. එහෙම වුණොත් හරිම අමාරුයි.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) 2016 මැයි 11.

(iii) එක් වාහනයක් රුපියල් 28,000,000 බැගින්.

(iv) ඔව්.

(v) 2016 අප්‍රේල් 11.

(vi) 1. ටොයොටා ලංකා (පෞද්) සමාගම - රුපියල් 34,692,660.00

2. ඇසෝසියේටඩ් මෝටර් (පෞද්) සමාගම - රුපියල් 28,000,000.00

3. එස්.එම්.එල්.ෆොන්ටියර් ඔටෝමෝටිව් (පෞද්) සමාගම - රුපියල් 28,000,000.00

(vii) CAQ-1047 - නිලුපුල් ප්‍රියදර්ශන සම්පත්

CAQ-1043 - වීරගම ඉමියලාගේ චන්දික සේනානි

(viii) නිලුපුල් ප්‍රියදර්ශන සම්පත්,
24/12 B,
වීරකෝන් ගාර්ඩන්ස්,
මහනුවර.

වීරගම ඉමියලාගේ චන්දික සේනානි,
පුවක්වත්තහේන,
අයගම,
රත්නපුර.

(ix) නොදනී.

(x) අදාළ වාහන ලබා ගැනීම සඳහා මිල ගණන් කැඳවූ අවස්ථාවේ දී, සමාගම සතුව පැවැති තොගයෙන් (Ex. Stock) සැපයීම මත මිල ගණන් ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව මෙම වාහන අප අමාත්‍යාංශය වෙනුවෙන්ම ආනයනය කරන ලද වාහන නොවන බැවින් බදු සහනය පිළිබඳ විස්තර අදාළ මිල ගණන් ඉදිරිපත් කළ ලේඛනවල සඳහන් නොවේ.

(ආ) අදාළ නොවේ.

## විදුලිය ලබා දී ඇති නිවාස : මඩකළපුව දිස්ත්‍රික්කය
### மின்சாரம் வழங்கப்பட்ட வீடுகள் : மட்டக்களப்பு மாவட்டம்
### HOUSES PROVIDED WITH ELECTRICITY: BATTICALOA DISTRICT

1188/'16

**3. ගරු බන්දුල ගුණවර්ධන මහතා (ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා වෙනුවට)**
(மாண்புமிகு பந்துல குணவர்தன - மாண்புமிகு ஆர்.எம். பத்ம உதயசாந்த குணசேகர சார்பாக)
(The Hon. Bandula Gunawardane on behalf of the Hon. R.M. Padma Udhayashantha Gunasekera )

විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 1983 වර්ෂය වනවිට මඩකළපුව දිස්ත්‍රික්කය තුළ ලංකා විදුලිබල මණ්ඩලය විදුලිය ලබා දී ඇති මුළු නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට විදුලිය ලබා දී ඇති මුළු නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) වර්ෂ 1984 සිට 2009 දක්වා විදුලිය ලබා දීම වෙනුවෙන් වෙන් කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව කොපමණද;

(iv) 2009 වර්ෂයේදී යුද්මය තත්ත්වය නිම වීමෙන් පසු 2015 වර්ෂය දක්වා විදුලිය ලබා දී ඇති නිවාස සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව කොපමණද;

(v) ඉහත (iv) හි සඳහන් කාල පරිච්ඡේදය සඳහා විදුලිය ලබා දීම වෙනුවෙන් වෙන් කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 1983 ஆம் ஆண்டளவில் மட்டக்களப்பு மாவட்டத்தில் இலங்கை மின்சார சபையினால் மின்சாரம் வழங்கப்பட்டுள்ள வீடுகளின் மொத்த எண்ணிக்கை யாதென்பதையும்;

(ii) தற்போதைக்கு மின்சாரம் வழங்கப்பட்டுள்ள வீடுகளின் மொத்த எண்ணிக்கை யாதென்பதையும்;

(iii) 1984 முதல் 2009ஆம் ஆண்டுவரை மின்சாரம் வழங்குவதற்காக ஒதுக்கப்பட்டுள்ள பணத் தொகை ஆண்டு வாரியாக எவ்வளவென் பதையும்;

(iv) 2009ஆம் ஆண்டில் யுத்த நிலவரம் முடிவடைந்த பின்னர் 2015ஆம் ஆண்டு வரை மின்சாரம் வழங்கப்பட்டுள்ள வீடுகளின் எண்ணிக்கை ஆண்டு வாரியாக எவ்வளவென்பதையும்;

(v) மேற்படி (iv) இல் குறிப்பிடப்பட்டுள்ள கால கட்டத்தில் மின்சாரம் வழங்குவதற்காக ஒதுக்கப் பட்டுள்ள பணத்தொகை ஆண்டு வாரியாக எவ்வளவென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Power and Renewable Energy:

(a) Will he inform this House -

(i) the number of houses in the Batticaloa District that had been provided with electricity supply by the Ceylon Electricity Board by year 1983;

(ii) the total number of houses which have been provided with electricity supply by now;

(iii) the amounts allocated annually from year 1984 to 2009 for the supply of electricity on per year basis;

(iv) the number of houses that had been provided with electricity supply up to year 2015 after the end of war in year 2009 on per year basis; and

(v) the amount of money allocated for the supply of electricity during the period mentioned in (iv) above on per year basis?

(b) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 1983 වර්ෂය කාලයේ දී මෙම පළාතේ පැවති යුද්ධමය වාතාවරණය හා විවිධ දුෂ්කරතා හේතුවෙන් එවකට විදුලිය ලබා දීම් පිළිබඳව වාර්තා මේ වන විට ලංකා විදුලිබල මණ්ඩලය සතුව නොමැත.

(ii) මඩකළපුව දිස්ත්‍රික්කය තුළ විදුලිය ලබා දී ඇති මුළු නිවාස සංඛ්‍යාව 165,651කි.

(iii) වර්ෂ 1984 සිට 2002 වර්ෂය දක්වා විදුලිය ලබා දීම වෙනුවෙන් වෙන් කරන ලද මුදල් පිළිබඳ වාර්තා ලංවීම සතුව නොමැති අතර, 2003 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා මඩකළපුව දිස්ත්‍රික්කය තුළ විදුලිය ලබා දීම වෙනුවෙන් වෙන් කළ මුදල් පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| වර්ෂය | විදුලිය ලබා දීම වෙනුවෙන් වෙන් කරන ලද මුදල (රුපියල් මිලියන) |
|---|---|
| 2003 | 21.546 |
| 2004 | 45.286 |
| 2005 | 30.79 |
| 2006 | 61.82 |
| 2007 | 204.32 |
| 2008 | 175.97 |
| 2009 | 107.32 |

(iv) 2009 වර්ෂයේ යුද තත්ත්වය නිම වීමෙන් පසු 2015 වර්ෂය දක්වා මඩකළපුව දිස්ත්‍රික්කය තුළ විදුලිය ලබා දී ඇති නිවාස සංඛ්‍යාව පිළිබඳ විස්තර එක් එක් වර්ෂය අනුව පහත පරිදි වේ.

| වර්ෂය | එක් එක් වර්ෂයේ දී විදුලිය ලබා දී ඇති නිවාස සංඛ්‍යාව (මඩකළපුව දිස්ත්‍රික්කය) |
|---|---|
| 2009 | 8166 |
| 2010 | 7919 |
| 2011 | 6865 |
| 2012 | 9819 |
| 2013 | 8647 |
| 2014 | 7647 |
| 2015 | 8066 |

(v) 2009 වර්ෂයේ යුද තත්ත්වය නිම වීමෙන් පසු 2015 වර්ෂය දක්වා මඩකළපුව දිස්ත්‍රික්කය තුළ විදුලිය ලබා දීම වෙනුවෙන් වෙන් කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව පහත පරිදි වේ.

| වර්ෂය | විදුලිය ලබා දීම වෙනුවෙන් වෙන් කරන ලද මුදල (රුපියල් මිලියන) |
|---|---|
| 2009 | 107.32 |
| 2010 | 142.03 |
| 2011 | 305.10 |
| 2012 | 500.31 |
| 2013 | 804.54 |
| 2014 | 335.16 |
| 2015 | 833.72 |

2015 වර්ෂයේ දී දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කර්යාල හරහා ග්‍රාම නිලධාරීවරුන් මඟින් සිදු කරන ලද සංගණනය අනුව මඩකළපුව දිස්ත්‍රික්කය තුළ විදුලි සේවාව ලබාගෙන නොමැති නිවාස ඒකක ගණන 23,789ක් බව වර්තා වූ අතර, ඔවුනට විදුලි සේවාව ලබා ගැනීමට තිබූ ප්‍රධානතම බාධාව වූයේ විදුලි සේවාව ලබා ගැනීමට හා නිවාස සතැලුම් කිරීමට අවශ්‍ය මූලික පිරිවැය දැරීමට තිබූ නොහැකියාවයි.

ඒ අනුව 2015 වර්ෂයේ නොවැම්බර් මස සිට ක්‍රියාත්මක කරන ලද "රටම එළියයි අඳුර දුරලයි - ජාතික විදුලි සත්කාරය" ණය යෝජනා ක්‍රමය යටතේ මෙම පවුල් සඳහා විදුලි සේවාව ලබා ගැනීමට හා නිවාස සතැලුම් කිරීමට රුපියල් 45,000ක උපරිමයක් දක්වා ණය මුදලක් ලබා දුන් අතර, එම වැඩසටහන ජාතික මට්ටමෙන් ක්‍රියාත්මක විය.

2016 වර්ෂය අවසන් වන විට මඩකළපුව දිස්ත්‍රික්කයේ හඳුනාගත් නිවාස ඒකක අතරින් නිවාස ඒකක 20,444ක් සඳහා උක්ත වැඩසටහන යටතේ විදුලි සේවාව ලබා දී ඇත.

(ආ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 4 -1294/'16- (1), ගරු ඩලස් අලහප්පෙරුම මහතා.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු කථානායකතුමනි, ගරු ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

තොරතුරු බොහොමයක් සොයන්න තිබෙනවා. ගරු කථානායකතුමනි, එම නිසා මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 5 -1337/'16- (1), ගරු බුද්ධික පතිරණ මහතා.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - உயர்கல்வி மற்றும் நெடுஞ் சாலைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Higher Education and Highways and Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා කල් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 6 -1408/'16- (1), ගරු බන්දුල ගුණවර්ධන මහතා.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා. අදාළ අමාත්‍යතුමා එන්න ඕනෑ.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 8 -1542/'17- (1), ගරු චමින්ද විජේසිරි මහතා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු වසන්ත අලුවිහාරේ මහතා**
(மாண்புமிகு வசந்த அலுவிஹார)
(The Hon. Wasantha Aluvihare )
ගරු කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සතියක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 9 -1734/'17- (1), ගරු සෙයියිඩ් අලී සාහිර් මවුලානා මන්ත්‍රීතුමා වෙනුවෙන් එම ප්‍රශ්නය කවුරුන් හෝ ගරු මන්ත්‍රීතුමකු අසනවාද? එම ප්‍රශ්නය අසන්න ගරු මන්ත්‍රීවරයකු නැති නිසා-

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නය වෙනත් දිනයක ඉදිරිපත් කරමු.

## විදුලිය ලබා දී ඇති නිවාස : අම්පාර දිස්ත්‍රික්කය
### மின்சாரம் வழங்கப்பட்ட வீடுகள்: அம்பாறை மாவட்டம்
### HOUSES PROVIDED WITH ELECTRICITY: AMPARA DISTRICT

1189/'16

**10. ගරු බන්දුල ගුණවර්ධන මහතා (ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා වෙනුවට)**
(மாண்புமிகு பந்துல குணவர்தன - மாண்புமிகு ஆர்.எம். பத்ம உதயசாந்த குணசேகர சார்பாக)
(The Hon. Bandula Gunawardane on behalf of the Hon. R.M. Padma Udayashantha Gunasekera)
විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1)

(අ) (i) 1983 වර්ෂය වනවිට අම්පාර දිස්ත්‍රික්කය තුළ ලංකා විදුලිබල මණ්ඩලය විසින් විදුලිය ලබා දී ඇති මුළු නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට විදුලිය ලබා දී ඇති මුළු නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) වර්ෂ 1984 සිට 2009 දක්වා විදුලිය ලබා දීම වෙනුවෙන් වෙන් කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව කොපමණද;

(iv) 2009 වර්ෂයේදී යුද්මය තත්ත්වය නිම වීමෙන් පසු 2015 වර්ෂයදක්වා විදුලිය ලබා දී ඇති නිවාස සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව කොපමණද;

(v) ඉහත (iv) හි සඳහන් කාල පරිච්ඡේදය සඳහා විදුලිය ලබා දීම වෙනුවෙන් වෙන් කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 1983 ஆம் ஆண்டளவில் அம்பாறை மாவட் டத்தில் இலங்கை மின்சார சபையினால் மின்சாரம் வழங்கப்பட்டுள்ள வீடுகளின் மொத்த எண்ணிக்கை யாதென்பதையும்;

(ii) தற்போதைக்கு மின்சாரம் வழங்கப்பட்டுள்ள வீடுகளின் மொத்த எண்ணிக்கை யாதென்ப தையும்;

(iii ) 1984 முதல் 2009ஆம் ஆண்டுவரை மின்சாரம் வழங்குவதற்காக ஒதுக்கப்பட்டுள்ள பணத் தொகை ஆண்டு வாரியாக எவ்வளவென்பதையும்;

(iv ) 2009ஆம் ஆண்டில் யுத்த நிலவரம் முடிவடைந்த பின்னர் 2015ஆம் ஆண்டு வரை மின்சாரம் வழங்கப்பட்டுள்ள வீடுகளின் எண்ணிக்கை ஆண்டு வாரியாக எவ்வளவென்பதையும்;

(v ) மேற்படி (iv) இல் குறிப்பிடப்பட்டுள்ள கால கட்டத்தில் மின்சாரம் வழங்குவதற்காக ஒதுக்கப் பட்டுள்ள பணத்தொகை ஆண்டு வாரியாக எவ்வளவென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Power and Renewable Energy :

(a) Will he inform this House -

(i) the number of houses in the Ampara District that have been provided with electricity supply by the Ceylon Electricity Board by year 1983;

(ii) the total number of houses which have been provided with electricity supply by now;

(iii) the amounts allocated annually from year 1984 to 2009 for the supply of electricity on per year basis;

(iv) the number of houses that have been provided with electricity supply up to year 2015 after the end of war situation in year 2009 on per year basis; and

(v) the amount of money allocated for the supply of electricity during the period mentioned in (iv) above on per year basis?

(b) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 1983 වර්ෂය කාලයේදී මෙම පළාතේ පැවති යුදමය වාතාවරණය හා විවිධ දුෂ්කරතා හේතුවෙන් එවකට විදුලිය ලබා දීම පිළිබඳව වාර්තා මේ වන විට ලංකා විදුලිබල මණ්ඩලය සතුව නොමැත.

(ii) අම්පාර දිස්ත්‍රික්කය තුළ විදුලිය ලබා දී ඇති මුළු නිවාස සංඛ්‍යාව 222,994කි.

(iii) වර්ෂ 1984 සිට 2002 වර්ෂය දක්වා විදුලිය ලබා දීම වෙනුවෙන් වෙන් කරන ලද මුදල් පිළිබඳ වාර්තා ලංවිම සතුව නොමැති අතර, 2003 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා අම්පාර දිස්ත්‍රික්කය තුළ විදුලිය ලබා දීම වෙනුවෙන් වෙන් කළ මුදල් පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| වර්ෂය | විදුලිය ලබා දීම වෙනුවෙන් වෙන් කරන ලද මුදල(රු.මිලියන) |
|---|---|
| 2003 | 49.122 |
| 2004 | 56.924 |
| 2005 | 77.1 |
| 2006 | 138.1 |
| 2007 | 247.32 |
| 2008 | 154.39 |
| 2009 | 101.3 |

(iv) 2009 වර්ෂයේ යුද තත්ත්වය නිම වීමෙන් පසු 2015 වර්ෂය දක්වා අම්පාර දිස්ත්‍රික්කය තුළ විදුලිය ලබා දී ඇති නිවාස සංඛ්‍යාව පිළිබඳ විස්තර එක් එක් වර්ෂය අනුව පහත පරිදි වේ.

| වර්ෂය | එක් එක් වර්ෂයේදී විදුලිය ලබා දී ඇති නිවාස සංඛ්‍යාව (අම්පාර දිස්ත්‍රික්කය) |
|---|---|
| 2009 | 10,325 |
| 2010 | 7,815 |
| 2011 | 11,734 |
| 2012 | 10,725 |
| 2013 | 9,836 |
| 2014 | 11,012 |
| 2015 | 8,825 |

(v) 2009 වර්ෂයේ යුද තත්ත්වය නිම වීමෙන් සු 2015 වර්ෂය දක්වා අම්පාර දිස්ත්‍රික්කය තුළ විදුලිය ලබා දීම වෙනුවෙන් වෙන් කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව පහත පරිදි වේ.

| වර්ෂය | විදුලිය ලබා දීම වෙනුවෙන් වෙන් කරන ලද මුදල ( රු.මිලියන) |
|---|---|
| 2009 | 101.3 |
| 2010 | 131.94 |
| 2011 | 441.99 |
| 2012 | 509.29 |
| 2013 | 711.06 |
| 2014 | 812.33 |
| 2015 | 410.99 |

2015 වර්ෂයේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ග්‍රාම නිලධාරිවරුන් මඟින් සිදු කරන ලද සංගණනය අනුව අම්පාර දිස්ත්‍රික්කය තුළ විදුලි සේවාව ලබා ගෙන නොමැති නිවාස ඒකක ගණන 11,442ක් බව වාර්තා වූ අතර, ඔවුනට විදුලි සේවාව ලබා ගැනීමට තිබූ ප්‍රධානතම බාධාව වූයේ විදුලි සේවාව ලබා ගැනීමට හා නිවාස තතැඳුම් කිරීමට අවශ්‍ය මූලික පිරිවැය දැරීමට තිබූ නොහැකියාවයි.

ඒ අනුව 2015 වර්ෂයේ නොවැම්බර් මස සිට ක්‍රියාත්මක කරන ලද "රටම එළියයි අඳුර දුරලයි- ජාතික විදුලි සත්කාරය" ණය යෝජනා ක්‍රමය යටතේ මෙම පවුල් සඳහා විදුලි සේවාව ලබා ගැනීමට හා නිවාස තතැඳුම් කිරීමට රු.

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

45,000ක උපරිමයක් දක්වා ණය මුදලක් ලබා දුන් අතර, එම වැඩසටහන ජාතික මට්ටමින් ක්‍රියාත්මක විය.

2016 වර්ෂය අවසන් වන විට අම්පාර දිස්ත්‍රික්කයේ හඳුනා ගත් නිවාස ඒකක අතරින් නිවාස ඒකක 11,079ක් සඳහා උක්ත වැඩසටහන යටතේ විදුලි සේවාව ලබා දී ඇත.

(ආ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 11 - 1352/'16-(1), ගරු බුද්ධික පතිරණ මහතා. ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා වෙනුවෙන් එම ප්‍රශ්නය කවුරු හෝ ගරු මන්ත්‍රීතුමකු අසනවාද? එම ප්‍රශ්නය අසන්න ගරු මන්ත්‍රීවරයකු නැති නිසා-

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නය වෙනත් දිනයක ඉදිරිපත් කරමු.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක.13 - 1508/'17-(1), ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු කථානායකතුමනි, ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා වෙනුවෙන් මම ඒ ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, මා අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## විදුලිය ලබා දී ඇති නිවාස: ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය
## மின்சாரம் வழங்கப்பட்ட வீடுகள்: திருகோணமலை மாவட்டம்
## HOUSES PROVIDED WITH ELECTRICITY : TRINCOMALEE DISTRICT

1190/'16

**14. ගරු බන්දුල ගුණවර්ධන මහතා (ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා වෙනුවට)**
(மாண்புமிகு பந்துல குணவர்தன - மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர சார்பாக)
(The Hon. Bandula Gunawardane on behalf of the Hon. R.M. Padma Udayashantha Gunasekera)

විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1)

(අ) (i) 1983 වර්ෂය වනවිට ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ ලංකා විදුලිබල මණ්ඩලය විසින් විදුලිය ලබා දී ඇති මුළු නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට විදුලිය ලබා දී ඇති මුළු නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) වර්ෂ 1984 සිට 2009 දක්වා විදුලිය ලබා දීම වෙනුවෙන් වෙන් කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව කොපමණද;

(iv) 2009 වර්ෂයේදී යුදමය තත්ත්වය නිම වීමෙන් පසු 2015 වර්ෂයදක්වා විදුලිය ලබා දී ඇති නිවාස සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව කොපමණද;

(v) ඉහත (iv) හි සඳහන් කාල පරිච්ඡේදය සඳහා විදුලිය ලබාදීම වෙනුවෙන් වෙන් කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i ) 1983ஆம் ஆண்டளவில் திருகோணமலை மாவட்டத்தில் இலங்கை மின்சாரசபையினால் மின்சாரம் வழங்கப்பட்டுள்ள வீடுகளின் மொத்த எண்ணிக்கை யாதென்பதையும்;

(ii) தற்போதைக்கு மின்சாரம் வழங்கப்பட்டுள்ள வீடுகளின் மொத்த எண்ணிக்கை யாதென்பதையும்;

(iii ) 1984 முதல் 2009ஆம் ஆண்டுவரை மின்சாரம் வழங்குவதற்காக ஒதுக்கப்பட்டுள்ள பணத் தொகை ஆண்டு வாரியாக எவ்வளவென்பதையும்;

(iv ) 2009ஆம் ஆண்டில் யுத்த நிலவரம் முடிவடைந்த பின்னர் 2015ஆம் ஆண்டுவரை மின்சாரம் வழங்கப்பட்டுள்ள வீடுகளின் எண்ணிக்கை ஆண்டு வாரியாக எவ்வளவென்பதையும்;

(v ) மேற்படி (iv) இல் குறிப்பிடப்பட்டுள்ள கால கட்டத்தில் மின்சாரம் வழங்குவதற்காக ஒதுக்கப்பட்டுள்ள பணத்தொகை ஆண்டு வாரியாக எவ்வளவென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Power and Renewable Energy :

(a) Will he inform this House -

(i) the number of houses in the Trincomalee District that have been provided with electricity supply by the Ceylon Electricity Board by year 1983;

(ii) the total number of houses which have been provided with electricity supply by now;

(iii) the amounts allocated annually from year 1984 to 2009 for the supply of electricity on per year basis;

(iv) the number of houses that have been provided with electricity supply up to year 2015 after the end of war situation in year 2009 on per year basis; and

(v) the amount of money allocated for the supply of electricity during the period mentioned in (iv) above on per year basis?

(b) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 1983 වර්ෂය කාලයේදී මෙම පළාතේ පැවති යුදමය වාතාවරණය හා විවිධ දුෂ්කරතා හේතුවෙන් එවකට විදුලිය ලබා දීම පිළිබඳව වාර්තා මේ වන විට ලංකා විදුලිබල මණ්ඩලය සතුව නොමැත.

(ii) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ විදුලිය ලබා දී ඇති මුළු නිවාස සංඛ්‍යාව 113,916කි.

(iii) වර්ෂ 1984 සිට 2001 වර්ෂය දක්වා විදුලිය ලබා දීම වෙනුවෙන් වෙන් කරන ලද මුදල් පිළිබඳ වාර්තා ලංවිම සතුව නොමැති අතර, 2002 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ විදුලිය ලබා දීම වෙනුවෙන් වෙන් කළ මුදල් පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| වර්ෂය | විදුලිය ලබා දීම වෙනුවෙන් වෙන් කරන ලද මුදල රු.මිලියන) |
|---|---|
| 2002 | 14.780 |
| 2003 | 42.343 |
| 2004 | 72.93 |
| 2005 | 23.1 |
| 2006 | 104.82 |
| 2007 | 143.66 |
| 2008 | 126.91 |
| 2009 | 97.86 |

(iv) 2009 වර්ෂයේ යුද තත්ත්වය නිම වීමෙන් පසු 2015 වර්ෂය දක්වා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ විදුලිය ලබා දී ඇති නිවාස සංඛ්‍යාව පිළිබඳ විස්තර එක් එක් වර්ෂය අනුව පහත පරිදි වේ.

| වර්ෂය | එක් එක් වර්ෂයේදී විදුලිය ලබා දී ඇති නිවාස සංඛ්‍යාව (අම්පාර දිස්ත්‍රික්කය) |
|---|---|
| 2009 | 6,452 |
| 2010 | 5,393 |
| 2011 | 5,406 |
| 2012 | 6,396 |
| 2013 | 5,567 |
| 2014 | 4,552 |
| 2015 | 2,550 |

(v) 2009 වර්ෂයේ යුද තත්ත්වය නිම වීමෙන් පසු 2015 වර්ෂය දක්වා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ විදුලිය ලබා දීම වෙනුවෙන් වෙන් කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව පහත පරිදි වේ.

| වර්ෂය | විදුලිය ලබා දීම වෙනුවෙන් වෙන් කරන ලද මුදල ( රු.මිලියන) |
|---|---|
| 2009 | 97.86 |
| 2010 | 32.31 |
| 2011 | 252.69 |
| 2012 | 282.64 |
| 2013 | 208.94 |
| 2014 | 181.91 |
| 2015 | 251.38 |

2015 වර්ෂයේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ග්‍රාම නිලධාරිවරුන් මඟින් සිදු කරන ලද සංගණනය අනුව ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ විදුලි සේවාව ලබා ගෙන නොමැති නිවාස ඒකක ගණන 9,891ක් බව වාර්තා වූ අතර, ඔවුනට විදුලි සේවාව ලබා ගැනීමට තිබූ ප්‍රධානතම බාධාව වූයේ විදුලි සේවාව ලබා ගැනීමට හා නිවාස තතැඳුම් කිරීමට අවශ්‍ය මූලික පිරිවැය දැරීමට තිබූ නොහැකියාවයි.

ඒ අනුව 2015 වර්ෂයේ නොවැම්බර් මස සිට ක්‍රියාත්මක කරන ලද "රටම එළියයි අඳුර දුරලයි- ජාතික විදුලි සත්කාරය" ණය යෝජනා ක්‍රමය යටතේ මෙම පවුල් සඳහා විදුලි සේවාව ලබා ගැනීමට හා නිවාස තතැඳුම් කිරීමට රු. 45,000ක උපරිමයක් දක්වා ණය මුදලක් ලබා දුන් අතර, එම වැඩසටහන ජාතික මට්ටමින් ක්‍රියාත්මක විය.

2016 වර්ෂය අවසන් වන විට ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ හඳුනා ගත් නිවාස ඒකක අතරින් නිවාස ඒකක 9,269ක් සඳහා උක්ත වැඩසටහන යටතේ විදුලි සේවාව ලබා දී ඇත.

(ආ) අදාළ නොවේ.

## කඩවත - මහනුවර අධිවේගී මාර්ගය : විස්තර
## கடவத்த - கண்டி அதிவேக வீதி : விபரம்
## KADAWATHA-KANDY EXPRESSWAY: DETAILS

**15. ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා (ගරු බුද්ධික පතිරණ මහතා වෙනුවට)**
(மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன - மாண்புமிகு புத்திக பதிரண சார்பாக)
(The Hon. Anura Sidney Jayarathne on behalf of the Hon. Buddhika Pathirana)

උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1)

(අ) (i) කඩවත - මහනුවර අධිවේගී මාර්ගයේ දුර කොපමණද;

(ii) ඒ සඳහා වැය වන මුදල කොපමණද;

(iii) ඉදිකිරීම් කටයුතු සිදු කරන සමාගම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උක්ත මාර්ගය ඉදිකිරීමේදී අදාළ ප්‍රදේශයන්හි පරිසර පද්ධතීන්ට සිදු විය හැකි හානිය සම්බන්ධයෙන් ඇගයීමක් සිදු කර තිබේද;

[ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා]

(ii) එසේ නම්, එම හානි අවම කිරීමට ගෙන ඇති පියවර කවරේද;

(iii) මාර්ගයේ වැඩ අවසන් කිරීමට සැලසුම් කර ඇති දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

உயர் கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கடவத்த - கண்டி அதிவேக வீதியின் நீளம் எவ்வளவு;

(ii) இதற்கு செலவாகும் நிதித் தொகை எவ்வளவு;

(iii) நிர்மாணப் பணிகளை மேற்கொள்ளும் கம்பனி யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) குறிப்பிட்ட வீதியை நிர்மாணிக்கையில் ஏற்புடைய பிரதேசங்களின் சுற்றாடல் முறைமைகளுக்கு ஏற்படக்கூடிய சேதம் தொடர்பில் மதிப்பீடு செய்யப்பட்டுள்ளதா;

(ii) ஆமெனில், மேற்படி சேதத்தைக் குறைப்பதற்காக மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை;

(iii) வீதியின் வேலைகளைப் பூர்த்தி செய்வதற்கு திட்டமிடப்பட்டுள்ள திகதி யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Higher Education and Highways :

(a) Will he inform this House-

(i) the length of the Kadawatha-Kandy Expressway;

(ii) the cost to be incurred on it; and

(iii) the company involved in the construction of the expressway?

(b) Will he also inform this House-

(i) whether an assessment of the possible damage that could be caused to the eco-systems of the relevant areas in the construction of the above expressway has been carried out;

(ii) if so, the steps that have been taken to minimize that damage; and

(iii) the planned date of the completion of the construction work of the expressway?

(c) If not, why?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) අදියර 04ක් යටතේ කිලෝමීටර් 168.7ක දුරක් ඉදි කිරීමට යෝජිතව ඇත. විස්තර වෙන් වෙන්ව ඇමුණුම * මඟින් දක්වා ඇත.

(ii) වැය වන මුදල බදු රහිතව පහත පරිදි වේ.

අදියර 01 - කඩවත සිට මීරිගම දක්වා - රු. බිලියන 158.4 (බදු රහිත)

අදියර 02- මීරිගම සිට කුරුණෑගල දක්වා - රු. බිලියන 137.1 (බදු රහිත)

අදියර 03 - පොතුහැර සිට ගලගෙදර දක්වා - රු. බිලියන 116.8 (බදු රහිත ඉංජිනේරු ඇස්තමේන්තුව)

අදියර 04 - කුරුණෑගල සිට දඹුල්ල දක්වා - ඉඩම් අත්පත් කර ගැනීම සඳහා වන වන්දි ගෙවීමේ පිරිවැයද ඇතුළත්ව රු. බිලියන 161.6 (බදු රහිත) (විස්තර ඇමුණුමෙහි දැක්වේ.)

(iii) අදියර 01 - Metallurgical Cooperation of China (MCC) සමාගම

අදියර 02 - පැකේජ 04ක් යටතේ ICC /Seirra/K.D.A. Weerasinghe/ Maga යන දේශීය කොන්ත්‍රාත් සමාගම්. ප්‍රධාන සමාගම් 12ක් මඟින් සිදු කරයි.

අදියර 03 සහ අදියර 04 සඳහා කොන්ත්‍රාත්තුව මෙතෙක් ප්‍රදානය කර නොමැත. (විස්තර ඇමුණුමෙහි දැක්වේ.)

(ආ) (i) ඔව්.

(ii) මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ සමස්ත මාර්ග පථය ආවරණය වන පරිදි පාරිසරික බලපෑම ඇගයීම් (EIA) වාර්තාවක් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය මඟින් 2016 වර්ෂයේදී පිළියෙල කරන ලද අතර, ඒ සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය ද ලැබී ඇත. එහිදී එයට ඇතුළත් කරන ලද පාරිසරික කළමනාකරණ සැලසුම් (EMP) වාර්තාවේ, ඉදි කිරීමට යෝජිත මධ්‍යම අධිවේගී මාර්ගය හේතුවෙන් පරිසරයට සිදු විය හැකි බලපෑම් හා හානි හඳුනා ගෙන එම හානි අවම කිරීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් සිදු කරනු ලබන ක්‍රියා මාර්ග ඇතුළත් කර ඇත. තවද මෑතකාලීනව ඉදි කරන ලද අධිවේගී මාර්ග තදාසන්නව ඇති වූ පාරිසරික බලපෑම් ද (දක්ෂිණ අධිවේගී මාර්ගයේ ඇති නායයෑම) සැලකිල්ලට ගනිමින් ඉහත සඳහන් කරන ලද පාරිසරික කළමනාකරණ සැලසුම් (EMP) වාර්තාව සකස් කර ඇත.

- කැපීම් අවම කිරීම සඳහා බිම් ගෙවල් නිර්මාණය,

- බෑවුම් ශක්තිමත් කිරීම,

- ජලය බැස යාම විධිමත් ලෙස සිදුවීම පිණිස via-duct, දිගුපාලම් නිර්මාණය ආදී සැලසුම් ක්‍රම මඟින් පාරිසරික බලපෑම් අවම වන ආකාරයට ඉදි කිරීමට නියමිතය.

ව්‍යාපෘතිය නිසා ඇති වන ජලවිද්‍යාත්මක බලපෑම ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව මඟින් සිදු කරන ලද අතර, එමඟින් ලද නිර්දේශ ව්‍යාපෘතියේ ජ්‍යාමිතික හා ව්‍යුහ නිර්මාණ සැලසුම් කිරීමට යොදා ගෙන ඇති අතර, වාර්තාව පිළියෙල කිරීමේ දීද එම නිර්දේශ ඇතුළත් කර ඇත. එසේම වාර්තාවේ EMP වාර්තාව ප්‍රකාරව මධ්‍යම පරිසර අධිකාරිය සමඟ එකඟ වී ඇති පාරිසරික බලපෑම් අවම කිරීමේ කොන්දේසි ක්‍රියාත්මක කිරීමටත්

****  පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
**  Placed in the Library.*

ව්‍යාපෘති කළමනාකරණ ඒකකය එකඟව ක්‍රියා කරමින් පවතී.

(iii) ඇමුණුමෙහි දැක්වේ.

(ඈ) අදාළ නොවේ.

මෙම ව්‍යාපෘතියේ IV වන අදියරේ ඉඩම් අත්පත් කර ගැනීම සඳහා වන රු. බිලියන 10ක ඇස්තමේන්තුව ද ණය මුදලට ඇතුළත් කර ඇත.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු ස්ථාවර නියෝග 23(2) යටතේ ප්‍රශ්නය, ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### ජීවනෝපාය අහිමි වූ වෙළෙඳුන්ට අම්පාර බස් නැවතුම්පොළ සංකීර්ණයේ කඩ කාමර ලබා දීම
### வாழ்வாதாரத்தை இழந்த வியாபாரிகளுக்கு அம்பாறை பஸ் நிலையத் தொகுதியில் கடைகளை வழங்குதல்
### PROVISION OF SHOP SPACE AT AMPARA BUS STAND TO VENDORS WHO LOST LIVELIHOOD

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මඟින් අම්පාර නාගරික බස් නැවතුම්පොළ ඉදි කරන ලද අතර, එකී ඉදි කිරීම කිරීමේදී පහත සඳහන් අයවලුන්ගේ ඉඩම් ද එකී බස් නැවතුම්පොළ ඉදි කිරීම සඳහා රජයට ලබා ගෙන ඇත. තවද, පහත නම් සඳහන් අයවලුන්ගේ පුරෝගාමීන් විසින් ගල්ඔය සංවර්ධන මණ්ඩලය ආරම්භයේ සිට පදිංචිව සිටි එම ස්ථානවල වෙළෙඳ ව්‍යාපාර කිරීම මඟින් ජීවත් වූ අතර, මෙම අයවලුන්ට නගරයෙන් දුර බැහැර නවගම්පුර ප්‍රදේශයෙන් ඉඩම් ලබා දීමට අම්පාර දිසාපතිවරයා සහ ආණ්ඩුවේ දේශපාලන අධිකාරිය විසින් තීරණය කර ඇත. මෙකී තීරණය මඟින් එකී ඉඩම්වල පදිංචිව සිටි අයවලුන්ගේ ජීවනෝපාය මාර්ගය සම්පූර්ණයෙන්ම කඩා වැටී ඇති අතර, මේ වන විට ඉදි කරන ලද අම්පාර බස් නැවතුම්පොළ සංකීර්ණයේ කඩ කාමර වෙන්දේසි කිරීම සඳහා නගර සභාව විසින් කටයුතු යොදා ඇත.

ඉදිකරනු ලබන බස් නැවතුම්පොළෙන් මේ පවුල්වල අය කඩ කාමරය බැගින් ඉල්ලා ඇතත්, දිසාපතිවරයා සහ ආණ්ඩුවේ දේශපාලන අධිකාරිය විසින්-

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, I rise to a point of Order. පක්ෂ නායක රැස්වීමේදී තීරණයක් ගත්තා, ස්ථාවර නියෝග 23(2) යටතේ ජාතික වැදගත්කමකින් යුක්ත ප්‍රශ්න පමණක් අහන්න ඉඩ දෙනවා කියලා. අම්පාරේ bus stand එකක් පිළිබඳවයි මේ ප්‍රශ්නය අහන්නේ.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ඒ ප්‍රශ්නය අහන්න ගරු කථානායකතුමා ඉඩ දීලා තිබෙනවා නේ. කථානායකතුමාට කියන්න-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

We have accepted it. Now, we have listed it and after that, in future - [*Interruption.*] By that time, it has been listed.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු කථානායකතුමාට ඉහළින් ඉන්න හදන්න එපා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, ගල් ඔය මිටියාවත සංවර්ධනය කළේ ඩී.එස්. සේනානායක මහත්තයාගේ කාලයේ ඉඳලා. ගල් ඔය මිටියාවත කියන්නේ ජාතික ව්‍යාපාරයක් කියලා දන්නේ නැහැ. ගල් ඔය ව්‍යාපාරය කියන්නේ ජාතික ව්‍යාපාරයක්.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ඔය වැඩවලට ඉඩ දෙන්න එපා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු සභානායකතුමනි, මේ ප්‍රශ්නය list කරලා තිබෙන හින්දා අපි ඉඩ දෙමු. ඊට පස්සේ, this will be screened by us in future.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

Very good.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

කථානායකතුමා තීරණය තවම ප්‍රකාශයට පත් කරලා නැහැ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු සභානායකතුමා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මීට පස්සේ පාර්ලිමේන්තුවේදී අම්පාරේ වැසිකිළියක් ගැනත් අහයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේ තීරණය ගත්තේ ඊයේ ගත් තීරණයට කලින්.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
වැසිකිළියත් යන්න ඕනෑ තැනක්. වැසිකිළියට යන්නේ නැතිව තමුන්නාන්සේ මහපාරට යන්නද හදන්නේ?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 23(2) යටතේ අහන්න අවස්ථාව තිබෙන්නේ ජාතික වැදගත්කමකින් යුක්ත ප්‍රශ්න පමණයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
We agreed on that yesterday at the Committee on Parliamentary Business, which was held at 3.45 p.m. But, this was accepted before that. So, in future, those will be monitored.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
If we have accepted that even before, we are violating -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
But, now, it has been done; now, this is listed.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මොකක්ද මේ? දැන් මෙතැන තීරණ ගන්න එක වැඩක් නැහැ නේ?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, තීරණය ගත්තේ පස්සේ. You go ahead, Hon. Member.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
Your regulation as the Speaker is being challenged by this.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
No, there are Standing Orders.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
The Standing Orders are interpreted by him, not by you; the Standing Orders are interpreted by the Speaker.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
That is okay. But, I allowed that in the morning. Now, let him present it and after that, personally, I will screen those. I told you that.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
It is unfair.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
The Leader of the House can take it up later.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
This decision was taken yesterday at 3.45 p.m.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඊයේ තීන්දුව වෙනස්-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඊයේ තීන්දුව වෙන කථාවක්. නමුත් ස්ථාවර නියෝග 23(2) යටතේ මේ වාගේ කාරණා ගැන ප්‍රශ්න කරන්න බැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මෙය අද වැඩ පිළිවෙළට ඇතුළත් කර තිබෙන නිසා මම ගරු මන්ත්‍රීතුමාට ඉදිරිපත් කිරීමට අවසර ලබා දෙනවා. Then, we can monitor the rest.

**ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා**
(மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன)
(The Hon. Anura Sidney Jayarathne)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අනුර සිඩ්නි ජයරත්න මන්ත්‍රීතුමා, ඔබතුමාගේ ප්‍රශ්නය මොකක්ද?

**ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා**
(மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன)
(The Hon. Anura Sidney Jayarathne)
වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා එතුමාගේ ආසනයේ නොවෙයි ඉන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා වාඩි වෙන්න. Hon. Member, you can read it.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
01. ජීවනෝපාය අහිමි වූ වසර 50කට වැඩි කාලයක් පදිංචි පහත නම් සඳහන් පුද්ගලයින් වෙනුවෙන් ගරු අමාත්‍යතුමා විසින් අම්පාර නාගරික බස් නැවතුම් පොළෙහි කඩ කාමරය බැගින් ලබා දීමට කටයුතු කරනවාද? එම පුද්ගලයින් වෙනුවෙන් ලබා දිය හැකි වෙනත් සහන මොනවාද?

මේ කාරණය ජාතික ප්‍රශ්නයක් වන්නේ ඩී.එස්. සේනානායක මැතිතුමාගේ කාලයේ ඉඳලා -අවුරුදු 50කට වැඩිය- හැම ආණ්ඩුවක්ම පොරොන්දු වෙච්ච දෙයක් කඩ කරන නිසායි. අම්පාර නගර සභාවේ ඡන්දය මේ වනතුරු පවත්වා නැහැ, ගරු කථානායකතුමනි.

අම්පාර නගර සභා සීමාව තුළ පහත නම් සඳහන් අය පදිංචිව සිටින්නේ, අම්පාර සාමපුර ග්‍රාම නිලධාරි වසමේ පුල්ලියාර් කෝවිල ඉදිරිපිට සර්වේ ජනරාල්වරයාගේ කඩඉම් සිතියම් අංක 280007හි කැබලිවල පදිංචි නිවාසවලය. එම අයවලුන් සහ ඔවුන්ගේ පූර්වගාමීන් දැනට වසර 40කට අධික කාලයක සිට එම නිවෙස්වල පදිංචිව සිටින අතර එම අයවලුන් සියලු දෙනා ගල්ඔය ව්‍යාපාරයේ සේවය කිරීම සඳහා පැමිණි පවුල්වල සාමාජිකයන් වේ. මෙම පවුල්වල අයට රජය මඟින් එකී ඉඩම් ලබා දීම සඳහා 2005 වර්ෂයේදී තෝරාගෙන තිබෙන අතර, 2006.01.19වන දින එම අයවලුන් නමින් එකී ඉඩම් ද මැනුම් කොට ඇත.

02. අම්පාර දිසාපතිවරයා සහ ආණ්ඩුවේ දේශපාලන අධිකාරිය විසින් මෙම පුද්ගලයින් මෙම ඉඩම්වලින් ඉවත් කිරීමට කටයුතු කරමින් පවතී. එය සමානාත්මතාවය උල්ලංඝනය කරමින් පදිංචි වාසස්ථාන අහිමි කරමින් කටයුතු කිරීමකි. 2006.01.19වන දින මැනුම් කරවීමෙන් පසු එකී නිවෙස්වල පදිංචිකරුවන් ජලය, විදුලිය ආදී පහසුකම් ද ස්ථිරව නිවාස තනා ගැනීම ද සිදු කොට ඇති අතර, මෙකී ඉඩම් සහ නිවාස සඳහා ඉඩම් පරීක්ෂණය මඟින් තෝරා ගත් පරිදි බලපත්‍ර ලබා දීම කරනවාද? අමාත්‍යවරයා විසින් ලබා දෙනු ලබන වෙනත් සහන මොනවාද?

මේ කාරණය ඉතාම වැදගත් කාරණයක්. මොකද, අම්පාර නගර සභාවේ ඡන්දයක් පවත්වලා නැති නිසායි ඇමතිතුමාට මේ කටයුත්තට මැදිහත් වෙන්න කියා අපට කියන්න සිදුවෙලා තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමනි, do you want to respond to it now or answer that later?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
The Hon. Minister has not come today. So, we will answer that tomorrow. - [*Interruption.*] But, Sir, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
I took your point. We agreed to it yesterday.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, ඊයේ පැවැති පක්ෂ නායක රැස්වීමේදී ඇති කරගත් එකඟතාව වෙන එකක්. ස්ථාවර නියෝග 23(2) යටතේ වගන්තියක් තිබෙනවා. ඒ වගන්තිය යටතේ bus stand එකක් ගැන අහනවා. ඒක ජාතික වැදගත්කමක් ඇති කාරණයක් නොවෙයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක මට තේරෙනවා. [බාධා කිරීමක්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මින් ඉදිරියට හැම දෙයක්ම-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි ඊයේ තීරණයක් ගත්තා. ඒ විධියට කටයුතු කරමු.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මෙහෙම ප්‍රශ්න අහන එක අසාධාරණයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පසු ගිය සති කිහිපයේදීම මේ වාගේ අනවශ්‍ය ප්‍රශ්න ගොඩාක් මතු කළා. හැමදාම වාගේ ප්‍රශ්න ඇහුවා. මෙතුමා විතරක් නොවෙයි, ප්‍රශ්න ගොඩාක් ඇහුවා. ඒ නිසා තමයි මම මේ ගැන තීරණයක් අරගෙන, ඊයේ ඒ ගැන දැනුවත් කළේ. මින් ඉදිරියට අපි එහෙම කරමු.

**ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා**
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
ගරු කථානායකතුමනි, මට පොඩි පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. අම්පාර දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් නිසායි මම මේ කථා කරන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේ ගැන වෙනත් දිනයකදී අමාත්‍යතුමා ප්‍රකාශයක් කරන්න නියමිතයි. එදාට පැහැදිලි කර ගනිමු. නැත්නම් දැන් උත්තර දෙන්න කෙනෙක් නැහැ නේ. අදාළ අමාත්‍යවරයා ප්‍රකාශයක් කරන්න නියමිතයි නේ. එදාට අවස්ථාව ලබා දෙන්නම්. [බාධා කිරීම්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මම කිව්වේ, bus stand එක බලන්න ඇමතිතුමා අම්පාරට යන්න ඕනෑ කියලායි. [බාධා කිරීමක්]

**ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා**
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
මමත් අම්පාරේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඇමතිතුමා ඉන්න අවස්ථාවක ඇහුවා නම් වඩාත් යෝග්‍යයි නේ. දැන් කථා කරලා වැඩක් නැහැ නේ.

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමියනි, මම එදාට අවස්ථාව ලබා දෙන්නම්. දැන් ඔබතුමිය කථා කළාට පිළිතුරු දෙන්න කෙනෙක් නැහැ. ගරු ඇමතිතුමා ඉන්න වෙලාවක ප්‍රශ්නය අහන්න. එදාට මම අවස්ථාවක් ලබා දෙන්නම්.

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)

ගරු කථානායකතුමනි, මිනිසුන්ගේ ප්‍රශ්න විසඳනවා වෙනුවට ප්‍රශ්න වැඩි කරමින් හිනා වෙවී ඉන්න එක ගැන අපට හරි කනගාටුයි.

ඒ විධියට කටයුතු කරන්න එපා. මිනිසුන්ගේ ප්‍රශ්න විසඳන්න තමයි දේශපාලනඥයන් ඉන්නේ. ඔබතුමන්ලාට ලජ්ජා නැද්ද?

## පාර්ලිමේන්තුවේ කටයුතු
## பாராளுமன்ற அலுவல்
## BUSINESS OF THE PARLIAMENT

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)

I move,

"That the proceedings on Item Nos. 1,2,3,4,5,6,7,8,9 and 10 appearing on the Order Paper be exempted at this day's sitting from the provisions of Standing Order No. 20(7) of the Parliament."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

### I

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)

I move,

"That notwithstanding the provisions of Standing Order No. 7 of the Parliament, and the motions agreed to by Parliament on 08.03.2016, the Parliament shall sit on July 25th Tuesday, 26th Wednesday, 27th Thursday and 28th Friday, 2017."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

### II

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)

I move,

"That notwithstanding the provisions of Standing Order No. 7 of the Parliament and the motion agreed to by Parliament on 08.03.2016, the hours of sittings of Parliament on Tuesday 25th and Wednesday 26th July, 2017 shall be 1.00 p.m. to 7.30 p.m.. At 6.30 p.m. Standing Order No. 7(5) of the Parliament shall operate. At 7.30 p.m. Mr. Speaker shall adjourn the Parliament without question put."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

### III

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)

I move,

"That notwithstanding the provisions of Standing Order No. 7 of the Parliament and the motion agreed to by Parliament on 08.03.2016, the hours of sitting of Parliament on Thursday 27th and Friday 28th July 2017 shall be 10.30 a.m. to 12.30 p.m. and 1.30 p.m. to 7.30 p.m.. At 6.30 p.m. Standing Order No. 7(5) of the Parliament shall operate. At 7.30 p.m. Mr. Speaker shall adjourn the Parliament without question put."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

### IV

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)

I move,

"That this Parliament at its rising this day do adjourn until 1.00 p.m. on Tuesday 25th July, 2017"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනා
## தனி நபர் பிரேரணைகள்
## PRIVATE MEMBERS' MOTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අද දින න්‍යාය පත්‍රයේ විෂයය අංක 1 සිට 10 දක්වා වූ පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනා ඉදිරිපත් කිරීම.

යෝජනා අංක 1, පා. 145/'15, ගරු එස්.එම්. මරික්කාර් මහතා - පැමිණ නැත.

යෝජනා අංක 2, පා. 150/'15, ගරු හේෂාන් විතානගේ මහතා.

## උපාධිධාරීන් සඳහා රැකියා ලබා දීමේදී නිසි ක්‍රමවේදයක් සකස් කිරීම
### பட்டதாரிகளுக்கு வேலைவாய்ப்புக்களை வழங்குவதற்கான ஒழுங்கான முறைமையொன்றைத் தயாரித்தல்
### DEVELOPING A PROPER METHODOLOGY TO PROVIDE EMPLOYMENT TO GRADUATES

[පූ.භා. 10.44]

**ගරු හේෂාන් විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ශ්‍රී ලංකාවේ උපාධිධාරීන්ට රැකියා ලබා දීමේදී මෙතෙක් කල් ක්‍රියාත්මක වූ පක්ෂ පාට භේද ක්‍රමය නොසලකා සාධාරණය ඉටුකිරීම සඳහා නිසි ක්‍රමවේදයක් සැලසුම් කර එය ප්‍රතිපත්තියක් ලෙස සම්මත කිරීමට පියවර ගන්නා ලෙස හා දේශපාලනඥයන් හමුවේ උපාධිධාරීන් හැල්ලුවට පත් නොකිරීමට පියවර ගත යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි."

ගරු කථානායකතුමනි, අද දින පළමුවන වතාවට තමයි මට මේ උත්තරීතර සභාවට පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබුණේ. උපාධිධාරීන් සඳහා රැකියා ලබා දීමේදී නිසි ක්‍රමවේදයක් සකස් කිරීම සම්බන්ධයෙන් තමයි මම මේ යෝජනාව ඉදිරිපත් කරන්නේ.

ගරු කථානායකතුමනි, මේ අවස්ථාවේදී විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ, අපේ රටේ සාක්ෂරතාව සියයට 95කට වඩා වැඩි බව. අපේ රටේ පාසල් අධ්‍යාපනය සඳහා පළමුවැනි ශ්‍රේණියට ඇතුළත් වන දරුවන්ගෙන් සියයට දෙකකට ආසන්න පිරිසකට තමයි විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා යොමු වෙන්න අවස්ථාව ලැබෙන්නේ. සාමාන්‍යයෙන් එම ප්‍රමාණය අවුරුද්දකට 25,000ට ආසන්න වෙනවා. මේ රටේ අධ්‍යාපනය තුළ තිබෙන මේ විෂමතාව අඩු කරන්න, නැති කරන්න කටයුතු කිරීම අප කාගෙත් වගකීමක් බව මම මුලින්ම සඳහන් කරනවා. අනෙක් ශිෂ්‍ය ප්‍රජාවෙන් යම් පිරිසක් ඉතා වෙහෙස මහන්සියෙන් කටයුතු කරලා බාහිර උපාධියක් ලබා ගන්නවා. මම කියන්න අදහස් කරන්නේ මේකයි. මේ රටේ උපාධියක් ලබාගෙන විශ්වවිද්‍යාලයෙන් එළියට එන දරුවන් ගැනත්, උපාධියක් ලබා ගැනීමේ අපේක්ෂාවෙන් අධ්‍යාපනය ලබන පාසල් ශිෂ්‍යයන් ගැනත් රජයක් විධියට ජාතික ප්‍රතිපත්තියක් හදන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, අධ්‍යාපනයේ මේ වෙනස්කම්වලට සාපේක්ෂව මේ උපාධිධාරීන්ට රැකියා ලබා දීමේදීත් ජාතික ප්‍රතිපත්තියක අවශ්‍යතාව තිබෙනවා. විශ්වවිද්‍යාලයට එන දරුවන්ගෙන් විද්‍යා විෂය ධාරාව හදාරන දරුවන්ට උපාධිය අවසන් වෙලා යම් කාල සීමාවක් තුළ රැකියාවක් ලබා ගැනීමේ ගැටලුවක් නැහැ. අපේ රට තුළ ඔවුන්ට යම් අවස්ථාවක් හිමි වෙනවා. වාණිජ උපාධියක් ලබා ගන්නවා නම් සාමාන්‍ය මට්ටමේ රැකියාවක් ලබා ගැනීමේ හැකියාවක් තිබෙනවා. මේ රටේ උපාධි ලබා ගන්නා පිරිසෙන් සියයට 60ට විතර ආසන්න පිරිසක් කලා උපාධි තමයි ලබා ගන්නේ, ගරු කථානායකතුමනි. බාහිර උපාධි කරන අපේ සහෝදර ශිෂ්‍යයන් බොහෝ වෙලාවට කලා විෂය ධාරාව ඔස්සේ උපාධිය ලබා ගන්නවා. ඒ හදාරන විෂයයන් අනුව මේ රටේ කොහේවත් රැකියාවක් ලබා ගන්න පුළුවන් මඟක් නැහැ. අධ්‍යාපනයේ අවසානයේ උපාධියක් අවශ්‍යයැයි කියන නිසා, උපාධියක් ලබා ගැනීමේ අරමුණින් ඒ දරුවන් තෝරා ගන්නා විෂයයන්වලට අනුව උපාධියක් ලැබුණත්, ඊට ගැළපෙන රැකියාවක් නැහැ. මේ ගැටලුව ගැන අපි හිතන්න ඕනෑ. මේ රටේ විශ්වවිද්‍යාලවල අධ්‍යාපනය ලබන දරුවන්ගෙන් බොහෝ පිරිසක් දැඩි දුෂ්කරතා මධ්‍යයේයි ඒ තැන්වලට එන්නේ. විශේෂයෙන්ම මා නියෝජනය කරන රත්නපුර දිස්ත්‍රික්කයේ ඇඹිලිපිටියේ මෙන්ම මොනරාගල, අනුරාධපුර වාගේ දුෂ්කර ප්‍රදේශවල ශිෂ්‍යයෝ පාසල් කාලයේ ඉඳලාම මේ උපාධිය දක්වා එන්නේ මහා ලොකු අපහසුතා රාශියකට මුහුණ දීලා.

අප සොයා බැලුවොත්, සමහර විට මේ දරුවන්ගේ අම්මා, තාත්තා කුඹුරු ගොවිතැන කරන්නේ; නැත්නම් කොහේ හෝ එළවලු ගොවිතැනක් කරන්නේ; එහෙමත් නැත්නම් කාගේ හෝ කුලී වැඩක් තමයි කරන්නේ. ඒ දේවල් කරලා තමන් අතට එන පුංචි මුදලින් තමයි ඒ දෙමව්පියෝ මේ දරුවන්ට පාසල් අධ්‍යාපනය ලබාදෙන්නේ. ඒ අම්මා තාත්තාගේ අරමුණ තමන් විඳින මේ දුක, වේදනාව තමන්ගේ දරුවාට නොදීමයි. තමන්ගේ දරුවා මේ රටේ වැදගත් පුරවැසියෙක් කරන්න, අධ්‍යාපනයේ ඉහළ තැනට යවන්න එදා වේල කන්නේ නැතිව, ඉතාම සංවේදීව ජීවිත එක්ක සටන් කරලා තමයි ඔවුන් මේ දරුවා විශ්වවිද්‍යාලයට එවන්නේ. ගරු කථානායකතුමනි, ඒ දරුවා විශ්වවිද්‍යාලයට එන තැනදී ඒ අහිංසක අම්මා තාත්තාගේ බලාපොරොත්තුව ඉටු කරන්න; ඒකට වටිනාකමක් දෙන්න වැඩසටහනක් රජයන් විධියට ඉතිහාසය පුරාම අපේ ළඟ තිබිලා නැහැ. වර්තමානයේත් නැහැ.

සමහර වෙලාවට දේශපාලන අවශ්‍යතා නිසා මේ උපාධිධාරීන් තමන්ගේ දේශපාලන අතකොළු බවට පත් කරගන්නා යෝජනා ගෙනා ඉතිහාසයන් අප දැක තිබෙනවා. හැබැයි, ඒක නොවෙයි විය යුත්තේ. මේ රටේ උපාධියක් හදාරන කොට, අන්න ඒ උපාධියට රැකියා වෙළෙඳ පොළ තුළ රැකියාවක් ලබාගත හැකි වටිනාකමක් දෙන්න පුළුවන් ආකාරයට අධ්‍යාපනය සකස් වෙන්න ඕනෑ. මොකද, අප දන්නවා විශ්වවිද්‍යාලයට යන අපේ බොහෝ දරුවෝ මහපොළ ආධාර මුදලින් ජීවත් වෙමින් එහි අධ්‍යාපනය ලබන බව. ඔවුන්ට ඒ මුදලත් මදි වන වෙලාවට තමන්ගේ අම්මා කනේ තිබෙන කරාබු දෙක උගස් තියලා සල්ලි එවනවා, තමන්ගේ අධ්‍යාපන කටයුතු අවසන් කරගන්න කියලා. හැබැයි, අම්මා තාත්තාගේ වේදනාවන් කර පින්නා ගෙන මහා බලාපොරොත්තු රාශියක් එක්ක විශ්වවිද්‍යාලය තුළට යන දරුවාට තමන්ගේ උපාධිය ලබා ගැනීමේ වැඩ කටයුතු අවසන් කර ගන්න දෙන්නෙත් නැතිව සමහර දේශපාලන කණ්ඩායම්වල රැල්ලට මේ අහිංසක දරුවන් මැදි කර ගන්නා අවස්ථාවන් අද මේ රට තුළ නිර්මාණය වෙලා තිබෙනවා. ඒ නිසා මා හිතනවා, ඒකත් රජය යම් තාක් දුරට නිවැරදි තැනකට අරගන්න කටයුතු කරන්න අවශ්‍යයි කියා. මොකද, මේ රටේ බුද්ධිමත්ම කණ්ඩායම, මේ රටේ අනාගතය භාර ගන්න ඉන්න කණ්ඩායම තමයි විශ්වවිද්‍යාලය ඇතුළට යන්නේ. ඒ ශිෂ්‍යයා මේ රටට ආදරය කරන පුරවැසියකු විධියට මේ රටේ ප්‍රශ්නයක් වෙනුවෙන් පෙනී සිටිනවා නම් ඒකේ කිසිම වැරැද්දක් නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි තුනක කාලයක් තිබෙනවා.

**ගරු හේෂාන් විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)
හොඳයි, ගරු කථානායකතුමනි. ඒ නිසා දුක් විඳලා අධ්‍යාපනය ලබා උපාධියක් අරගෙන එළියට එන දරුවාට රැකියාවක් ලබා ගැනීම සඳහා දේශපාලනඥයන් පසුපස යන්නට සිදු වන සංස්කෘතිය නිම කරන්නට ඕනෑ. මේ රටේ අද වනතුරු තිබෙන දේශපාලනඥයන්ගේ අවශ්‍යතාව මත උපාධිධාරීන්ට රැකියා ලබා දීමේ ක්‍රමවේදය නවතින්න ඕනෑ. ඒ විතරක් නොවෙයි. උපාධියට සරිලන රැකියා නිර්මාණය වන විධියට මේ රටේ රැකියා වෙළෙඳ පොළ සකස් කිරීමට රජය අවශ්‍ය පියවර ගන්න ඕනෑ.

ඉතිහාසයේ උපාධිධාරීන්ට රැකියා ලබා දුන්නා. ඒක හොඳයි. හැබැයි, ඒ අයට රැකියා ලබා දීමේ දී මූලික වැටුප වුණේ රුපියල් 15,600යි. උපාධිධාරියකුගේ වටිනාකම, උපාධිධාරියකුගේ අනාගතය රුපියල් පහළොස් දහසකින්, දහසය දහසකින් තීරණය කිරීම වැරැදියි කියලා මා හිතනවා. ගරු කථානායකතුමනි, ඒ නිසා උපාධිධාරීන්ට රැකියා ලබා දීමේ නිසි ක්‍රමවේදයක් පිළිබඳව ජාතික ප්‍රතිපත්තියක් ඇති කිරීම සඳහා අපේ ගරු උසස් අධ්‍යාපන ඇමතිතුමාගේ, ගරු අධ්‍යාපන ඇමතිතුමාගේ සහ ගරු අග්‍රාමාත්‍යතුමාගේ අවධානය යොමු කරන්නය කියලා ඉල්ලා සිටිනවා.

උපාධිය ලබා ගෙන එන උපාධිධාරියා හැල්ලුවට ලක් කරමින්, මේසයක්, පුටුවක් පවා නැති කොහේ හරි තැනක රැකියාවක් දීලා දේශපාලනික වශයෙන් වාසි ගන්න යම් ආණ්ඩුවක් ඉතිහාසයේ කටයුතු කරලා තිබෙනවා නම්; වර්තමානයේ කටයුතු කරනවා නම්, ඒක මේ රටේ අහිංසක ශිෂ්‍ය ප්‍රජාවට කරන අසාධාරණයක් කියලායි මම හිතන්නේ. අන්න ඒ වැරැදි දේශපාලන ක්‍රමවේදය මේ රටින් තුරන් කිරීමට පවතින රජය විධියට මේ යහ පාලන රජය ක්‍රියා කළ යුතුයි. මේක පූර්වාදර්ශයක් විධියට අරගෙන අනාගතයේ දී මේ රටේ බිහි වන සෑම උපාධිධාරියෙකුටම රට තුළ සුදුසු රැකියාවක් ලබා ගැනීමට හැකිවන පරිදි කටයුතු කළ යුතුයි. ඒ වාගේම මේ රටේ සිටින දහස් සංඛ්‍යාත ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට බලාපොරොත්තු සහිතව මේ රට තුළ අධ්‍යාපනය හදාරා උපාධියක් ලබා ගැනීමේ වටිනාකම පිළිබඳ හැඟීම ස්ථිරවම හදවත් තුළට දැනෙන විධියට රටේ අධ්‍යාපනය සකස් කළ යුතුයි කියන එක මම මේ ගරු සභාවට යෝජනා කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.

ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව ස්ථිර කරන්න.

[පූ.භා. 10.54]

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
ගරු කථානායකතුමනි, "උපාධිධාරීන් සඳහා රැකියා ලබා දීමේ දී නිසි ක්‍රමවේදයක් සකස් කිරීම" කියන යෝජනාව ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ගරු හේෂාන් විතානගේ මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වන අතර, එම යෝජනාව මා ස්ථිර කරන්න කැමැතියි. ඇත්තටම ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයකු වෙතින් මේ වාගේ යෝජනාවක් ඉදිරිපත් වීම අගය කළ යුතුයි. අපේ රටේ හැමදාම තිබුණු ප්‍රශ්නයක් තමයි, රජයේ රැකියා ලබා දීමේ දී දේශපාලන ඇඟිලි ගැසීම් සිදුවීම. උපාධිධාරීන්ට රැකියා ලබා දීමේ දීත් මෙවැනි ආකාරයේ දේශපාලන ඇඟිලි ගැසීම්, අකටයුතුකම් සිද්ධ වෙනවා නම් එය රටක් හැටියට තරුණ පරම්පරාව මුහුණ දෙන බරපතළ අපරාධයක්. සාමාන්‍යයෙන් රටේ වසරකට උපදින්නේ දරුවන් 360,000යි. එයින් දරුවන් 315,000ක් පමණ තමයි පාසල් අධ්‍යාපනයට ඇතුළත් වන්නේ. එයින් 2,80,000ක් පමණ අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් සමත් වෙනවා, 1,60,000ක් පමණ අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයෙන් සමත් වෙනවා. හැබැයි අපේ විශ්වවිද්‍යාල පද්ධතියට ඇතුළත් කර ගන්නේ 25,000කට ආසන්න ප්‍රමාණයක්. ඒ කියන්නේ, උපදින දරුවන්ගෙන් සියයට 7ක් පමණ තමයි විශ්වවිද්‍යාලයට ඇතුළත්වෙලා උපාධිධාරියකු බවට පත්වන්නේ. සාමාන්‍යයෙන් විශ්වවිද්‍යාලයට ඇතුළත්වෙලා උපාධිධාරියකු දක්වා යන ගමනේදී ඒ දරුවන්ගේ අධ්‍යාපනය පිළිබඳ බැලුවොත්, ඔවුන් පළමුවන ශ්‍රේණියේ සිට, ශිෂ්‍යත්ව විභාගයේදී, සාමාන්‍ය පෙළ විභාගයේදී, උසස් පෙළ විභාගයේදී ඉහළම දක්ෂකම් දක්වා තිබෙනවා. මේ තමයි අපේ රටේ අනාගතය සකස් කිරීමේ තීරණාත්මක බලවේගය. එවැනි අය විශේෂ දැනුමක්, හැකියාවක් ප්‍රගුණ කරගෙන, උපාධියක් ලබාගෙන විශ්වවිද්‍යාලයෙන් එළියට එනකොට ආණ්ඩුවක් සමත් වෙන්න ඕනෑ, ඒ අයගෙන් උපරිම ප්‍රයෝජනය ලබාගන්න. නමුත් දැන් සිදු වී තිබෙන කාලකණ්ණි සහගත ස්වභාවය තමයි, උපාධියක් ලබාගන්නා අතිවිශේෂ කොටසටත් යම්කිසි ආකාරයක ලියවිල්ලක් ලබාගන්න දේශපාලනඥයන් පස්සේ යන්න සිද්ධවීම.

සමහර විට දේශපාලනඥයා අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයවත් සමත් නැහැ. සමහර විට අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයට වාඩිවෙලා විතරයි. හැබැයි විශේෂවේදී උපාධිධාරියා ආසන සංවිධායක පිටි පස්සේ යනවා, ඔහුගෙන් ලිපියක් ලබාගන්න. පසු ගිය කාලයේ මේවාට ඕනෑ තරම් උදාහරණ තිබුණා. රැකියාවක් ලබාගන්න විතරක් නොවෙයි, විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහාත් ඉතිහාසයේ පළමුවන වතාවට පසු ගිය ආණ්ඩුවේ ප්‍රබලයින් විසින් ලිපි නිකුත් කරන ලද කාලයක් තමයි පසු කර ගෙන ආවේ. එම නිසා කවර ආණ්ඩුවක් බලයට පත් වුණත්, මෙවැනි අකටයුතුකම් ඉවත් කිරීම සඳහා යම්කිසි ක්‍රමවේදයක් සකස් කරන එක හොඳයි.

ගරු කථානායකතුමනි, උපාධිධාරීන් හැමදෙනාම ඉගෙන ගෙන තිබෙන්නේ අපේ රටේ ජනතාවගේ බදු මුදල්වලිනුයි. ඔවුන් බදු මුදල්වලින් ඉගෙන ගෙන විශ්වවිද්‍යාලයෙන් එළියට එනකොට ඇත්තෙන්ම රට සූදානම්වෙලා ඉන්න ඕනෑ, ඔවුන්ගෙන් වැඩක් ගන්න. නමුත් අද උපාධිධාරීන්ට සිද්ධ වෙලා තිබෙන්නේ උපාධිය කරපින්නාගෙන, උපාධි ලෝගුව දාගෙන, උපාධි සහතිකය රෝල් කරගෙන එක්කෝ ලිප්ටන් වටරවුමේ එහෙම නැත්නම් රටේ ප්‍රධාන නගරවල ඉඳගෙන "තමන්ට රැකියාවක් දියව්", "තමන්ගෙන් වැඩක් ගනිව්" කියලා උද්ඝෝෂණ කරන්නයි. ආණ්ඩුවක කාර්යභාරය බවට පත්වෙන්නේ ඔවුන්ගෙන් වැඩ ගැනීමයි. හැබැයි, ඔවුන් ඉල්ලනවා තමන්ගේ දක්ෂතාවට සරිලන විධියේ රැකියාවක් ලබාගෙන තමන්ගේ රටට සේවයක් කරන්න දෙන්න කියලා. මෙහෙම දිගින් දිගටම යනකොට රටක් කොතැනටද යන්නේ කියන එක අපි තේරුම් ගන්න ඕනෑ. අපි කොහොමවත් කියන්නේ නැහැ, මේ සියලු උපාධිධාරීන් රාජ්‍ය යන්ත්‍රණයට පමණක් බඳවා ගන්න ඕනෑ කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
හොඳයි.

මේ වෙලාවේදී අපේ ගරු උසස් අධ්‍යාපන ඇමතිතුමා සභාවේ සිටින නිසා ඔබතුමාගේ අවධානය යොමු කරවනවා අද දින "දිවයින" සහ "ද අයිලන්ඩ්" පුවත් පත්වල මුල් පිටුවල තිබෙන වාර්තා වෙතට. පේරාදෙණිය සහ කොළඹ විශ්වවිද්‍යාල, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ගලවා ඒවා ස්වාධීන ලාභ උපදවන ආයතන බවට පත් කිරීමේ උත්සාහයක් ආණ්ඩු පක්ෂය පැත්තෙන් යෝජනා වන බවට විශේෂයෙන් "ද අයිලන්ඩ්" පුවත් පත ඔවුන්ගේ ප්‍රධාන ප්‍රවෘත්තිය බවට පත් කරගෙන තිබෙනවා. විශේෂයෙන් අපේ රටේ උපාධිධාරින් බිහිකරන ප්‍රධාන ආයතන දෙකක් වන කොළඹ සහ පේරාදෙණිය විශ්වවිද්‍යාල මේ විධියට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂමෙන් ගලවලා, ස්වාධීන කරලා, ඒවා ලාභ ලබන ආයතන බවට පත් කරලා අපේ රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතියෙන් ගැලවීමේ සැලසුමක් ආණ්ඩුවට තිබෙනවාද? එහෙම නම් එය බරපතළ තත්ත්වයක්. අගමැතිතුමාත් ඉගෙන ගත් කොළඹ විශ්වවිද්‍යාලය එතුමාගේ පාලන කාලය තුළ විශ්වවිද්‍යාල පද්ධතියෙන් ගලවා පෞද්ගලික පැත්තට විවර කර ගන්නවා නම්, ඒක බරපතළ තත්ත්වයක්. ඒ සම්බන්ධයෙන්ගරු ඇමතිතුමාගෙන් වගකිවයුතු පිළිතුරක් මා අපේක්ෂා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානාකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමා, කථා කරන්න තව මන්ත්‍රීවරයෙක් සිටිනවා නම් එතුමාට අවස්ථාව දීලා ඔබතුමාට අවස්ථාව දෙන්නම්.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I have to reply the Hon. Member.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Yes, that is right.

[පූ.භා. 10.58]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අපේ මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ විධියේ අදහසක් අපේ නැහැ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
නමුත් තමුන්නාන්සේලා,-

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු මන්ත්‍රීතුමා පොඩ්ඩක් ඉන්න කෝ.

ගරු මන්ත්‍රීතුමනි, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හැටියට අපි මේ ගැන සාකච්ඡා කරලාත් නැහැ. හැබැයි, Oversight Committeesවල යම් යම් සංවාද ඇති වනවා. There are discussions. මේ ගැන Oversight Committee එකේ සංවාදයක් ඇති වෙන්න ඇති. නමුත්, එය රජයේ ප්‍රතිපත්තිය නොවෙයි.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
ගරු ඇමතිතුමනි, ඇත්තටම එම අදහස ඉදිරිපත් වුණේ Oversight Committee එකේදී නොවෙයි. තමුන්නාන්සේලාගේ ගරු ආශු මාරසිංහ මන්ත්‍රීතුමා Subcommittee එකක් දා ගෙන උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරින් කැඳවලා, කොළඹ විශ්වවිද්‍යාලයේ උප කුලපතිවරයා ඇතුළු නිලධාරින් කැඳවලා තමයි මේ අදහස් ආණ්ඩුව පැත්තෙන් ඉදිරිපත් කරන්නේ. [බාධා කිරීම්] එතුමන්ලා තේරුම් ගන්නේ, ඒක ආණ්ඩුවේ අදහසක් විධියටයි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දැන ගන්න ඕනෑ Oversight Committeesවල රාජ්‍ය ප්‍රතිපත්තිය ගැන කථා කරන්නේ නැති බව.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
ගරු ඇමතිතුමනි, ඒක ඔබතුමන්ලාගේ ප්‍රතිපත්තිය නොවෙයි නම් ප්‍රශ්නයක් නැහැ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Oversight Committees තිබෙන්නේ, යම් යම් සංවාද ඇති කරලා අධ්‍යාපනය උසස් කරන්නේ කොහොමද කියලා අදහස් දැන ගන්න. රජයේ ප්‍රතිපත්තිය Oversight Committeesවල සාකච්ඡා කරන්නේ නැහැ. ඔබතුමා ඒක දන්නවා ඇති නේ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
එහෙම නම් එතුමාගේ ඇඟේ තිබුණු මොකක් හෝ ප්‍රශ්නයකට කරපු වැඩක්.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Oversight Committeesවලින් අපේ සභාපතිත්වය යටතේ තබා ගත්තේ කීපයයි. අනෙක් Oversight Committeesවල සභාපතිත්වය අපි අනෙකුත් පක්ෂවලට දුන්නා. අපට අවශ්‍ය සියලු දෙනාගේම මතය ලබා ගන්නයි. හැම පක්ෂයකම මතය Oversight Committeesවලට එන්න ඕනෑ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
නමුත්, තමුන්නාන්සේලාගේ රජය - [බාධා කිරීම්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒ කාලේ සිදු වුණේ මෙහෙම නොවෙයි නේ. ඒ කාලයේ උපදේශක කාරක සභා තිබුණේ. ඇමතිවරයා තමයි එතුමාගේ අමාත්‍යාංශයට අදාළ උපදේශක කාරක සභාවේ සභාපති. නමුත් අද එහෙම නොවෙයි. උසස් අධ්‍යාපනයට අදාළ Oversight Committee එකේ මම නැහැ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
ඒක මම දන්නවා. නමුත්, තමුන්නාන්සේලාගේ ආණ්ඩුව වෙනුවෙන් SAITM එක වෙනුවෙන් වැඩිපුරම කෑ ගහන කෙනා තමයි ඒ Oversight Committee එකේ බලය පාවිච්චි කරලා මේ ස්වාධීන වන යෝජනා ගෙනෙන්නේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
කොළඹ විශ්වවිද්‍යාලයයි, පේරාදෙනිය විශ්වවිද්‍යාලයයි පෞද්ගලික අංශයට පැවරීම ගැන අපි කථා කරලාවත් නැහැ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
හොඳයි, එහෙම නම් බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Minister, do you want to reply further on this?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
No. I replied a particular query.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ යෝජනාව move කරපු මන්ත්‍රීතුමාට කථා කරන්න තව අවස්ථාවක් අවශ්‍යද? හේෂාන් විතානගේ මන්ත්‍රීතුමාට තව අදහස් ප්‍රකාශ කරන්න අවශ්‍යද?

**ගරු හේෂාන් විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)
සුළු අවස්ථාවක් දෙන්න ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, කථා කරන්න.

[පූ.භා. 11.00]

**ගරු හේෂාන් විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)
ගරු කථානායකතුමනි, තව කථිකයෝ සිටියත් කාලය ප්‍රමාණවත් නොවන නිසා මේ යෝජනාව වෙනුවෙන් කථා කරන්න විධියක් නැහැ. මගේ යෝජනාව ස්ථිර කළ ජනතා විමුක්ති පෙරමුණේ ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමාට මගේ ගෞරවය පුද කරනවා. ඒ වාගේම එතුමා යොමු කළ ප්‍රශ්නයට ගරු උසස් අධ්‍යාපන අමාත්‍යතුමා උත්තර දුන්නා. අපි දන්නවා ගරු මන්ත්‍රීතුමනි, Sectoral Oversight Committeesවලදී ඕනෑ තරම් යෝජනා ඉදිරිපත් වෙනවා. අදාළ අමාත්‍යාංශයේ අමාත්‍යවරයා තමයි තීන්දුව ගන්නේ. ඒ නිසා ඒක මහා ප්‍රශ්නයක් කරගන්න එපා. අපි සියලු දෙනා එකතු වෙලා අපේ පොදු අරමුණ, - අද ඉදිරිපත් කළ මගේ යෝජනාවේ අරමුණ වෙන්නේ, මේ රටේ අද වනතෙක් නිර්මාණය වෙලා තිබෙන ගැටලුවක් වන උපාධිධාරියාට වටිනාකමක්; උපාධියට වටිනාකමක් ලබාදීමයි. අපි දැක්කා, පසු ගිය කාලයේ එක් දේශපාලනඥයෙකුගේ අවශ්‍යතාව වෙනුවෙන් ඇට බෙදන්න සිද්ධ වුණා; පුටුවක් නැතුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඉන්න සිද්ධ වුණාය කියලා. එහෙම නොවෙයි. ඊට එහා ගිය ගෞරවයක්, අභිමානයක් දෙන්න පුළුවන් විධියට මේ රටට අවශ්‍ය නීති සම්පාදනය කරන්න හැකියාව ලැබෙන්න ඕනෑ කියා මා විශ්වාස කරනවා. එම නිසා අද මෙම යෝජනාව මේ උත්තරීතර සභාවට යොමු කරන්න ලැබීම පිළිබඳව ගරු කථානායකතුමාට මගේ ගෞරවනීය ස්තුතිය පිරිනමනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඊළඟ යෝජනාව, පා.155/'15 - ගරු ලකී ජයවර්ධන මන්ත්‍රීතුමා - පැමිණ නැත.

ඊළඟ යෝජනාව, පා. 178/'16 - ගරු ඩග්ලස් දේවානන්දා මැතිතුමා.

## යුද්ධය නිසා දිවි අහිමි වූ ජනතාව සිහි කිරීම සඳහා අනුස්මරණ ස්මාරකයක් තැනීම සහ සිහිපත් කිරීම සඳහා පොදු දිනයක් වෙන් කිරීම
## யுத்தத்தின்போது உயிரிழந்த மக்களை நினைவுகூர்வதற்காக நினைவுத்தூபியொன்றை அமைத்தல் மற்றும் நினைவுகூர்வதற்கான பொதுத் திகதியொன்றைக் குறித்தொதுக்குதல்
## BUILDING A MEMORIAL FOR THE PEOPLE WHO LOST THEIR LIVES DUE TO THE WAR AND DECLARING A COMMON DAY TO COMMEMORATE THEM

[மு.ப. 11.03]

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
கௌரவ சபாநாயகர் அவர்களே, நான் பின்வரும் பிரேரணையை முன்மொழிகின்றேன்.

"வட மாகாணத்தில் கடந்த பல தசாப்தங்களாகக் காணப்பட்ட யுத்த நிலவம் நீங்கி அமைதியானதொரு வாழ்க்கை முறைக்கு மக்கள் பிரவேசித்துள்ளதோடு, கடந்த காலப்பகுதியில் நிலவிய அசாதாரண சூழ்நிலைமையின் காரணமாகவும், யுத்த நிலவரம் காரணமாகவும், படுகொலைக்கு உள்ளான அனைத்து இன, மத மற்றும் சமூகங்களைச் சேர்ந்த, சகல மொழிகளையும் பேசுகின்ற மக்களை இலங்கையர்களாக நினைவுகூர்ந்து, அம்மக்கள் தாய் நாட்டுக்காக மேற்கொண்ட தியாகங்களுக்கு மதிப்பளிப்பதற்காக, வட மாகாணத்தின் ஓமந்தைப்

பிரதேசத்தில் பொருத்தமானதோர் இடத்தில் 'நினைவுத்தூபியொன்றை' அமைப்பதற்கும், மேற்படி யுத்த நிலவரம் காரணமாக உயிரிழந்த சகல இன, மத, மற்றும் மாற்று மொழிகளைப் பேசுகின்ற மக்களை நினைவுகூர்வதற்காகப் பொருத்தமான திகதியொன்றைப் பெயரிட்டு ஒவ்வோர் ஆண்டும் அத்தினத்தைக் கொண்டாடுவதற்கும் அரசாங்கம் நடவடிக்கையெடுக்க வேண்டுமென இப்பாராளுமன்றம் பிரேரிக்கின்றது."

கௌரவ சபாநாயகர் அவர்களே, இதனை நான் நீண்டகால ஒரு முயற்சியாக முன்னெடுத்திருந்தேன். எமது நாட்டில் சுமார் 30 வருட காலமாக இடம்பெற்று முடிந்துள்ள கொடிய யுத்தம் காரணமாக எமது நாட்டிலே வாழ்ந்த அனைத்து இன சமூகங்களைச் சேர்ந்த மக்களும் பல்வேறு நிலைகளில் கொல்லப்பட்டுள்ளனர், அங்கவீனமாக்கப் பட்டுள்ளனர், உடைமைகள் மற்றும் சொத்து அழிவு களுக்குட்படுத்தப்பட்டுள்ளனர், பல்வேறு உள ரீதியிலான பாதிப்புகளுக்குட்பட்டுள்ளனர். இன்று எமது மக்கள் அதிலிருந்து மீண்டுவருவதற்கான முயற்சிகளை மேற் கொள்கின்ற காலகட்டத்தில், பல்வேறு இயற்கை மற்றும் செயற்கை அனர்த்தங்களுக்கு முகங்கொடுப்பதோடு, வடக்கு, கிழக்கு மாகாணங்களில் பல்வேறு கலாசார சீரழிவுகளுக்கும் உள்ளாக்கப்பட்டுள்ளனர்.

இந்த அனைத்து இடர்களையும் பிரச்சினைகளையும் சமாளித்து இந்த நாடு முன்னேற வேண்டுமாயின், அதற்கான பொருளாதார நிலையை எட்ட வேண்டும். எனவே, தற்போதுள்ள பொருளாதார நெருக்கடிகளைச் சமாளித்துக் கொண்டே நிலையான பொருளாதாரத்தை எட்ட வேண்டி யுள்ளது. இந்தப் பொருளாதார நிலையை எட்டுவதற்கான பாதையில் மிக முக்கியமான காரணியாக தேசிய மற்றும் சர்வதேச மட்டத்தில் கருதப்படுவது தேசிய நல்லிணக்கம் மற்றும் இனங்களுக்கிடையிலான சகவாழ் வாகும். இனங்களுக் கிடையில் தொடர்ந்தும் முரண்பாட்டு நிலை தொடருமானால் இந்த நாட்டில் நிலையானதொரு பொருளாதார விருத்தியை நோக்கி நகர முடியாத நிலையே ஏற்படும் என்பது யாவரும் அறிந்துகொண்டுள்ள யதார்த்தமாகும்.

அண்மையில் எமது நாட்டில் தேசிய நல்லிணக்கம் மற்றும் சகவாழ்வு தொடர்பிலான தேசியக் கொள்கை வெளியிட்டு வைக்கப்பட்டுள்ளது. அந்த வகையில், மேதகு ஜனாதிபதி மைத்திரிபால சிறிசேன அவர்களும் கௌரவ பிரதமர் ரணில் விக்கிரமசிங்க அவர்களும் பாரிய முயற்சிகளை மேற்கொண்டு இந்த நாட்டில் இனங்களுக்கிடையில் ஐக்கியத்தை ஏற்படுத்துவதற்கும் அதனூடாகத் தேசிய நல்லிணக்கத்தைக் கட்டியெழுப்புவதற்கும் நடவடிக்கைகளையெடுத்து வருவது வரவேற்கத்தக்கது. இவர்களது முயற்சிகளுக்கு ஏனைய அமைச்சர்கள் உள்ளிட்ட நாடாளுமன்ற உறுப்பினர்களும் பலம் சேர்ப்பது குறிப்பிடத்தக்கது.

அந்த வகையில் எமது நாட்டில் தேசிய நல்லிணக்கம் கட்டியெழுப்பப்பட வேண்டுமாயின் முதலில் எமது மக்களது உணர்வு ரீதியான பிரச்சினைகள் தீர்க்கப்பட வேண்டும். அவை தீர்க்கப்பட்டால் மாத்திரமே தேசிய நல்லிணக்கமானது உணர்வுபூர்வமானதாகவும் வலுவுள்ளதாகவும் அமைவது சாத்தியமாகும். அன்றி, தேசிய நல்லிணக்கம் என்பது பலவந்தமாகக் கட்டியெழுப்பக்கூடியதல்ல. எமது மக்களின் உணர்வுபூர்வமான பிரச்சினைகள் பல இருக்கின்றன. அவை தொடர்பில் ஏற்கெனவே நான் இந்தச் சபையிலே தொடர்ந்தும் கூறி வந்திருக்கின்றேன். அவற்றில் மிகவும் முக்கியமான ஒரு விடயம் பற்றியதாகவே எனது இன்றைய தனிநபர் பிரேரணை அமைந்துள்ளது என்பதை இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

கௌரவ சபாநாயகர் அவர்களே, இந்த நாட்டில் வாழ்கின்ற தமிழ் மக்கள் தமிழர்களாக வாழ வேண்டும் என்பதற்காக 'இலங்கையர்கள்' என்ற அடையாளத்தை விட்டுக் கொடுக்கவோ, இலங்கையர்களாக வாழவேண்டும் என்பதற் காகத் 'தமிழர்கள்' என்ற அடையாளத்தை விட்டுக் கொடுக்கவோ ஒருபோதும் விரும்புவதில்லை. எமது மக்கள் தமிழர்களாகவும் அதேநேரம் இலங்கையர்களாகவுமே வாழ விரும்புகிறார்கள். இதில் எவ்விதமான சந்தேகமும் இல்லை. எனவே, எமது மக்களது உணர்வுகள் மதிக்கப்பட வேண்டு மென்பதை இங்கு மீண்டும் வலியுறுத்த விரும்புகின்றேன். அந்த வகையில் யுத்தம் காரணமாக உயிரிழந்த தமது உறவுகளை நினைவுகூரும் வகையில் ஒரு பொதுவான நினைவுத்தூபி ஒன்றினை அமைப்பதற்கும் அதற்கென ஒரு தினத்தைப் பிரகடனப்படுத்துவதற்குமாகவே மேற்படி தனிநபர் பிரேரணை என்னால் இங்கு முன்வைக்கப்படுகின்றது.

கடந்த காலத்தில் நான் இதற்கான நடவடிக்கையினை முன்னெடுத்திருந்த நிலையில் அது அக்காலகட்டத்தில் ஏற்றுக்கொள்ளப்பட்டும் நிறைவேற்றப்படாததற்குப் பல்வேறு காரணங்கள் கூறப்பட்டிருந்தாலும் யுத்தத்தை வெற்றிகொண்ட ஓர் அரசு என்ற ரீதியில் அது கேள்விக்குறியாகவே இருந்து விட்டது என்றே நான் கருதுகின்றேன். இத்தகைய எமது மக்களின் உணர்வுபூர்வமான விடயங்கள் உட்படப் பல்வேறு தேவைகள் நிறைவேற்றப்படாமை மற்றும் சிறுபான்மையின மக்களை அவதானத்தில் கொள்ளாது செயற்பட்டமை என்பவற்றின் விளைவாகவே அம்மக்களது தேவைகள் உணர்த்தப்பட்ட நிலையில் அம்மக்களில் அதி பெரும்பான்மை யினரால் இந்த ஆட்சிக்கு வித்திடப்பட்டமை பற்றி இந்த ஆட்சியிலிருக்கின்ற பலரும் ஏற்றுக்கொள்கின்றனர். அந்த நிலையிலேயே அதுவும் "யுத்தத்தை வெற்றி கொண்ட நாம் தமிழ் மக்களது மனங்களை வெல்லவில்லை" என தனது ஆரம்ப சுதந்திர தின உரையில் கருத்து வெளியிட்டிருந்த மேதகு ஜனாதிபதி அவர்களினதும் தமிழ் பேசும் மக்களின் மனங்களை வெல்ல வேண்டுமென்ற முனைப்போடு செயற்படுகின்ற மாண்புமிகு பிரதமர் ரணில் விக்கிரமசிங்க அவர்களினதும் தலைமையில் இந்த நாட்டின் தேசிய நல்லிணக்கச் செயற்பாடுகள் முன்னெடுக்கப்பட்டு வருகின்ற ஆட்சிக் காலத்தில் இந்தப் பிரேரணை நிறைவேற்றப் படுமென்ற நம்பிக்கையில் இதனை நான் இங்கு முன்வைத்துள்ளேன்.

எமது மக்கள் தங்களது உறவுகளைக் கடந்தகால யுத்தத்தில் பறிகொடுத்துவிட்டு, அந்த உயிர்களின் ஆத்ம சாந்திவேண்டி, மதச்சடங்குகளை மேற்கொண்டு, அவர்களை நினைவு கூர்வதற்காக கடந்த காலங்களில் பல்வேறு சிரமங்களை எதிர்கொண்டிருந்தனர் என்பதை யாவரும் அறிவீர்கள். ஆனால், தற்போதைய நிலையில் அந்தச் சிரமங்கள் ஓரளவுக்கு அகற்றப்பட்டுள்ளமை வரவேற்கத்தக்கது. இருப்பினும், பறிபோன உறவுகளை நினைவுகூர்வதை சில தமிழ் அரசியல் வாதிகள் தங்களது சுயலாப அரசியலுக்குப் பயன்படுத்தி வருகின்றார்கள். இது ஒரு காட்சிப்படுத்துகை என்ற ரீதியில் அமைந்துவருகின்றது. ஒரு விளக்கை ஏற்றிவிட்டு, தங்களது அரசியலை அந்தத் துன்பகரமான இடத்தில் அரங்கேற்றுகின்ற அசிங்கங்கள் அங்கே மேற்கொள்ளப்பட்டு வருகின்றன. இதற்கு காவல்துறையினர் பாதுகாப்பும் வழங்குகிறார்கள். இந்த அரசியல் நாடகங்களை ஏற்காத, விரும்பாத எமது மக்கள் சுயமாக தங்களது உணர்வுகளுக்கும் உயிரிழந்த தமது உறவுகளுக்கும் மரியாதை கொடுத்து அந்த உறவுகளை நினைத்து, நெகிழ்ந்து தங்களது மத வழிபாடுகளை மேற்கொள்ள முற்படுகின்றபோது, காவல்துறை உட்பட பாதுகாப்புத் துறையினரால் பல்வேறு இடையூறுகள்

[ගරු ඩග්ලස් දේවානන්දා මහතා]

ஏற்படுத்தப்பட்டு வருவதையும் இங்கு சுட்டிக்காட்ட வேண்டியுள்ளது.

இவ்வாறான செயற்பாடுகள் மூலமாக எமது மக்களின் உணர்வுகள் புண்படுத்தப்பட்டு வருகின்ற நிலையில், இந்த நாட்டில் தேசிய நல்லிணக்கம் சாத்தியப்படுமா? என்ற கேள்வியே எம்முன் எழுகின்றது. எமது மக்களது உணர்வு ரீதியிலான இவ்வாறான பாதிப்புகளைத் தொடர்ந்தும் வளர்த்தெடுத்து, அதனை ஒரு வெறுப்பாக எங்கள் மக்கள் மனதில் குடியிருத்தாமல், அந்த மக்களின் மனதை வென்றெடுக்க வேண்டிய பொறுப்பு இந்த அரசுக்கு உண்டு என நான் நம்புகின்றேன். எனவே, உயிரிழந்த உறவுகளை நினைவுகூர்வதற்கு உரிய வகையில் ஒரு பொதுத்தூபி ஒன்றை அமைப்பதற்கும், அதற்கென ஒரு திகதியை குறித்தொதுக்குவதற்கும் இந்த அரசு நடவடிக்கை எடுப்பது அவசியமாகும். இதனை இந்த அரசு மேற்கொள்ளுமிடத்து, இந்த அரசு மீது எமது மக்களின் நம்பிக்கைகள் வலுப்பெறும் என்பதில் சந்தேகமில்லை.

கௌரவ சபாநாயகர் அவர்களே, யுத்தத்தால் கொல்லப் பட்ட உறவுகளை எமது மக்கள் நினைவுகூர்கின்ற விடய மானது, சில இனவாதிகளால் புலிகளை நினைவுகூர்வதாகச் சித்தரிக்கப்பட்டு, சிங்கள மக்கள் மத்தியில் இனவாதக் கருத்துக்கள் பரப்பப்பட்டு வருவதையும் இங்கு நான் சுட்டிக்காட்ட விரும்புகின்றேன். கொல்லப்பட்ட புலிகள் இயக்க உறுப்பினர்களை நினைவுகூர்வதற்காக புலிகள் இயக்கத்தினர் நவம்பர் மாதத்தில் 28ஆம் திகதியை ஒதுக்கியிருந்தனர்; அது வேறு. இங்கு நான், கடந்தகால யுத்தத்தின்போது உயிரிழந்த உறவுகளை எமது மக்கள் நினைவுகூரும் வகையில் மே மாதத்தில் ஒரு தினத்தையே குறித்தொதுக்கும்படியே கோருகின்றேன். அதுவும், யுத்தம் காரணமாக உயிரிழந்த எமது நாட்டின் அனைத்து மக்களையும் நினைவுகூரத்தக்க வகையிலேயே இது அமையவேண்டும் என்பதையும் இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன். எனது இந்தக் கோரிக்கையை எமது நாட்டிலே பெரும்பான்மையாக வாழ்ந்துவருகின்ற சிங்கள மக்களில் இனவாதமற்ற பெரும்பாலானவர்கள் ஏற்றுக்கொள்வார்கள் என்ற நம்பிக்கை எனக்கிருக்கிறது. இன்று கேப்பாப்புலவு மக்கள் தங்களது சொந்தக் காணி, நிலங்களை வேண்டி நடத்துகின்ற போராட் டத்தில் சிங்களச் சகோதரர்களும் பங்கேற்கிறார்கள்.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, you have two more minutes to speak.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
நன்றி!

காணாமற்போன தமது உறவுகளைக் கண்டறிவதற்காக எமது மக்கள் கிளிநொச்சியிலே மேற்கொண்டு வருகின்ற அறவழிப் போராட்டத்தில் தங்களது உறவுகள் காணமற்போன சிங்களச் சகோதரிகளும் பங்கெடுத்து வருகிறார்கள். முள்ளிவாய்க்கால் பகுதியில் இறுதியாக நடைபெற்ற யுத்தத்தில் உயிரிழந்த உறவுகளுக்கான நினைவேந்தும் நிகழ்வில் ஒரு பௌத்த தேரர் மனித நேயத்துடன் கலந்துகொள்கிறார். இத்தகையதொரு நிலைமாற்றுக் காலம் எமது நாட்டிலே இன்று ஏற்பட்டு வருகின்றது. இது மிகவும் வரவேற்கத்தக்கதொரு மாற்றமாகவே தெரிகின்றது.

கௌரவ சபாநாயகர் அவர்களே, தன்னைக் கொலை செய்ய வந்த தமிழ் இளைஞரையே மன்னிப்புக் கொடுத்து, விடுவித்த மனிதாபிமானம் கொண்டவர் ஜனாதிபதியாக இருக்கின்ற நாட்டில், எமது நாட்டில் யுத்தம் மிகக் கொடூரமாக நடைபெற்றுக்கொண்டிருந்த நிலையில், தனது உயிரையும் பொருட்படுத்தாது ஓமந்தைக்குப் போய் புலிகள் இயக்கத் துடன் சமாதான ஒப்பந்தம் செய்துகொண்ட மனிதாபிமான மிக்கவர் பிரதமராக இருக்கின்ற நாட்டில், எமது மக்களின் உணர்வுகள் மதிக்கப்படும் என்றே நான் நம்புகின்றேன். அந்த வகையிலேயே நான் இந்தத் தனிநபர் பிரேரணையை முன்வைத்துள்ளேன் என்பதை இங்கு தெரிவித்து, விடைபெறு கின்றேன்.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එම යෝජනාව කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙකු විසින් ස්ථිර කළ යුතුයි. Since there is no one to second this Motion, we have to move on to the next Motion.

යෝජනා අංක 5, පා.177/16, ගරු එම්. එච්. එම්. සල්මාන් මන්ත්‍රීතුමා - පැමිණ නැත.

යෝජනා අංක 6, පා.179/16, ගරු සිසිර ජයකොඩි මන්ත්‍රීතුමා.

## මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීම සඳහා අධිකාරියක් පිහිටුවීම
## போதைப் பொருட்களுக்கு அடிமையானவர்களுக்குப் புனர்வாழ்வளிப்பதற்கான அதிகாரசபையொன்றைத் தாபித்தல்
## ESTABLISHMENT OF AN AUTHORITY TO REHABILITATE THE DRUG ADDICTS

[පූ.භා. 11.13]

**ගරු සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> " මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහි වූ අති විශාල තරුණ පිරිසක් ඒවායින් අත්මිදීමට අපේක්ෂාවෙන් පසුවුවද, ඒ සඳහා නිශ්චිත වැඩපිළිවෙළක් හෝ ක්‍රමවේදයක් නොමැතිවීම ඔවුන් මුහුණ දෙන බරපතළ ගැටලුවක්ව ඇති බැවින්, ආගමික නායකයන්ගේ මූලිකත්වයෙන් බෞද්ධ අධ්‍යාත්මික භාවනා ක්‍රම, දේශීය ඖෂධ ක්‍රමයන් හා අනෙකුත් ප්‍රතිකර්ම ක්‍රම ද උපයෝගී කරගනිමින් මත්කුඩු හා මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීම සඳහා අධිකාරියක් පිහිටුවීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි"

ගරු කථානායකතුමනි, අපේ රටේ මත්කුඩු භාවිතයට ඇබ්බැහිවූවන්ගේ ප්‍රමාණය පසු ගිය දශක කිහිපය තුළ ශීඝ්‍රයෙන් වර්ධනය වෙලා තිබෙන බව අපි දන්නවා. මත්කුඩු භාවිතය නිසා මේ මුළු රටේම අපේ තරුණ පරම්පරාව, පාසල් දරුවන් සහ අපේ සමාජය බරපතළ ව්‍යාකූලතාවකට, අනතුරකට අද ලක්වෙමින් පවතිනවා. පොලිස් කූඩු, උසාවි, බන්ධනාගාර මත්කුඩු භාවිතයට ඇබ්බැහිවූවන්ගෙන් පිරී ඉතිරී ගොස් තිබෙනවා.

ගරු කථානායකතුමනි, නීතිඥවරයෙකු හැටියට මං පැලියගොඩ, කඩවත, මහර ප්‍රදේශවල සේවය කරද්දී දිනපතා හද කම්පාවන සිද්ධියක් දකිනවා. ඒ, තරුණයෝ විශාල පිරිසක් දම්වැල් දා ගෙන, මාංචු දාගෙන හැම දාම උදේට මහේස්ත්‍රාත් උසාවිවලට රැගෙන යාමයි. අපේ උසාවි අද මත්කුඩුවලට ඇබ්බැහි වෙච්ච අහිංසක තරුණයින්ගෙන් පිරී ඉතිරිලා තිබෙනවා. ඒ අහිංසක තරුණයින් චෝදනා ලබන, බන්ධනාගාර ගතවෙන පරිසරයකට අපේ රට පත් වෙලා තිබෙනවා. එම නිසා ඇතිවෙන බරපතළ සමාජ ප්‍රශ්න රාශියක් අපිට පෙනෙන්නට තිබෙනවා.

ගරු කථානායකතුමනි, විශේෂයෙන් අපේ රටේ මේ වන විට හෙරොයින් නැමැති මත්ද්‍රව්‍ය භාවිතය ඉතාම බරපතළ ලෙස වැඩි වී තිබෙනවා. 2015 වර්ෂය තුළ මත්ද්‍රව්‍ය ඇබ්බැහිවූවන්ගෙන් 82,482ක ප්‍රමාණයක් අත් අඩංගුවට ගැනීම් සිදු කර තිබෙනවා. එම නිසා අපේ රටේ මත්කුඩු සහ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන්ගේ තිබෙන බරපතළ සමාජ ප්‍රශ්නය, ඒ අත් අඩංගුවට ගත් ප්‍රමාණයෙන්ම පෙනෙනවා. හෙරොයින් භාවිතයට ඇබ්බැහිවූවන් එම ප්‍රමාණයෙන් සියයට 32ක් විතර වෙනවා. ලංකාවේ ඇස්තමේන්තුගත, හෙරොයින් නැමැති මත්කුඩු භාවිතය සිදු කරන තැනැත්තන් දළ වශයෙන් හතළිස්පන්දහසකට ආසන්න ප්‍රමාණයක් වෙනවා. එම නිසා ඉතාම භයානක තත්ත්වයකට, නරක තත්ත්වයකට අද මේ රට පත්ව තිබෙනවා. මේ දරුවන් අවසානයේ සමාජ විරෝධී ක්‍රියාකාරකම්වල නියැලෙන සමාජය තුළ සිදු වන මිනීමැරීම්, මංකොල්ලකෑම්, හොරකම්, ස්ත්‍රී දූෂණ හා ඉතාම බරපතළ අපරාධ කරන තැනැත්තන් බවට, විත්තිකරුවන් බවට පත්වනවා.

ගරු කථානායකතුමනි, මත්කුඩු භාවිතයට ඇබ්බැහි වූ තැනැත්තන් නිවැරදිව පුනරුත්ථාපනය කර සමාජ ගත කිරීමේ වැඩ පිළිවෙළක් අපේ රටට අවශ්‍ය වෙනවා. පළමුවෙන්ම එක පැත්තකින් අපේ රටට නිදහසේ මත්කුඩු, මත්ද්‍රව්‍ය පැමිණීම වැළැක්වීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙන්නට ඕනෑ. නිදහස් ආර්ථිකයත් එක්ක නිදහසේ හැම දෙයක්ම එනවා. එය බොහොම ස්වාභාවික දෙයක්. ගරු කථානායකතුමනි. ඉන්දියාව හා පාකිස්ථානය වැනි රටවල් හරහා මේ සඳහා මුහුදු මාර්ගය විවෘත වෙලා තිබෙනවා. එමඟින් මත්ද්‍රව්‍ය මේ රටට නිදහසේ ගෙන ඒමේ ඉඩකඩ වැඩි වෙලා තිබෙනවා. රුපියල් ශත ආර්ථිකය විසින් අපේ සමාජයේ සියලු ආධ්‍යාත්මික ගුණධර්ම තලා පොඩි පට්ටම් කර විනාශ කර, සුණු විසුණු කරලායි තිබෙන්නේ. එම නිසා ලාභය පදනම් කර ගත් මිනිස් ක්‍රියාකාරකම්වල අවසානයේ ගොදුරක් වෙන්නේ තමන්ගේ දරුවන් වෙන්නට පුළුවන්; තමන්ගේ නෑදෑයින්ම වෙන්න පුළුවන්. අවසානයේ විනාශ වෙන්නේ ඔවුන්මයි. මේ ලාභ පරමාර්ථ කරගත් සමාජය ඉදිරියට යාමත් සමඟ මේ භයානක විපත තව තව වැඩි වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, මේ මත් කුඩු නිදහසේ සංසරණය වීම හා මත් කුඩු මේ රටට පැමිණීම වැළැක්වීම සඳහා එක පැත්තකින් අපි අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වෙනවා. ඒ වාගේම මගේ යෝජනාව මත් ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීම වුණත්, මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වන ප්‍රමාණය අවම කර ගැනීමේ වැඩ පිළිවෙළක් පුනරුත්ථාපනයට පෙර පවත්වා ගත යුතු වෙනවා. පළමුවෙනි කාරණය, රටට මත් ද්‍රව්‍ය නිදහසේ ගලා ඒම නැවැත්වීමයි.

දෙවැනි කාරණය, මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වන, මත් කුඩුවලට ඇබ්බැහි වන තරුණයින් ප්‍රමාණය අවම කර ගැනීමයි. ඒ සඳහා වූ උත්සාහයක අපි නියැළෙන්න ඕනෑ. ඒ සඳහා අපේ ආධ්‍යාත්මික ඉගැන්වීම්, අපේ ආගමික ඉගැන්වීම්, අපේ මනස සහ හිත සංවර කර ගැනීමේ ක්‍රියාමාර්ග හා පෙරදිග අපේ රටවලට උරුම වුණු ආගමික චින්තන උපයෝගී කර ගැනීමේ හැකියාවක් තිබෙනවා.

මත් කුඩු භාවිතය නිසා ඇති වී තිබෙන සමාජ ව්‍යසන පිළිබඳව පාසල් දරුවන් ඉලක්ක කරගෙන සිදු කරන දැනුවත් කිරීමේ වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යාම අත්‍යවශ්‍ය කාරණයක් වෙනවා. පූර්ව පියවරක් වශයෙන් එවැනි සංවේදී වූ ක්‍රියාදාමයක් අනුගමනය කර එම දරුවන්ට මත් කුඩු භාවිතයට ඇබ්බැහිවූවන්ගේ අනාගතය පිළිබඳව ඇති බියකරු ස්වභාවය හෙළිදරව් කිරීමෙන් පමණයි අපිට මේ තත්ත්වය වළක්වා ගත හැකි වෙන්නේ. ඒ නිසා පළමුව රටට නිදහසේ මත්ද්‍රව්‍ය පැමිණීම වැළැක්වීමට, එම ජාවාරම නැවැත්වීමට, ඔවුන්ව අත් අඩංගුවට ගැනීමට, ඒ සම්බන්ධ නීති ප්‍රතිපාදන කටයුතු කිරීමට සහ ඒවා භාවිතයට හුරු වෙන පුද්ගලයින් එයින් වැළැක්වීම සඳහා වූ මූලික පියවර ගත යුතු වෙනවා. ඒ පියවරෙන් පසුව තමයි අපිට දැනට මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වුණු තැනැත්තන් පුනරුත්ථාපනය කිරීමේ වැඩ පිළිවෙළක් අවශ්‍ය වෙන්නේ.

ගරු කථානායකතුමනි, අපි දන්නවා අපේ රටේ මෙසේ පුනරුත්ථාපනය කිරීමේ වැඩ පිළිවෙළ දැනටමත් ක්‍රියාත්මක කෙරෙන බව. ඒ සඳහා ආයතන රාශියක් තිබෙනවා. හැබැයි, මේ ආයතනවලින් බොහොමයක් ඒවා මත් ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් අත් අඩංගුවට ගත්ත, ඒ වාගේම බන්ධනාගාරගත වුණු, දඬුවමට සහ දඩවලට ලක් වුණු තැනැත්තන් පුනරුත්ථාපනය කිරීම සඳහා මෙහෙය වන ආයතනයි. මත් කුඩු භාවිතය සිදුකරන තැනැත්තන්ට ඒ පාප කර්මයෙන් ගැලවීමේ සමාජ අවශ්‍යතාවක් තිබෙනවා.

එසේ ගැලවීමට අවශ්‍ය තැනැත්තෙකු එයින් මිදීම සඳහා අවශ්‍ය මඟ පෙන්වීම ලබාගන්න කවර ආයතනයකටද යන්නේ? ඔහු ඒ සඳහා කවර තැනක්ද තෝරා ගන්නේ? ඔවුන් සඳහා කවර පුනරුත්ථාපන වැඩ පිළිවෙළක්ද, අපේ රටේ තිබෙන්නේ?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)
ගරු කථානායකතුමනි, අපි දන්නවා මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ තැනැත්තන් පුනරුත්ථාපනය කිරීමේ හා ඔවුනට ප්‍රතිකාර කිරීමේ මධ්‍යස්ථාන අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය මඟින් පවත්වාගෙන යන බව. ඒ වාගේම අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයත්, බන්ධනාගාර දෙපාර්තමේන්තුවත් ඒකාබද්ධ වැඩ පිළිවෙළක් යටතේ පිහිටුවන ලද ආයතන තිබෙනවා. මීට අමතරව මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය සඳහා පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල්තුමා යටතේ ඉතාම උසස් කාර්යයක් මෑත කාලයේ ක්‍රියාත්මක කරනවා. කලින් එල්ටීටීඊ රැඳවියන් පුනරුත්ථාපනය කරපු ආයතනයේ අද මත් කුඩු භාවිතයට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය කිරීම සඳහා ඉතා ප්‍රශංසනීය වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙනවා. එහෙත් මත් ද්‍රව්‍ය භාවිතයට ගොදුරු වූ නමුත් බන්ධනාගාරගත නොවුණු තැනැත්තෙකුට, දඬුවමකට ලක් නොවුණ තැනැත්තෙකුට එයින් ගැලවීම සඳහා වූ සුදුසු අධිකාරියක් හෝ සුදුසු වැඩ පිළිවෙළක් හෝ අපේ රටේ නැහැ.

ගරු කථානායකතුමනි, මත් ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහි වූ අතිවිශාල තරුණ පිරිසක් ඒවායෙන් මිදීමට අපේක්ෂාවෙන් පසු වුවද ඒ සඳහා නිශ්චිත වැඩ පිළිවෙළක් හෝ ක්‍රමවේදයක් නොමැති වීම ඔවුන් මුහුණ දෙන බරපතළ ගැටලුවක්ව ඇති බැවින්, ආගමික නායකයන්ගේ මූලිකත්වයෙන් බෞද්ධ ආධ්‍යාත්මික භාවනා ක්‍රම,

[ගරු සිසිර ජයකොඩි මහතා]

දේශීය ඖෂධ ක්‍රම හා අනෙකුත් ප්‍රතිකර්ම ක්‍රම ද උපයෝගී කර ගනිමින් මත් කුඩු හා මත් ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහි වූ තැනැත්තන් පුනරුත්ථාපනය කිරීම සඳහා අධිකාරියක් ගොඩ නඟන්න ඕනෑ කියා මෙම ගරු සභාවට මම යෝජනා කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා.

මීළඟට යෝජනාව ස්ථිර කිරීම, ගරු ශ්‍රියානි විජේවික්‍රම මන්ත්‍රීතුමිය.

[පූ.භා. 11.23]

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
ගරු කථානායකතුමනි, මත් ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය කිරීම සඳහා අධිකාරියක් හෝ ආයතනයක් විශේෂයෙන් පිහිටුවිය යුතුය යන මේ යෝජනාව මා මේ අවස්ථාවේදී ස්ථිර කරමින් ඒ සම්බන්ධයෙන් වචන කීපයක් ඉදිරිපත් කරන්න අවසර ඉල්ලා සිටිනවා. මේ යෝජනාව ඉදිරිපත් කළ අපේ ගරු සිසිර ජයකොඩි මන්ත්‍රීතුමා කියපු කාරණාවලට අමතරව කරුණු කීපයක් ඉදිරිපත් කිරීමට මම බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන් පසු ගිය කාල සීමාවේ මත් ද්‍රව්‍ය ජාවාරමේ පැවැති උච්චතම අවස්ථා අපි දැක්කා. ඉතා ශ්‍රේෂ්ඨ විනිශ්චයකාරවරයකුව සිටි සරත් අඹේපිටිය මැතිතුමාගේ ජීවිතය අහිමි කරන්න කුඩු ජාවාරම්කරුවන් ක්‍රියා කළා. ඒ වාගේමයි පසු ගිය දිනවල පිළියන්දලදී වූ සිද්ධිය.

පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශයේ -Police Narcotic Bureau- නිලධාරින් වාගේම අහිංසක කුඩා දරුවනුත් ඒ බිල්ලට හසු වුණා. එක් පැත්තකින් මත් ද්‍රව්‍ය ජාවාරම්කරුවන් මේ විධියට ජීවිත නැති කරමින් කටයුතු කරනවා වාගේම, අනික් පැත්තෙන් මත් ද්‍රව්‍ය භාවිත කරන්නට මුළු සමාජයම ඇබ්බැහි කරලා සමාජයීය වශයෙන් විශාල විනාශයක් මේ වන විට මේ රට තුළ සිදු කරනවා. ඒ නිසා අද වනකොට මෙය ජාතික ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙන කාරණයක්, ගරු කථානායකතුමනි.

සිසිර ජයකොඩි මන්ත්‍රීතුමා කිව්වා වාගේ මත් ද්‍රව්‍ය සම්බන්ධයෙන් අද වැඩිපුරම උසාවියට අරගෙන එන්නේ තරුණ අය. ළමයින් සම්බන්ධ කාරණයකදී නම්, එය මහෙස්ත්‍රාත් අධිකරණයකට ඉදිරිපත් කරනවා. අධිකරණයට බලයක් තිබෙනවා, ළමයින් සම්බන්ධයෙන් විශේෂයෙන් ක්‍රියා කරන්නට. ඒ ළමයින් සම්බන්ධයෙන් තීරණයක් දෙන්නට උපරිම භාරකරු විධියට දිසා අධිකරණයක විනිශ්චයකාරවරයෙකුට බලයක් තිබෙනවා. නමුත්, මේ තරුණයන් සම්බන්ධයෙන් ඊට එහා ගිය කටයුත්තක් කළ යුතුව ඇති බවට නීතිඥවරියක විධියටත්, දේශපාලනඥවරියක විධියටත් මට හැඟෙනවා, ගරු කථානායකතුමනි. වයස අවුරුදු 18 ඉක්ම ගියාට ගියාට පස්සේ ඒ ළමයා තව දුරටත් 'ළමයෙකු' කියන තැනට වැටෙන්නේ නැහැ. නමුත්, ඒ තරුණයා සම්බන්ධයෙනුත් ළමයෙකු ගැන බලනවා වාගේම දිසා අධිකරණයට, මහෙස්ත්‍රාත් අධිකරණයට බලන්න පුළුවන්. ළමයින් ඉදිරිපත් කරන්නේ ඒ අධිකරණවලට. ඒ අධිකරණවල විනිශ්චයකාරවරුන්ටත් මේ අය පුනරුත්ථාපනය කිරීම සම්බන්ධයෙන් වූ නියෝග දීමේ ඉඩ ප්‍රස්ථාව ලබා දීමට මේ රට තුළ තිබෙන නීතියත් වෙනස් කරන්න ඕනෑ. ඒක මම දකින කාරණයක්. මොකද, මේ ළමයින් බලෙන් හෝ පුනරුත්ථාපනය සඳහා යවන්නට පුළුවන්කමක් තිබෙන්න ඕනෑ. මේ වනකොට හෙරොයින් සහ ගංජා කියන මත් ද්‍රව්‍ය දෙක විෂ මත්පැන්වලට අමතරව බහුල වශයෙන් මේ රට තුළ භාවිත වනවා. විශේෂයෙන්ම හෙරොයින් නිසා කොපමණ විපත් වනවාද කියන එක මේ සමාජයේ සිටින සියලු දෙනාම දන්නා කාරණයක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට තව විනාඩි දෙකක් තිබෙනවා.

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
හොඳයි, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමනි, ගංජාවලින් ඊටත් එහා ගිය විනාශයක් වෙමින් පවතිනවා. මේ වනකොට ලංකාවේ වියළි කලාපයේ ඕනෑම දුෂ්කර තැනක වැවෙන ශාකයක් ලෙස ගංජා ශාකය හඳුන්වන්න පුළුවන්.

අද මේ වනකොට ඉන්දියාවේ කේරළ ගංජා ලංකාවේ හැම පළාතකම තිබෙනවා. අම්පාර දිස්ත්‍රික්කයේ හැම තැනටම දැන් ඉන්දියාවේ කේරළ ගංජා ඇවිල්ලා තිබෙනවා. මේ විෂ මත් ද්‍රව්‍ය ඉන්දියාව හා පාකිස්තානය වැනි රටවල සිට බෝට්ටු යොදාගෙන මුහුදු මාර්ග ඔස්සේ හොර රහසේ අපේ රටට ගෙනෙනවා. මෙලෙස හොර රහසේ අපේ රටට ගෙන එන විෂ මත් ද්‍රව්‍ය වටලන්නටත් විශේෂයෙන් අපි කටයුතු කළ යුතුයි. පසු ගිය දිනවල ශ්‍රී ලංකා රේගුවෙන් විශාල වශයෙන් මත් ද්‍රව්‍ය වැටලීම් කරනවා අපි දැක්කා. මුහුදු මාර්ග ඔස්සේ බෝට්ටුවලින් මේ විෂ මත් ද්‍රව්‍ය අපේ රටට ගෙන ඒම වළක්වා ගන්න අපි කටයුතු කළ යුතුයි. ඒ වැටලීම් කරලා විෂ මත් ද්‍රව්‍ය අපේ රටට ගෙන එන අය අත් අඩංගුවට ගැනීමටත් අපි කටයුතු කළ යුතු වනවා. අපේ රටේ ජාතික ප්‍රශ්නයක් බවට අද මේ මත් ද්‍රව්‍ය උවදුර පත් වෙමින් තිබෙනවා. මත් ද්‍රව්‍ය භාවිතය නිසා තරුණ පරම්පරාව විනාශ වනවා කියන්නේ මේ රටේ අනාගතය විනාශ වනවාය කියන එකයි. මේ රටේ අනාගතය බාර ගන්න ඉන්න ඒ තරුණ පරම්පරාව බේරා ගන්නට ශ්‍රී ලාංකික ජාතියක් වශයෙන් අපි එකතු වෙලා කටයුතු කළ යුතුයි කියන යෝජනාව කරමින් මා නිහඬ වනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමියනි.

මීළඟට, ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මන්ත්‍රීතුමා.

Order, please! ඊට පෙර ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කථානායකතුම [ගරු තිලංග සුමතිපාල මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு திலங்க சுமதிபால ] தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. SPEAKER *left the Chair, and* MR. DEPUTY SPEAKER [THE HON. THILANGA SUMATHIPALA] *took the Chair.*

[පූ.භා. 11.29]

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට කථා කරන්න අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මා පළමුවෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වනවා. අපේ සිසිර ජයකොඩි මන්ත්‍රීතුමා ගෙනා "මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීම සඳහා අධිකාරියක් පිහිටුවීම" කියන පෞද්ගලික මන්ත්‍රී යෝජනාව සම්බන්ධයෙන් වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලැබීම සතුටට කාරණයක්.

රටේ මූලා කළමනාකරණය කරනවා වාගේම, නීති සම්පාදනය කරන්න පුළුවන් උත්තරීතර ස්ථානය මේ පාර්ලිමේන්තුවයි. ඊට අමතරව අපි මොන තරම් යෝජනා පාර්ලිමේන්තුවට ගෙනාවත්, අද සිසිර ජයකොඩි මන්ත්‍රීතුමා ගෙනා මේ යෝජනාව ඒ හැම යෝජනාවකටම වඩා වැදගත් යෝජනාවක් බව මා මේ අවස්ථාවේදී කියන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වකවානුවේ තිබුණු නිදහස් වෙළෙඳ ආර්ථික ක්‍රමයත් එක්ක මේ මත් ද්‍රව්‍ය උවදුර අප රට තුළට ආපු ව්‍යසනයක් බව අපි දන්නවා. 1977න් පස්සේ ආපු සියලු ව්‍යසන අතරින් මත් ද්‍රව්‍ය ව්‍යසනය ගත්තොත්, අද කොළඹ ප්‍රදේශය විතරක් නොවෙයි, මුළු ලංකාවම මේ මත් ද්‍රව්‍ය ව්‍යසනයෙන් වෙළාගෙන තිබෙනවා.

විශේෂයෙන්ම කුඩා පාසල් දරුවන් මත් ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි කර ගන්නා වටපිටාවක් නිර්මාණ වෙලා තිබෙන බව අපි දැකලා තිබෙනවා. හෙරොයින්, ගංජා, මත් පෙති ආදී මේ රටට ඇතුළු වන නොයෙකුත් තාලයේ මත් ද්‍රව්‍ය නිසා මේ වන විට ලොකු ව්‍යසනයක් ඇති වෙලා තිබෙනවා. කොළඹ දිස්ත්‍රික්කයට පසුව මත් ද්‍රව්‍ය නමැති රාක්ෂයා ඊළඟට ඩැහැ ගත්ත දිස්ත්‍රික්කය තමයි ගම්පහ දිස්ත්‍රික්කය. මේ වන විට, සංචාරක කර්මාන්තයත් එක්ක විශාල වශයෙන් මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වුණු පුද්ගලයන් ඉන්නවා. ඒ සමහරු මං මාවත්වල ගමන් කරද්දී පෙනෙන්නේ ඇවිදින ඇට සැකිලි වාගේයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මත් ද්‍රව්‍ය පාවිච්චි කරපු පුද්ගලයාට විතරක් නොවෙයි එහි ආදීනව විඳින්න සිදු වන්නේ. පළමු වසර 2, 3, 4, 5 යනකල් ඒ පුද්ගලයා එහි ආදීනව විඳියි. ඊට පසුව ඒ පුද්ගලයාගේ නිවසේ අයටත් එහි ආදීනව විඳීමට සිද්ධ වෙනවා. ඊට පසුව වටපිටාවේ ඉන්න අයටත් එහි ආදීනව විඳීමට සිද්ධ වෙනවා. ඊට පසුව තවත් අය මත් ද්‍රව්‍යවලට ගොදුරු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මත් ද්‍රව්‍ය පිළිබඳව පාර්ලිමේන්තුවේදී කථා කරනකොට කියන්න තිබෙන කනගාටුදායකම කාරණය තමයි "මත් ද්‍රව්‍ය" සමඟ දේශපාලනඥයන්ගේ නම් ඈඳී තිබීම. අද වන විට දේශපාලනඥයන් ගණනාවක් "කුඩු" ඉස්සරහට දමාගෙන දේශපාලනය කරන බවට චෝදනා ලබා තිබෙනවා. ඒ නිසා මේ ඉදිරිපත් කරන පෞද්ගලික මන්ත්‍රී යෝජනා හරියාකාරව අධ්‍යයනය කරලා බලලා, මේ මත් උවදුර නවත්වන්න දැඩි නීති රීති පනවන්න කියලායි අපි ඉල්ලන්නේ. අපි අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගැන කථා කරනවා; ආගමික සංහිඳියාව ගැන කථා කරනවා; අනෙකුත් නීති - රීති ගැන කථා කරනවා; කැළි කසළ ගැන කථා කරනවා. එවැනි නොයෙකුත් කාරණා ගැන විශාල වශයෙන් කථා කරනවා. හැබැයි, මේ ව්‍යසනය නවත්වා ගත්තේ නැත්නම් සමහර විට තව ටික කාලයකින් අපට මේ පාර්ලිමේන්තුවට එන්න වෙන්නේත්, හෙරොයින්, ගංජා, කුඩු කාරයොත් එක්ක තමයි. එහෙම පුද්ගලයන් බිහි වෙයි. මිනිස්සු ඒවාට ඇබ්බැහි වෙයි. ඒ නිසා මේ ව්‍යසනය නවත්වන්න නීති හදනවා වාගේම ඒ නීතිවලට අනුව කටයුතු කරන්න ඕනෑ. විශේෂයෙන් පසු ගිය ආණ්ඩුවට චෝදනා කළා, කුඩුකාරයෝ, එතනෝල්කාරයෝ ඉන්න ආණ්ඩුවක් කියලා. නමුත් මේ ආණ්ඩුව බලයට පත් වෙලා දැනට අවුරුදු දෙකහමාරක් වෙනවා. ඒ අවුරුදු දෙකහමාර තුළත් කුඩුකාරයෝ, මත් ද්‍රව්‍ය ව්‍යාපාරිකයෝ වැඩි වෙලා මිසක් අඩු වෙලා නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ මිනිස්සු විශාල වශයෙන් මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙලා තිබුණත්, ඒ අය පුනරුත්ථාපනය කිරීම සඳහා ආයතන හතරකට-පහකට වඩා කටයුතු කරන්නේ නැහැ. ඒ නිසා පුනරුත්ථාපන කාර්යය සඳහා මීට වඩා වැඩි ආයතන සංඛ්‍යාවක් අවශ්‍ය වෙනවා. ඒ වාගේම, පුනරුත්ථාපනය කිරීමට කලින් දැඩි නීති - රීති පැනවීමත් අවශ්‍ය වෙනවා.

ඊයේ-පෙරේදා අපි දැක්කා, අහිංසක පාසල් දරුවෙක් මත් ද්‍රව්‍ය ජාවාරම්කරුවෙකුගේ වෙඩි ප්‍රහාරයකට ගොදුරු වුණ හැටි. ඒ වාගේම, අපි දැක්කා ඔවුන්ට නිලධාරින් ගොදුරු වූ හැටි. මේ ව්‍යසනයෙන් රට වෙළිලා ඉන්න වෙලාවක අනාගත පරපුර රැක ගන්න, අනාගත පරපුර ආරක්ෂා කර ගන්න අවශ්‍ය නීති සම්පාදනය කරලා, -මේ පාර්ලිමේන්තුවට ඒ නීති ගෙනැල්ලා- ඒ තුළින් මේ කටයුතු දැඩි ලෙස මර්දනය කරන්න කටයුතු කළ යුතුයි කියා මා යෝජනා කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 11.34]

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ගරු සිසිර ජයකොඩි මැතිතුමා මත් ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීම සඳහා අධිකාරියක් පිහිටුවීම කළ යුතුයි කියා ගෙන එන ලද යෝජනාව කාලීන යෝජනාවක්. සුන්දර කථා කියන, සුන්දර ලෝක මවන, වේදිකාවේ ඉඳගෙන මිනිසුන් සනසන්න කථා කරන්න දක්ෂ පාලකයෝ අපේ රටේ තරම් වෙන කොහේවත් නැහැ. මැතිවරණ කාලවලදී හැම පක්ෂයකින්ම ඉදිරිපත් කරන මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශනවල තිබෙන සුරංගනා ලෝකයේ කිමිදිලා, අවුරුදු පහකට පස්සේ එකෙන් එළියට ඇවිත් බැලුවාම, ඒ මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශවල කියපු සුරංගනා කථාවලින් සියයට 10ක්වත් ඉෂ්ටවෙලා තිබෙනවාද කියන ගැටලුව අපට තිබෙනවා. මත් ද්‍රව්‍ය නැති කරනවාය කියන ජනප්‍රිය මාතෘකාවත් ඒ ආකාරයේම වැඩක් තමයි.

විශේෂයෙන්ම අපේ මැතිවරණ කොට්ඨාසය වන කොළොන්නාව ගත්තාම, මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් ඉතාම ප්‍රචලිත ප්‍රදේශයක්. වැල්ලම්පිටිය පොලිස් වසම තුළ පමණක් මත් ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් හත්දහසකට ආසන්න පිරිසක් ඉන්නවා. ඒ කියන්නේ, ඒ ජනගහනයෙන් සියයට 4කට ආසන්න පිරිසක් හෝ ඊට වැඩි පිරිසක් මත් ද්‍රව්‍යවලට ඇබ්බැහිවෙලා සිටිනවා. වර්තමාන රජය පැමිණි අලුත ඒ පළාත නියෝජනය කළ

[ගරු එස්. එම්. මරික්කාර් මහතා]

මන්ත්‍රීවරයාට විරුද්ධව මත්ද්‍රව්‍ය සම්බන්ධ චෝදනා තිබුණා. "වෙලේසුදා" වැනි ප්‍රසිද්ධ ජාවාරම්කරුවන් සමඟ සම්බන්ධ වුණාය කියලා උසාවිවලදී කරුණු කියැවුණා. ඒ වාගේම, ඔහු අර ප්‍රසිද්ධ ඝාතනය සම්බන්ධයෙන් චෝදනා ලබලා හැංගිලා ඉන්න කාලයේ කොළොන්නාවේ මත්ද්‍රව්‍ය භාවිතය විශාල වශයෙන් අඩුවෙලා තිබුණා. වර්තමාන රජය පැමිණි පසුව විශේෂ කාර්ය බළකාය යොදවලා මත්ද්‍රව්‍ය ඇල්ලුවා; මත්ද්‍රව්‍ය ජාවාරම්කාරයෝ ඇල්ලුවා. ඒ නිසා මත්ද්‍රව්‍ය හිඟ වුණා. රුපියල් 500ට තිබුණු කුඩු පැකට් එක රුපියල් 2,000ට ගියා. නමුත් අපි ඇත්ත කියන්න ඕනෑ. අද වන විට ඒක නැවත රුපියල් 1,000ට පමණ අඩුවෙලා තිබෙනවා. ඒ කියන්නේ ආයෙත් "බඩු" තිබෙනවා කියන එකයි. එතකොට, මේකට වරදකාරයෝ කවුද කියලා කණ්ණාඩියක් ඉදිරියට ගිහින් බැලුවාම පෙනෙනවා. කෙසේ වෙතත්, මේ ප්‍රශ්නය විසඳන්නට විධිමත් වැඩ පිළිවෙළක් අපේ රට තුළ නැහැයි කියන එක තමයි මගේ මතය. විශේෂයෙන්ම නීතිය මඟින් මත් ද්‍රව්‍ය පාලනය කිරීම සහ මේ ජාවාරම්කරුවන් ඇල්ලීම අත්‍යවශ්‍යයි.

මත් ද්‍රව්‍ය සඳහා ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීම සඳහා නිසි වැඩ පිළිවෙළක් අපේ රටේ නැහැ කියන එක තමයි මගේ අදහස. ඊළඟට, අනාගතයේ දී මේ සඳහා අබ්බැහි වෙන්න - ගොදුරක් බවට පත් වෙන්න- ඉන්න දරු පරම්පරාව බේරා ගැනීම සඳහා නිසි වැඩ පිළිවෙළක් නැහැ. ඇත්ත වශයෙන්ම අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය කියලා එකක් තිබෙනවා. එම අධිකාරියෙන් යම් කිසි වැඩක් කෙරෙනවා ඇති. නමුත්, මේ පිළිබඳව සක්‍රිය වැඩ පිළිවෙළක් දීප ව්‍යාප්ත මට්ටමින් සිදු කෙරෙනවාද; ඔවුන්ට ඒ සඳහා බලයක් තිබෙනවාද; ඔවුන්ට ඒ සඳහා ප්‍රතිපාදන තිබෙනවාද; පහසුකම් තිබෙනවාද කියන ගැටලුව අපට තිබෙනවා. මේ සම්බන්ධයෙන් විවිධ ගැටලු තිබෙනවා අප දැකලා තිබෙනවා.

ඒඩ්ස් රෝගය සම්බන්ධව; එහෙම නැත්නම් මත් ද්‍රව්‍ය සම්බන්ධව, එහෙම නැත්නම් වෙනත් නීති විරෝධී දේවල් සම්බන්ධව විවිධ රාජ්‍ය නොවන ආයතන වැඩමුළු පවත්වන්නේ සුඛෝපභෝගී හෝටල්වල. බිම් මට්ටමට ගිහින්, බිම් මට්ටමේ සිටින target crowd එක වෙනුවෙන් වැඩ කටයුතු කරනවාද කියන ගැටලුව තිබෙනවා. විශේෂයෙන්ම අද අපේ රටේ පොලීසිය මේ සම්බන්ධව දක්වන උනන්දුව ඉතාම මන්දගාමී බව පැහැදිලිව කියන්නට ඕනෑ. මාධ්‍ය හමුවීම් පවත්වනවා. මාධ්‍ය හමුවලට ඇවිත් පොලීසිය ලොකු කථා කියනවා. නමුත්, ඔවුන්ට මත්ද්‍රව්‍ය පාලනය කිරීම සඳහා අඛණ්ඩ සහ නිශ්චිත වැඩ පිළිවෙළක් නැහැ කියන එක අපි පැහැදිලිව කියන්නට ඕනෑ.

ඇක්ටන් සාමිවරයා කියලා තිබෙනවා, " බලය දූෂණයට මඟ පාදයි" කියලා. වැඩිපුර බලය, වැඩිපුර දූෂණයට මඟ පාදන බව කියනවා. මේ යථාර්ථය නිලධාරීන් සහ දේශපාලනඥයන් යන දෙගොල්ලන්ටම පොදුයි. යම් කිසි පොලිස් ස්ථානයක් ගත්තොත්, ස්ථානාධිපතිවරයාගේ සිට බිම් මට්ටම දක්වා සියලු නිලධාරීන් මේ සඳහා දායකත්වය ලබා දෙනවාද, එහෙම නැත්නම් මේ සඳහා මැදිහත් වෙන රාජ්‍ය ආයතන ඔවුන්ගේ කාර්ය භාරය සියයට සියයක් ඉෂ්ට කරනවාද කියන ගැටලුව තිබෙනවා. ඒක එසේ වුණත්, නොවුණත් යම් කිසි පිරිසක් නීතියෙන් පාලනය කරද්දී, අනෙක් කොටස පුනරුත්ථාපනය කිරීම සඳහා අධිකාරියක් හෝ නිශ්චිත රාජ්‍ය මට්ටමේ වැඩ පිළිවෙළක් නැති එක ගැන අපි කනගාටු වෙන්න ඕනෑ. ජනාධිපති කාර්ය සාධන බලකාය පත් කරලා තිබෙනවා. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය තිබෙනවා. නමුත්, ප්‍රශ්නය තවමත් එතැනමයි; ගැටලුව තවමත් එහෙමමයි. මත් ද්‍රව්‍යවලට ඇබ්බැහිවන්නන්ගේ ප්‍රමාණය වැඩිවීම පිළිබඳව නිසි වැඩ පිළිවෙළක් නැහැ. සමහර ප්‍රදේශවල හෙරොයින් පාලනය වෙනකොට, හෙරොයින් භාවිතය අඩු වෙනකොට අනෙක් පැත්තෙන් කේරළ ගංජා වැඩි වෙනවා; එහෙම නැත්නම් මත් පෙති වැඩි වෙනවා; එහෙම නැත්නම් හෂීස් වැඩි වෙනවා. ඒක අපට පැහැදිලියි. කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ මම මේ යථාර්ථය දකිනවා.

ගරු සිසිර ජයකොඩි මන්ත්‍රීතුමාගේ යෝජනාවට මම තව යෝජනාවක් එකතු කරන්න කැමැතියි. වර්තමාන ආණ්ඩුව යටතේ මේක කරන්න පුළුවන් වෙන්න ඕනෑ. මොකද, එතනෝල්කාරයෝ, කුඩුකාරයෝ, ගංජාකාරයෝ කියලා පසු ගිය ආණ්ඩුවේ සිටි සමහර අයට විවිධ චෝදනා නැඟුණා. ඒ චෝදනාවලට ලක් වූ අයගෙන් සමහර අය දැන් මේ ආණ්ඩුවට ජැක් ගහගෙන ඉන්නවා. ඒ චෝදනා ලබපු, මේ ආණ්ඩුවේ ඇමතිකම් දරන අයත් ඉන්නවා. නමුත් වර්තමාන යහපාලන රජය මැතිවරණයේ දී ලබා දුන් පොරොන්දු අනුව නිශ්චිත දින වකවානු සහිත අඛණ්ඩ වැඩ පිළිවෙළක් නීතිය ක්‍රියාත්මක කිරීම පැත්තෙන් ඇති කළ යුතුයි. ඒ වාගේම අනෙක් පැත්තෙන් මේ මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීම සඳහා නිසි බලයක් තිබෙන නිසි ආයතනයක් පිහිටුවිය යුතුයි.

ඇමතිවරුන්ට නිවාස අලුත්වැඩියා කරන්නත්, වාහන ගන්නත් පරිපූරක ඇස්තමේන්තුවක් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් වුණා. අපි ඒවා කරන්න එපා කියලා කියන්නේ නැහැ. නමුත් ප්‍රමුඛ අවශ්‍යතාව ඒකද? මේ මොහොතේ දී අපි මුදල් ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, ඒවාට මුදල් වෙන් කරනවා වාගේ මේ මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීම වෙනුවෙන් විශාල වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම සඳහාත් මෙවර අය වැයෙන් මුදල් ප්‍රමාණයක් වෙන් කරන්න කියලා. අපි අධ්‍යාපනයට බිලියන 85ක් වෙන් කරනවා. සියයට 5ක් අය වැයෙන් වෙන් කරන්න යෝජනා කරනවා. අධ්‍යාපනය සඳහා භෞතික සම්පත් ලබා දෙන්න යෝජනා කරනවා. ඒක ඉතාම හොඳයි. හැබැයි, අද සමහර පාසල්වල මත් කුඩුවලට ඇබ්බැහි වුණු දරුවන් ඉන්නවා. ඔවුන් පාසලේ විවේක කාලයෙන් පස්සේ උගන්වන තරුණ ගුරුවරියන් දිහා බලාගෙන ඉන්නේ අමුතුම විධියකට. ඒක නිසා සමහර ප්‍රදේශවල පාසල්වලට ගුරුවරියන් පත්වීම අරගෙන යන්න කැමැති නැහැ. ආපු අයත් ඉක්මනින් මාරුවීමක් හදාගෙන ආපසු යනවා. ඒ නිසා අධ්‍යාපනය පිළිබඳව අවධානය යොමු කරනවා වාගේම අනාගතයේ දී අපේ තරුණ පරම්පරාව -ඉස්කෝලේ යන දරු පරම්පරාව- මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීම වළක්වා ගැනීම සඳහාත් යම් වැඩ පිළිවෙළක් හදන්න ඕනෑය කියන එකයි මගේ විශ්වාසය.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවසාන වශයෙන් මේ පිළිබඳවත් කියන්නට ඕනෑ. මේ සඳහන් කරන කාරණා තුනම එකට එකතු වෙන්න ඕනෑ. එනම්, පරිපූරක ඇස්තමේන්තුවලින් වෙන් කරන මුදල්වලින් කොටසක් මේ යෝජනා කරන අධිකාරිය පිහිටුවීම සඳහා යොදවන්නට ඕනෑ, නීතිය ක්‍රියාත්මක කිරීම සිදු වෙන්නට ඕනෑ, අනෙක් පැත්තෙන් පාසල් දරුවන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙන එක නවත්වන්න ඕනෑ. මේ කාරණා තුනම ඇතුළත් එක වැඩපිළිවෙළක් හදලා ක්‍රියාත්මක කරන්න ඕනෑ කියලා අපි විශ්වාස කරනවා. අනෙක් දේවල් වාගේ මේකත් මන්දගාමී වැඩසටහනක් කරන්නේ නැතුව; ඔහේ යන වැඩසටහනක් කරන්නේ නැතුව, මේ සඳහා රජය මැදිහත් වෙලා විධිමත් සැලැස්මක් සකස් කරන්න කියලා රජයෙන් ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[පූ.භා. 11.41]

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින මෙවැනි යෝජනාවක් ඉදිරිපත් කිරීම ගැන මම ගොඩක් සතුටු වෙනවා. අද උදේ වරුවේ ඉඳලාම ඉදිරිපත් කර තිබෙන යෝජනා කිහිපයක් යටතේ, විශේෂයෙන්ම රටේ කොඳුනාරටිය වන් තරුණ පෙළ පීඩාවට පත් වෙලා තිබෙන විවිධ ප්‍රශ්න සම්බන්ධයෙන් කථා කළා. විශේෂයෙන්ම සිසිර ජයකොඩි මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාවත්, හේෂාන් විතානගේ මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාවත් වර්තමානයේ කථා කළ යුතුම කාරණා දෙකක් කියලා මම හිතනවා. අපේ තරුණ පෙළ රටේ ආර්ථිකයට දායක කර ගන්න ඕනෑ. නමුත් නිදහසින් පසුව බිහි වූ කිසිම රජයක්, අපේ රටේ තරුණ පෙළ අපේ රටේ ආර්ථිකයට දායක කර ගන්නා තැනට පෙළ ගස්සවා තිබෙනවාද කියන ගැටලුව අපට තිබෙනවා. අද අපේ ගම්වල ඉන්න උපාධිධාරී තරුණ, තරුණියන්ට තමන්ගේ උපාධි සහතිකයත් අරගෙන රැකියාවක් ලබා ගැනීම සඳහා දේශපාලනඥයන් පසු පස යන්නට සිදු වෙලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, උපාධි සහතිකයත් තියාගෙන රැකියාවක් නොමැතිව ගෙදර ඉන්නට සිදුවීම නිසා ඔවුන් මානසිකව වැටිලා ඉන්නවා. එවැනි තත්ත්වයක සිටින ඔවුන්ට කාලය ගෙවලා ගෙවලා, අන්තිමට රැකියාවක් සඳහා අයදුම් කළාම නැවත වතාවක් විභාගයකට මුහුණ දෙන්න සිද්ධ වෙන අවස්ථා තිබෙනවා. මේ තරුණ දරුවන්ගේ තරුණ කාලය three-wheelers ඇතුළේ, එහෙම නැත්නම් බෝක්කු උඩ ගෙවන කොට තමන්ට ඇති වන මානසික පීඩාව නිසාම ඒ අය මත් ද්‍රව්‍යවලට සහ නොයෙකුත් අයථා දේවල්වලට යොමු වෙනවා. එම නිසා තරුණ දරුවන් සම්බන්ධයෙන් අප මීට වඩා සැලකිලිමත් විය යුතුය කියන කාරණය මා මතක් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාසල් ගුරුවරියක් විධියට මමත් දැකපු දෙයක් තමයි, අපේ ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමාත් කියපු ආකාරයට පාසල් විවේක කාලයෙන් පසුව බොහෝ පාසල්වල හවස් වරුවේ ළමයින්ට උගන්වා ගන්න අමාරුයි කියන කාරණය. විශේෂයෙන් ගුරු මහත්මීන්ට එය අපහසුයි. ඒක ඇත්ත කථාවක්. ඒ වාගේම ගුරු මහත්වරුන්ටත් ඒ කාර්ය කරගෙන යන්න අමාරුයි. මොකද, දරුවෝ පියවි සිහියෙන් නැහැ. විශේෂයෙන්ම මාවා, තුල් වැනි හඳුනාගත් මත් ද්‍රව්‍යයන් පාසල් තුළ විශාල වශයෙන් භුවමාරු වෙනවා. ඒ සඳහා තැරැව්කරුවන් ඉන්නවා. මේ දේවල් වැළැක්වීම සඳහා විශේෂ වැඩ පිළිවෙළවල් සකස් කරන්න කියා මම රජයෙන් ඉල්ලා සිටිනවා.

අනෙක් කාරණය තමයි මත්පැන් භාවිතය. උසස් පෙළ පන්තිවල දරුවන් විතරක් නොවෙයි, යන්තම් වයස අවුරුදු 14 පසු කළ දරුවන් පවා නිකම් අත්හදා බැලීමක් වශයෙන් මේ දේවල් කරලා ලොකු ව්‍යසනයන්ට ගොදුරු වන ආකාරය අප දකිනවා. අද ළමයින්ට ගෙවල් ඇතුළේ ඉගෙන ගන්න තිබෙන පරිසරය නැතිවෙමින් තිබෙනවා. දෙමව්පියන් -විශේෂයෙන්ම පියවරුන්- ගෙවල්වල මත් ද්‍රව්‍ය භාවිත කිරීමෙන් ඒ පවුල තුළ සාමය සමගිය නැති වෙලා, දරුවන්ගේ මානසිකත්වය විනාශ වෙලා යනවා.

ගරු සිසිර ජයකොඩි මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාව ඉතාම වැදගත් එකක්. මත් ද්‍රව්‍ය භාවිත කළ අය පුනරුත්ථාපනය කිරීම සඳහා යම් වැඩ පිළිවෙළක් තිබිය යුතුයි. අද අපේ තරුණ පරම්පරාව බිලිගන්න මත් ද්‍රව්‍ය වෙළෙඳාමේ යෙදෙන බොහෝ පිරිසක් ඉන්නවා. මේ වනකොට ඇත පිටිසර ගම් දක්වා මේ මත් ද්‍රව්‍ය භාවිතය සුළු වශයෙන් හෝ පැතිර ගිහින් තිබෙනවා. අද තරුණ අය විලාසිතාවක් විධියට මත් ද්‍රව්‍ය භාවිත කරනවා.

මත්ද්‍රව්‍ය වෙළඳාමට විශේෂ වැට බැඳීමක් කිරීම කාලීන අවශ්‍යතාවක් බව පෙන්වා දෙමින් නැවත වතාවක් උපාධිධාරීන් සම්බන්ධයෙනුත් මා වචන කිහිපයක් කථා කරන්න කැමැතියි. මීට පෙර කිව්ව විධියට මේ රටේ අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයෙන් සියයට 4යි විශ්වවිද්‍යාලයට තේරෙන්නේ. සියයට 94ක් ගෙදර ඉන්නවා. එතකොට මේ උසස් අධ්‍යාපනය සකස් වෙලා තිබෙන්නේ මේ සියයට 4 වෙනුවෙන් පමණයි කියන එක මා මේ වෙලාවේ මතක් කරනවා. එහෙම නම් සමාජ ශෝධනයක් සිද්ධ වෙන්න ඕනෑ. අධ්‍යාපන ක්‍රමයේ ඉඳලා වෙනස් වෙන්න ඕනෑ. තරුණ දරුවන් මානසිකව පීඩාවට පත් වන විධියට සකස් වෙලා තිබෙන අධ්‍යාපන ක්‍රමය වෙනස් වෙලා උපාධිධාරීන්ටත් ඒ අයගේ උපාධියට ගැළපෙන විධියට රැකියා ලබා දෙන වැඩ පිළිවෙළක් සකස් කරන්න ඕනෑ. දේශපාලනඥයන් පිටුපසින් යමින් හෝ නැවත වතාවක් විභාගවලට පෙනී සිටිමින් ඒ අය රැකියාවලට යොමු කරන ක්‍රමයක් නොව, රජයේ මැදිහත් වීමෙන් ඒ උපාධිය ලබන අනුපිළිවෙළ අනුව ඒ උපාධියට ගැළපෙන විධියට, ඒ අයගේ ගෞරවය රැකෙන විධියට ඒ අය රැකියාවලට යොමු කළ යුතුයි.

මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් පුනරුත්ථාපනය කරන්නා සේම මත්ද්‍රව්‍ය විකුණන්නන් සහ ප්‍රචාරණය කරන්නන් සම්බන්ධයෙන්ද වැට බැඳීමක් කරන ලෙස මේ ගරු සභාවට නැවත වතාවක් මතක් කරමින් මට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

මීළඟට, ගරු ජානක වක්කුඹුර මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, දැන් රත්නපුර දිස්ත්‍රික්කයේ ඩෙංගුයි, කුඩුයි දෙකම තිබෙනවා නේද?

**ගරු ජානක වක්කුඹුර මහතා**
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)

ගංවතුරත් ආවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ඔව්, ගංවතුරත් ආවා.

[පූ.භා. 11.47]

**ගරු ජානක වක්කුඹුර මහතා**
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු සිසිර ජයකොඩි මන්ත්‍රීතුමා විසින් ගෙන එන ලද මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීම සඳහා අධිකාරියක් පිහිටුවීම පිළිබඳ යෝජනාව ඉතා හොඳ යෝජනාවක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "මතට තිත" වැඩසටහන අපේ ආණ්ඩුව කාලයේ ගෙනැල්ලා මෙයට ලොකු වැඩ පිළිවෙළක් එක්ක කටයුතු කළා. එදා පොලීසිය මැදිහත් වෙලා මත්ද්‍රව්‍ය ගෙනෙන එක ඇල්ලුවාම, "ආසියාවේ මත්ද්‍රව්‍ය තිප්පොළ ලංකාවයි" කියලා කිව්වා. එදා එහෙම කියලා අපේ ආණ්ඩුවට බැන්නා. ඒ කාලය සහ මේ කාලය බැලුවාම වැඩිම කුඩු ප්‍රමාණයක්

[ගරු ජානක වක්කුඹුර මහතා]

ලංකාවට ගෙනැල්ලා තිබෙන්නේ මේ කාලයේයි. ඒවා අල්ලන එක හොඳයි. අල්ලපු නිසා තමයි වැඩියි කියලා හොයා ගත්තේ. මේවා අල්ලන්නේ නැතිව තිබුණා නම් අඩුයි කියන්න පුළුවන්. අපේ ආණ්ඩුව කාලයේත් අල්ලපු නිසා තමයි වැඩියි කියලා කිව්වේ. දැනුත් ඒ කටයුත්ත ඊටත් වඩා හොඳට කෙරෙන නිසා තමයි දැන් මෙච්චර ප්‍රමාණයක් හසු වෙන්නේ. අද තරුණයින් විශාල පිරිසක් මේවාට ඇබ්බැහි වෙලා ඉන්නවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම, කිසිම මත් ද්‍රව්‍යයක් -සිගරට් එකක්වත්- භාවිත නොකරන කෙනෙක්; ඒවායින් මිදිලා ඉන්න කෙනෙක්; ඕනෑම දහම් පාසලකට ගිහිල්ලා ඒ දරුවකුට හෝ කියලා දෙන්න පුළුවන් කෙනෙක්.

2008 අවුරුද්දේ මම කලවාන මැතිවරණ කොට්ඨාසයේ කඩ හිමියන්ගෙන් ඉල්ලීමක් කළා, "සිගරට් විකුණන එක නතර කරන්න." කියලා. ඒ කාලයේ කඩ හිමියන් සියයට 90ක් විතර සිගරට් විකුණන එක නතර කළා. පාසල් දරුවෝ ඉස්සෙල්ලාම ඇබ්බැහි වෙන්නේ සිගරට් බීමටයි. මේ කාලයේ සමහර දරුවෝ මානසික ආබාධිත අයට දෙන පෙති වර්ගයක් අරගෙන ඒවා බොනවා මත් වෙන්න. ඒ පෙති වර්ග කොහොම ගන්නවාද කියලා දන්නේ නැහැ. ඒක නිසා මොන ක්‍රමයෙන් හරි දරුවෝ බලනවා මත් වෙන්නේ කොහොමද කියලා. ඒ නිසා අපි මේක නතර කරන්න ඕනෑ. මත් ද්‍රව්‍ය ගන්න අය පුනරුත්ථාපනය කරන්න වෙලා තිබෙන්නේ ඇයි? මිනිස්සු මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙන්නේ ඒවා ලබා ගැනීමට පහසුකම තිබෙන නිසා. මත් ද්‍රව්‍ය ලබා ගැනීමේ තිබෙන පහසුකමයි නැති කරන්න ඕනෑ. සමහර පුනරුත්ථාපනය කරන මධ්‍යස්ථානවලට අරගෙන යන අයට ගොඩාක් වෙලාවට ගහනවා. ගහලා කියනවා, "මත් ද්‍රව්‍ය පාවිච්චි කරන්න එපා." කියලා. පුනරුත්ථාපන මධ්‍යස්ථානයක හිටපු කෙනෙක් මට හම්බ වෙලා කිව්වා, "මැරුවේ නැති එක විතරයි." කියලා. හැබැයි, ඒ මනුස්සයා එළියට ඇවිල්ලා ආයෙත් බොනවා. මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙච්ච අය එහෙම හදන්න බැහැ. ඒ අයගේ මනසයි හදන්න ඕනෑ. මේවා බිව්වාම මොකද වෙන්නේ කියලා ඒ අයට දැනෙන විධියට තේරුම් කර දෙන්න ඕනෑ.

මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වුණාම දරු පවුල් එහෙම් පිටින්ම නැති වෙනවා. තාත්තා බීලා ගෙදර එනකොට දරුවා ඇඳ යටට රිංගනවා. අපි ගෙදර යන කොට අපේ දරුවෝ ඉස්සරහට දුවගෙන ඇවිල්ලා අතේ එල්ලෙනවා. සමහර තාත්තලා ගෙදර එනකොට දරුවන් බයේ ඇඳ යට හැංගෙනවා. ඒකට හේතුව තමයි තාත්තා ගෙදර එන්නේ තාත්තා හැටියට නොවෙයි, මත් වතුර හරි මොනවා හරි බීලා විකෘති වෙච්ච මනුස්සයෙක් විධියටයි. ඒ නිසා පුංචි දරුවෝ මේකෙන් ගොඩාක් පීඩාවට පත් වෙනවා. මේ උවදුර නැති කරන්න අපි සියලු දෙනාගේම වගකීමක් තිබෙනවා. කිසිම භේදයකින් තොරව අපි සියලුදෙනා ඒ වෙනුවෙන් කටයුතු කරන්න ඕනෑ.

මත් ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කරනවාට වඩා ඒවාට යොමු වන ප්‍රමාණයයි අඩු කරන්න ඕනෑ. අද වන විට පුනරුත්ථාපන කඳවුරුවල අපේ රටේ විශාල පිරිසක් ඉන්නවා. සමහර අය පුනරුත්ථාපන කඳවුරුවලට ගිහින් දැම්මාම පැනලා එනවා. ඒකට හේතු තිබෙනවා. යම් යම් ප්‍රශ්න තිබෙනවා. අරක්කු මිල වැඩි කළා කියලා බොන අයගේ ප්‍රමාණය අඩු වෙලා නැහැ. ඒ වාගේම, විකිණෙන ප්‍රමාණය අඩු වෙලාත් නැහැ. මිල වැඩි කරලා කොහොමටවත් මේක කරන්න බැහැ. එහෙම නම් නතර කරලාම දාන්න ඕනෑ. ඒක නිසා මේකට යම්කිසි වැඩ පිළිවෙළක් හදන්න ඕනෑ. අරක්කු මිල වැඩි වෙන කොට අපේ ගම්වල තිබෙන කසිප්පු වැඩි වෙලා තිබෙනවා. දැන් කසිප්පු බීලා මිනිස්සු මැරෙන ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා. සුරාබදු නිලධාරින් ගිහිල්ලා ඒවා හරියට අල්ලන්නේ නැහැ. කසිප්පු නිෂ්පාදනය නවත්වන්න පුළුවන්. නමුත්, එහෙම නවත්වන්න වැඩ පිළිවෙළක් නැහැ. ගොඩාක් තැන්වල දැන් කසිප්පු ව්‍යාපාරය කරන්නේ අල්ලන්න බැරි විධියටයි. වෙලක හරි, ගහක් යට හරි තියලා සල්ලි අරගෙන කියනවා, "අන්න අතන තිබෙනවා." කියලා. ඒක දන්නවා, අල්ලන්න යන කට්ටිය. ඒ ගොල්ලන් කියනවා, "අල්ලන්න අතේ බඩු නැහැ නේ" කියලා. දැන් කුඩු විකුණන්නෙත් අලුත් ක්‍රමයකට. කොහේ හරි තැනක තියලා අතට සල්ලි දුන්නාම කියනවා, "අන්න අතන තිබෙනවා ගන්න" කියලා. ඉතින් අතින් දුන්නේ නැහැ කියලා මෙවැනි මත්ද්‍රව්‍ය අල්ලන්නේ නැහැ. ඒ නිසා අපි කියනවා, මත් ද්‍රව්‍ය වැටලීම වැඩි කරන්න ඕනෑ කියලා. වාහනය බලලා, licence එක බලනවා. එක වාහනයම දවස් දෙක තුන එක්කෙනාම බලනවා. නමුත් ඒක අවුරුද්ද පැනලා ද කියලා හරියට බලන්නේ නැහැ. මේ රටේ ඊට වඩා බලන්න ඕනෑ මත් උවදුර නැති කරන්නේ කොහොමද කියලායි. මේවා අල්ලන්න පුළුවන්. අලුතෙන් OIC මහත්තයෙක් ආවාම මත් ද්‍රව්‍ය අල්ලනවා. ටික දවසක් ගියාම ඒ තත්ත්වය නැති වෙනවා. නමුත් ඊට හේතුව අපි දන්නේ නැහැ. ඔබතුමන්ලා බැලුවොත් ඕනෑම තැනක වැඩියෙන්ම මේ ව්‍යාපාර අල්ලන කාලය තමයි අලුතෙන් නිලධාරින් පත් වුණු අවස්ථාව. ඊට පස්සේ අල්ලන්නේ නැහැ. ඒ නිසා ඒක නැති කරන්න, ඒක හොයලා බලන්න තවත් පිරිසක් යොදවා හෝ වැඩ පිළිවෙළක් සකස් කරන්න ඕනෑ.

අපේ ගරු සිසිර ජයකොඩි මැතිතුමා ගෙන එන ලද මෙම යෝජනාව ඉතා හොඳයි. මත් උවදුරට හසු වූ එහෙම නැත්නම් මත් භාවිතයට යොමු වූ අය පුනරුත්ථාපනය කරලා හෝ ඔවුන්ට තමන්ගේ දරු පවුලත් එක්ක සතුටින් සිටීමේ අවස්ථාව උදා කරන්න ඕනෑ. තමන්ගේ තාත්තා ගෙදර එනකොට දරුවන්ට "තාත්තා" කියලා කථා කරන්න පුළුවන් වන, සතුටින් ජීවත් වෙන්න පුළුවන් වන පිරිසක් නැවතත් ඇති කරන්න ඕනෑ. ඒ වාගේම ඒ අය පුනරුත්ථාපනය වෙලා එළියට ගියාට පසු සොයා බලන්න ඕනෑ, ඔවුන් නැවත වරක් පරණ ක්‍රමයටම යනවාද කියලා. අපි දන්නවා, සමහර අය හිරේ ඇරියාට හිරේ ඉඳලා ආපු ගමන් නැවත ඒ වැඩේම කරලා ආපසු හිරේට යනවා. මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙච්ච අය පුනරුත්ථාපනය කළත් එළියට ඇවිල්ලා ටික දවසක් යනකොට ඒ අය නැවත වෙනස් වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මතක් වෙනවා, අරියධම්ම ස්වාමීන්වහන්සේ සිටිය කාලයේ උන්වහන්සේ රත්නපුරයට තුන් මාසයක් වැඩම කරලා සිටියා. ඒ කාලයේ අපේ ගමේ හැමදාම බිබී ඇවිදින පිරිසක් හිටියා. ඒ අය උන්වහන්සේගෙන් බණ අහලා ඔවුන්ගේ ජීවිත කාලයම ආපසු ඒ උවදුරට ඇබ්බැහි නොවී සිටියා. ඒ නිසා මනස හැදුවොත් ඒ අයව මත් උවදුරෙන් බේරාගන්න පුළුවන්. ඒ නිසා අපි කියන්නේ ඔවුන්ගේ මනස හදලා තමන්ගේ දරු පවුලත් සමඟ යා හැකි සමාජයේ හොඳ පුරවැසියන් බවට ඔවුන්ව පත් කරන්න ඕනෑ. ඒ සඳහා අපි සියලු දෙනාම එකතු වෙලා මේ කටයුත්ත කරමු. මේ යෝජනාව ගෙන එන ලද ගරු සිසිර ජයකොඩි මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟට, ගරු නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 04ක් වැනි කාලයක් තමයි තිබෙන්නේ.

[පූ.භා. 11.55]

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කාලීන යෝජනාවක් ගෙන ඒම පිළිබඳව ගරු සිසිර ජයකොඩි මන්ත්‍රීතුමාට අපේ ස්තුතිය පුද කරනවා. ඇත්තෙන්ම මම එතුමාට කියන්න ඕනෑ, මෙම යෝජනාව ගෙනා වකවානුව සම්බන්ධයෙන් ගැටලුවක් තිබෙන බව. ගරු මන්ත්‍රීතුමනි, මෙම යෝජනාව ගෙනෙන්න තිබුණේ මීට කලිනුයි. මොකද, මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීම සඳහා අධිකාරියක් පිහිටුවීමට තිබුණේ මීට කලිනුයි. එයට බොහොම ප්‍රමාද වෙලා තිබෙනවා.

රටක ජනතාව තමන් සහ තමන්ගේ දූ දරුවන් ගැන මෙන්ම, තම රටේ පැවැත්ම, සංවර්ධනය හා ප්‍රගතිය අපේක්ෂා කරගෙන දහසකුත් එකක් බලාපොරොත්තු තබමින් තමයි ප්‍රාදේශීය සභා, පළාත් සභා සහ පාර්ලිමේන්තුවට මහජන නියෝජිතයෝ වාගේම ජනාධිපතිවරයෙකු හෝ ජනාධිපතිවරියක පත් කර ගන්නේ. පසු ගිය වසර 70 පුරාම අපේ රටේ ජනතාවගේ බලාපොරොත්තුව වුණේත් එයයි. නමුත්, විවිධාකාරවූ පොරොන්දු දහසකුත් එකක් දීලා -කප්පරක් පොරොන්දු දීලා- බලයට පත් වන මහජන නියෝජිතයෝ බලය ගත්තායින් පසු ක්‍රියාත්මක වෙන්නේ අනෙක් පැත්තට කියන එක අපි තේරුම් ගන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "මත්ද්‍රව්‍ය" කියන මේ මහා දැවැන්ත විනාශයට මූලික වුණු අය තමයි, මේ රටේ දේශපාලනඥයෝ. දේශපාලනඥයන්ගේ අනුදැනුම මත තමයි එයාලාගේ හෙංචයියලා, හිතවත් ව්‍යාපාරිකයෝ මේ මහා දැවැන්ත විනාශකාරී කර්තව්‍යයට මැදිහත් වෙලා මුළු රටක්, සමාජයක් විනාශ කිරීමට කැස කවන්නේ. එම නිසා අපි පළමුව පුනරුත්ථාපනය කළ යුත්තේ වෙන කවුරුවත් නොවෙයි; මේ විනාශයට සෘජුව මැදිහත් වෙලා, විනාශය ඉදිරියට ගෙන යන දේශපාලනඥයෝ සහ ඊට අනුකූලතාව දක්වන ඒ අයගේ හෙංචයියලා කියන එක මා අවධාරණය කරනවා.

දළ වශයෙන් ගත්තොත් අපේ රටේ පාසල් සහ විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබන දරුවෝ මේ මොහොත වන විට ලක්ෂ 43ක් 44ක් විතර ඉන්නවා. ඊට අමතරව අධ්‍යාපනය අතරමඟ නතර කළ තරුණ වයසේ දරුවන් බලාපොරොත්තු සුන් කරගෙන නන්නත්තාර වී සිටිනවා. ඒ අයගේ ප්‍රාර්ථනාවන් ඉෂ්ට නොවීම නිසා, ඒ වාගේම අසහනයෙන් පෙළෙන ඒ අයගේ අපේක්ෂාවන් ඉෂ්ට කිරීමට රජයන් අපොහොසත් වී තිබෙන නිසා ඒ දරුවන් අද සමාජ භේදවාදකයන් බවට පත්වෙලා තිබෙනවා. ඒ අය ලෙහෙසි පහසු මාර්ග සොයනවා. අද රජයන්, මා කිව්ව වගඋත්තරකරුවන් ඒ පහසු මාර්ග සමාජය පුරාම පතුරුවා තිබෙනවා. ඒ නිසා මේ දරුවන්ගේ තරුණ ජීවිත, ශිෂ්‍ය ජීවිත මුළුමනින්ම විනාශ කිරීමට අද මේ මත් ද්‍රව්‍ය පාදක වෙලා තිබෙනවාය කියන එක මා විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මේ රටේ තරුණ පරපුර විශ්වවිද්‍යාලවලින් හෝ පාසල්වලින් හෝ කාර්මික විද්‍යාලවලින් හෝ බහු තාක්ෂණික ආයතනවලින් හෝ කුමන ආකාරයකින් හෝ අධ්‍යාපනය අවසන් කරලා සමාජයට යනවා. සමාජයට ගියාට පස්සේ ඒ අයගේ අධ්‍යාපන ක්‍රියාවලියට සාපේක්ෂව තමන්ගේ හැකියාව අනුව රටේ සංවර්ධනයට මැදිහත් වෙන්න අවකාශ නොමැති නිසා ඒ දරුවෝ බරපතළ අසහනයකට, බලාපොරොත්තු සුන් වීමකට පත්වෙනවා. ඒ නිසා ඒ අයට සිද්ධවෙලා තිබෙනවා, වෙනත් ක්‍රියා මාර්ගවලට යොමු වෙන්න. ඔවුන්ගේ බලාපොරොත්තු සුන් වුණාට පස්සේ ඒ අයට පහසුවෙන්ම කරන්න තිබෙන්නේ කුමන හෝ ආකාරයකට මත් ද්‍රව්‍යයකට ඇබ්බැහි වීමයි. ඒ තුළින් තාවකාලික සුවයක් ලබාගන්න පුළුවන්ය කියා ඒ ගොල්ලෝ විශ්වාස කරනවා. මත් ද්‍රව්‍ය භාවිත කිරීමෙන් ඒ ගොල්ලන්ගේ මුළු ජීවිතයම විනාශ වනවාය කියන එක ඒ ගොල්ලන්ට තේරෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙවැනි දරුවන් අපේක්ෂා භංගත්වයට පත්වෙලා මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වන්නේ සමහර විට රටේ පාලකයන්ගේ අමනෝඥ ක්‍රියා කලාපය නිසාය කියන එක අපි විශ්වාස කරනවා. ආණ්ඩුව, රජය මැදිහත්වෙලා තරුණ තරුණියන්ගේ හැකියාවන්, දක්ෂතාවන් හඳුනාගෙන ඒ අනුව ඒ අයට රැකියා අවස්ථා සලසා දෙනවා නම් ඒ අය මෙවැනි විනාශකාරී දේවලට ඇබ්බැහි වන්නේ නැහැ. තරුණ අසහනයට උත්තර විදියට, වැරදි උත්තර විදියට රජයන්, ආණ්ඩු හිතාමතාම දරුවන් මත් ද්‍රව්‍යවලට ඇබ්බැහිවීම ක්‍රමානුකූලව, සූක්ෂමව කරගෙන යනවාද කියන එක පිළිබඳව ගැටලුවක් මතු වනවා. ඒ විතරක් නොවෙයි.

ගෘහ සේවිකා ප්‍රශ්නය අද සමාජයේ විශාල වශයෙන් තිබෙනවා. තම පවුලේ ආර්ථික අමාරුකම් නිසා ඒ අය තමන්ගේ දූ දරුවන්, තමන්ගේ ස්වාමි පුරුෂයන් දමා පිට රටවලට යනවා. පිට රටවලට ගිහින් දහ දුක් විඳලා, තමන්ගේ විවිධාකාර දේවල් පරිත්‍යාග කරලා, කීයක් හෝ සොයාගෙන ඇවිත් තමන්ගේ දරුවන් පෝෂණය කරන්න, තමන්ගේ පවුල ආරක්ෂා කරන්න මැදිහත් වනවා. එහෙම වුණාට පස්සේ තමන්ගේ බිරිඳත් එක්ක, දරුවොත් එක්ක මේ සමාජය තුළ ජීවත් වන ස්වාමිපුරුෂයාට බරපතළ තනිකමක් ඇති වී, ළෙන්ගතුභාවය නැතිවෙලා ඔවුන් මානසික අසහනයකට පත්වෙනවා. එම නිසා ඔවුන් මේ වගේ සමාජ විරෝධී ක්‍රියාවන්වලට ඇබ්බැහි වීමෙන් තමන්ගේ පැවැත්ම ආරක්ෂා කරගන්න කටයුතු කරන්න සිද්ධ වෙනවා. එහෙම වුණාම සිද්ධ වෙන්නේ මොකක්ද? මත් ද්‍රව්‍යවලට බරපතළ විදියට ඇබ්බැහි වෙලා ඔවුන්ගේ දරුවන් ඇතුළු පවුල් සංස්ථාව මුළුමනින්ම විනාශ කරගෙන ලොකු අකරතැබ්බයකට පත්වීමයි සිද්ධ වෙන්නේ.

මත් ද්‍රව්‍යවලට ඇබ්බැහිවීමේ ක්‍රියා කලාපය නිසා මේ වෙනකොට මුළු මහත් සමාජ දේහයම විනාශයට පත්වෙලා තිබෙනවාය කියන එක අපි කියන්න ඕනෑ. ඒ වාගේම රාජපක්ෂ ආණ්ඩුව කාලයේ "මතට තිත" වැඩසටහන ආරම්භ කළාට, ඒ කාලයේත්, දැන් මේ කාලයේත් "මතට තිත" කොහොම වුණත්, මත් ද්‍රව්‍ය පාවිච්චිය තිතට -ඉතාමත් ක්‍රමානුකූලව- සිදුවෙනවාය කියන එක අපට පෙනෙනවා. ඒ නිසා සිද්ධ වෙලා තිබෙන්නේ මොකක්ද? මත් ද්‍රව්‍ය උවදුර නිසා මුළු මහත් සමාජ දේහයම විනාශවෙලා, ඔඩු දුවලා, මහා රෝගී තත්ත්වයක් බවට පත්වෙලා, රට මුළුමනින්ම විනාශ වෙලා තිබෙනවා. ඒ නිසා මෙන්න මේ තත්ත්වයෙන් ගොඩ එන්න සිසිර ජයකොඩි මන්ත්‍රීතුමා විසින් ගෙනෙන ලද යෝජනාව ඉතාමත්ම ඉක්මනින් ප්‍රායෝගික තලයට ගේන්නය කියන ඉල්ලීම කරමින් මා නිහඬ වෙනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

යෝජනා අංක 7, පා.180/'16, ගරු ජේ.සී. අලවතුවල මහතා - පැමිණ නැත.

[ගරු නියෝජ්‍ය කථානායකතුමා ]

යෝජනා අංක 8, පා.181/'16, ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා - පැමිණ නැත.

ගරු සභානායකතුමනි, අපට තව යෝජනා 2ක් පමණයි සාකච්ඡාවට ගන්න තිබෙන්නේ. අපි මෙම විවාදය දිවා ආහාරය සඳහා නවත්වන්නේ නැතුව දිගටම කරගෙන ගියොත්, අද දින පාර්ලිමේන්තු සැසිවාරය නියමිත වෙලාවට කලින් අවසන් කරන්න හැකියාව තිබෙනවා. ඒ පිළිබඳව සභාවේ එකඟතාව තිබෙනවාද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
යෝජනා අංක 9, පා.189/'17, ගරු අශෝක ප්‍රියන්ත මහතා.

## පුත්තලම දිස්ත්‍රික්කය ජාතික සහජීවනයේ හා සංහිඳියාවේ දිස්ත්‍රික්කය ලෙස නම් කිරීම
## புத்தளம் மாவட்டத்தை தேசிய சகவாழ்வினதும் நல்லிணக்கத்தினதும் மாவட்டமாகப் பெயரிடுதல்
## NAMING THE PUTTALAM DISTRICT AS THE DISTRICT OF NATIONAL COEXISTENCE AND RECONCILIATION

[අ.භා. 12.03]

**ගරු අශෝක ප්‍රියන්ත මහතා**
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ යෝජනාව අද දවසේ ඉදිරිපත් කරන්න ලැබීම පිළිබඳව මම බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. ඒ අනුව මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "පුත්තලම දිස්ත්‍රික්කයේ බෞද්ධ, කතෝලික, මුස්ලිම් යන විවිධ ජන කණ්ඩායම් වසර ගණනාවක සිට ඉතා සාමයෙන් හා සමගියෙන් ජීවත් වන බැවින්, වත්මන් යහපාලන රජයේ ප්‍රමුඛ අරමුණක් වන සහජීවනය තවදුරටත් ප්‍රවර්ධනය කිරීම උදෙසා මෙම දිස්ත්‍රික්කය ජාතික සහජීවනයේ හා සංහිඳියාවේ දිස්ත්‍රික්කය ලෙස නම් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලෝකයකට, රටකට සහජීවනය සහ සංහිඳියාව අවශ්‍ය මොහොතක මෙම යෝජනාව ගෙදරින් පටන් ගත්තොත් හොඳයි කියලා මට හිතුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම 'ගෙදර' යනුවෙන් අදහස් කළේ, පුත්තලම් දිස්ත්‍රික්කයයි. මෙම පාර්ලිමේන්තුව නියෝජනය කරන්න මා මන්ත්‍රීවරයකු ලෙසට තෝරා පත් කළ ජනතාව ජීවත් වන්නේ පුත්තලම් දිස්ත්‍රික්කයේ නිසායි මම එම දිස්ත්‍රික්කය 'ගෙදර' යනුවෙන් ආමන්ත්‍රණය කළේ.

පුත්තලම් දිස්ත්‍රික්කයේ සිංහල, දෙමළ සහ මුස්ලිම් ඇතුළු විශාල ජන කොටසක් ජීවත් වනවා. වෙනත් දිස්ත්‍රික්කවලට වඩා වෙනස් මුහුණුවරක් මෙම පුත්තලම් දිස්ත්‍රික්කය තුළ තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ දිස්ත්‍රික්කයේ අප්‍රිකානු සංයුතියකින් සමන්විත ජන කොටසක් ජීවත් වනවා. පුත්තලම දිස්ත්‍රික්කයේ, පුත්තලම ආසනයේ 'සිරම්බි අඩි' කියන ගමේ අප්‍රිකානුවන් විධියටම ජීවත් වන එම ජන කොටස ඔබට, අපට ගියොත් දැක ගන්න පුළුවන්කම ලැබෙනවා. අපි විවිධ උත්සව අවස්ථා, සංස්කෘතික අවස්ථා සහ වෙනත් කුමන හෝ විශේෂිත අවස්ථාවලට ඔවුන් කැඳවනවා; ඔවුන්ගේ ඉදිරිපත් කිරීම් ගන්නවා. එහිදී ඔවුන්ගේ විවිධ තාල රටා, සංස්කෘතික ක්‍රමවේද, සංගීත වැඩසටහන් අපි දකිනවා. ඒ වාගේම බෞද්ධ, කතෝලික, හින්දු සහ ඉස්ලාම් ආගම් අදහන ජාතීන්, මැලේ සහ බර්ගර් ජාතීන්, කෘෂි කර්මාන්තයේ, ධීවර කර්මාන්තයේ, රාජ්‍ය රැකියාවන්හි නියැළී ඒ ආදායම් මාර්ගවලින් ජීවත්වන ජන කොටසක් මේ දිස්ත්‍රික්කය තුළ ජීවත් වනවා.

රටටත් සංහිඳියාව අවශ්‍යයි, ලෝකයටත් සංහිඳියාව අවශ්‍යයි. ලෝකයේ ඇති වන ප්‍රශ්න ගණනාවක් සමගිය හා සහජීවනය තුළින් නිරාකරණය කර ගන්න පුළුවන්කම ලැබෙනවා. අපේ ලොව්තුරා බුදුන් වහන්සේ දේශනා කළේ සමගියෙන් එකතු වෙලා, සමගියෙන් සාකච්ඡා කරලා, සමගියෙන් විසිර යන්න කියලා. ඒ සහජීවනය, සමගිය නිර්මාණය කරන දිස්ත්‍රික්කය විධියට පුත්තලම් දිස්ත්‍රික්කය නම් කරන්න පුළුවන් නම් හොඳයි කියලා මම යෝජනා කරනවා.

ශ්‍රී ලංකාවේ අටවෙනි පාර්ලිමේන්තුවේ මම ඇතුළු මන්ත්‍රීවරු 6 දෙනෙක් මේ යහ පාලන රජයට සහයෝගය දෙමින් පුත්තලම් දිස්ත්‍රික්කය නියෝජනය කරනවා. ඒ අතර බෞද්ධ, හින්දු, කතෝලික සහ ඉස්ලාම් ආගම් අදහන ජන කොටස් නියෝජනය කරමින් ඒ ජනතාවගේ අදහස් මේ පාර්ලිමේන්තුවට ගෙනෙන්නත්, පාර්ලිමේන්තුව තුළ හඬක් නඟන්නත් පුළුවන් අවස්ථාවක් අපට ලැබිලා තිබෙනවා. මෙම යහ පාලන ආණ්ඩුවට සම්බන්ධ මන්ත්‍රීවරුන් 6දෙනායි, ඒකාබද්ධ විපක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරුන්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරුන් ඇතුළුව පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 09දෙනෙකුගෙන් සමන්විත මේ දිස්ත්‍රික්කයේ අපට මේ යෝජනාව සම්මත කර දෙනවා නම් රටට, ලෝකයට ආදර්ශයක් සපයනවා වාගේම පුත්තලම් දිස්ත්‍රික්කය ජාතියට අභිමානයක්, ගෞරවයක් අත්පත් කර ගන්න පුළුවන් දිස්ත්‍රික්කයක් බවට පත් කරන්නත් අපට පුළුවන්කම ලැබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම ගරු සභාව තුළ මේ සම්බන්ධයෙන් කථා කිරීමට කථිකයන් කිහිප දෙනෙක් සිටින නිසා මම මෙම යෝජනාව සභාවට ඉදිරිපත් කරමින්, අපට ජාතීන් අතර, ආගම් අතර, කුලභේද අතර කිසි ප්‍රශ්නයක් නොමැති බවත්, එම නිසා මෙම යෝජනාව ක්‍රියාත්මක කරන්නට හැකි බවත් මතක් කරමින්, ඒ සඳහා රාජ්‍ය නිලධාරින්ගේ සහ මෙම පාර්ලිමේන්තුවේ, මෙම රජයේ මැදිහත්වීම ලබා දෙන්න කියා ඉල්ලා සිටිනවා.

සඟ, වෙද, ගුරු, ගොවි, කම්කරු කියන පංච මහා බලවේගයෙන් එක තැනක තබා රටක් ගොඩනඟන්න පුළුවන් ආකාරයෙක් ගමක් කොහේ හෝ තිබෙනවා නම්, එතැනින් ආරම්භ කරන්න පුළුවන්, රට ලෝකය ජය ගන්නා වැඩ පිළිවෙළ. එතකොට අද අපේ රට තුළ උද්ගත වෙලා තිබෙන සමහර කාලකණ්ණි ප්‍රශ්නවලට, සමහර ආත්මාර්ථකාමී ප්‍රශ්නවලට, සමහර ඒක පුද්ගලයන්ගේ න්‍යාය පත්‍රවලට, කණ්ඩායම් සංවිධාන ගොඩනඟලා හදන ප්‍රශ්නවලට විසඳුම් සපයන්න පුළුවන් කියන පණිවුඩය ලබා දෙමින්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට අවස්ථාව ලබා දීම පිළිබඳ ඔබතුමාට බොහොම ස්තුතිවන්ත වෙමින් මාගේ කථාව අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඒ යෝජනාව ස්ථිර කිරීම සඳහා ගරු එස්.එම්. මරික්කාර් මහතා.

[අ.භා. 12.07]

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ගරු අශෝක ප්‍රියන්ත මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ "සහජීවන දිස්ත්‍රික්කය ලෙස පුත්තලම් දිස්ත්‍රික්කය නම් කරන්න" කියා ඉල්ලන යෝජනාව මම ස්ථිර කරන ගමන්ම, ඉතාම පැහැදිලිව දෙයක් කියන්න ඕනෑ. මෙම යෝජනාව පුත්තලම් දිස්ත්‍රික්කයට පමණක් ක්‍රියාත්මක කළ යුතු යෝජනාවක් නොවෙයි; එතැනින් ආරම්භ කරලා රට පුරාම ව්‍යාප්ත කළ යුතු යෝජනාවක්. මෙය අද, කාලීන අවශ්‍යතාවක් වෙලා තිබෙන යෝජනාවක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1948ට පෙර අපේ රටේ සිංහල, දෙමළ සහ මුස්ලිම් මිනිසුන් ජාතීන් හැටියට, ආගම් හැටියට බෙදිලා වෙන් වෙලා හිටියා. දේශපාලන පක්ෂ පවා ඒ අනුවයි හැදුණේ. ඒ නිසාම තමයි පරදේශක්කාරයන්ට අපේ මේ බෙදීම ප්‍රයෝජනයට අරගෙන අවුරුදු ගණනක් අපේ රට යටත් විජිතයක් හැටියට පාලනය කරලා, අපේ රටේ ධනය, සම්පත් සූරා කන්න ඔවුන්ට අවස්ථාව ලැබුණේ. එලෙස සිදු වුණේ වෙන කිසිවක් නිසා නොවෙයි, අපි බෙදිලා හිටිය නිසායි. ඒ නිසා තමයි සිංහල මහ සභාව, දෙමළ සංගමය, යෝනක සංගමය වාගේ විවිධ පිල්වලට බෙදිලා හිටපු ද්‍රවිඩ, මුස්ලිම් හා සිංහල නායකයන් 1948 වසරේදී නිදහස ලබා ගැනීම සඳහා එකට එකතු වුණේ.

මහාමාන්‍ය ඩී.එස්. සේනානායක මැතිතුමා ප්‍රමුඛ කොටගෙන එසේ එකට එකතු වීමේ ප්‍රතිඵලයක් හැටියට තමයි එකදු ලේ බිඳක්වත් හැලීමකින් තොරව අපේ රටට නිදහස ලබා ගන්න පුළුවන් වුණේ. එසේ නිදහස ලබා ගන්න කොට, අභිමානවත් ජාතියක් හැටියට, අභිමානවත් රටක් හැටියට, ප්‍රෞඪ ඉතිහාසයකට හිමිකම් කියන රටක් හැටියට අපි බලාපොරොත්තු වුණේ, ශ්‍රී ලාංකිකයන් හැටියට අපි සියලුදෙනාටම දියුණු ලෝකය තුළ වැජඹෙන්න පුළුවන් සංවර්ධිත ශ්‍රී ලංකාවක් බවට අපේ රට පත් කරන්නයි.

අපේ දෙමව්පියන්ගේ කාලයේදී කිව්වේ, "ශ්‍රී ලංකාව යනු දියුණු වෙමින් පවතින රටක්" කියලායි. අද අපේ කාලයේත් කියනවා, "ශ්‍රී ලංකාව දියුණු වෙමින් පවතින රටක්" කියලා. යුද්ධයෙන් පසුව බලාපොරොත්තු සහගතව ජීවත් වීම ආරම්භ කළ අපේ ජනතාවට, මේ රට තුළ නැවත ඇති වෙලා තිබෙන මේ තත්ත්වය දිගටම පැවතුණොත්, අපේ දරුවන්ගේ කාලයේදීත් කියන්න වෙන්නේ, "ශ්‍රී ලංකාව යනු දියුණු වෙමින් පවතින රටක්" කියලායි. අන්න ඒ නිසා අඩුම ගණනේ මේ කාලය තුළ සිටවත් 'සංහිඳියාව' මුළු රට පුරාම, වචනයේ පරිසමාප්ත අර්ථයෙන් බිම් මට්ටමේ සිට ව්‍යාප්ත විය යුතුයි කියන එකයි මගේ අදහස වෙන්නේ. අපි ඉතාම පැහැදිලිව එය කියන්න ඕනෑ.

විශේෂයෙන්ම කොළඹ දිස්ත්‍රික්කය ගත්තොත්, කොළඹ දිස්ත්‍රික්කයේ මැද කොළඹ, උතුරු කොළඹ, බොරැල්ල වැනි ආසනවලත් ඒ වාගේම කොලොන්නාව වාගේ ප්‍රදේශවලත් වතු ආශ්‍රිතව සිංහල, දෙමළ හා මුස්ලිම් ජනතාව ජීවත් වෙනවා. ඔවුන්ගේ අධ්‍යාපන මට්ටම යම් ප්‍රමාණයකට අඩු වුණත්, ඔවුන්ගේ සහජීවනය, සමගිය හා සංහිඳියාව එකයි. දෙමළ අවුරුද්ද, මුස්ලිම් අවුරුද්ද හා සිංහල අවුරුද්ද ඔවුන් එකට සමරනවා. කොළඹ දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙක් හැටියට සහ කොලොන්නාව සහ මැද කොළඹ ජනතාවගේ විශාල ඡන්ද ප්‍රමාණයක් ලබා ගත් මන්ත්‍රීවරයෙක් හැටියට මම දන්නවා, මේ යථාර්ථය කොළඹ දිස්ත්‍රික්කයේ වතු නිවාසවල තිබෙන බව. ඔවුන්ගේ ජන ජීවිත තත්ත්වය නොදියුණු වුණාට, අධ්‍යාපන මට්ටම ඉහළ නොවුණාට, "ශ්‍රී ලාංකිකයන් හැටියට අපි හැමෝම එකයි" කියන මතය ඔවුන් තුළ තිබෙනවා. ඔවුන් හදවතින්ම ඒ මතය තුළ හිඳිමින් ඔවුන්ගේ ජීවන රටාව පවත්වාගෙන යනවා.

ජනාධිපතිවරණයේදී මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ලබා ගත් ඡන්ද හැටදෙලක්ෂය තුළ වර්ග තුනක ඡන්ද ප්‍රමාණයක් තිබෙනවා. ඒ තුළ එක්සත් ජාතික පාක්ෂිකයන්ගේ ඡන්ද ප්‍රමාණයක් තිබෙනවා; මධ්‍යම පාන්තිකයන්ගේ ඡන්ද ප්‍රමාණයක් සහ දූෂණය පිටු දකින්න ඉදිරිපත් වුණු අයගේ ඡන්ද ප්‍රමාණයක් තිබෙනවා. ඒත් එක්කම අපි පැහැදිලිව කියන්න ඕනෑ, මුස්ලිම් සහ දෙමළ ජනතාවගෙන් සියයට 99.9ක්ම මේ රජය බලයට පත් කරන්න ඡන්ද දුන් බව. එයට හේතුව මොකක්ද? රාජ්‍ය ත්‍රස්තවාදය හරහා ඇති වුණු උසි ගැන්වීම්වලින් -ඒ අනුග්‍රහයෙන්- ඇති වුණු අන්තවාදය, ජාතිවාදය පිටු දැකලා හැමෝටම එක හා සමානව සමඟියෙන් ජීවත් වෙන්න පුළුවන් රටක් නිර්මාණය වෙන බැවින් තමයි එසේ කළේ. නමුත් කියන්න කනගාටුයි, මේ යහ පාලන රජය ඇතුළේත් සංහිඳියාව වෙනුවෙන් විශාල වැඩ කොටසක් වෙන බවක් අපට පෙනෙන්නේ නැහැ; සංහිඳියාව වෙනුවෙන් ජාතික මට්ටමේ ප්‍රවර්ධනයක් වෙන බවක් පෙනෙන්නේ නැහැ; ඒ වෙනුවෙන් වචනයේ පරිසමාප්ත අර්ථයෙන් කැප වුණු බවක් අපට පෙනෙන්නේ නැහැ. අපි ඒක පැහැදිලිව කියන්න ඕනෑ. සාපේක්ෂව පසු ගිය රජයට වඩා මේ රජය හොඳ වුණාට, කෙරෙන වැඩ කටයුතු මුල් කාලයේ ඒවාගේම දිගුවක් හැටියට ඒ ආකාරයෙන්ම තවමත් ක්‍රියාත්මක වෙනවා.

අද යම් කිසි තැනක සිද්ධියක් වුණාම, පොලීසියෙන් කියන්නේ මොකක්ද? Insurance එක ගන්න එහෙම කළා කියනවා, එහෙම නැත්නම් "මම මටම ගහ ගත්තා වාගේ වැඩක්" කියලා කියනවා, එහෙමත් නැත්නම් පිටින් ඇවිල්ලා ගැහුවාය කියනවා. මේ උත්තරය දෙන තැනට පොලීසිය හෝ රජය පත් වෙන්න ඕනෑ නැහැ.

මම සිංහල මාධ්‍යයෙන් ඉගෙන ගත් කෙනෙක්. අපි පාසල් යන කාලයේ අපේ යහළුවන් අතර අපට කවදාවත් එවැනි ගැටලු තිබුණේ නැහැ. පසු කාලීනව රැකියා කරන කොට, අපට එවැනි ගැටලු තිබුණේ නැහැ. අදටත් පෞද්ගලිකව මට එය ගැටලුවක් නොවෙයි. අද කොළඹ දිස්ත්‍රික්කයේ ජීවත් වෙන බහුතර සිංහල ජනතාවගේ ඡන්දය, මුස්ලිම් ජනතාව වාගේම මට ලබා දෙන්නේ ඒ නිසායි. ඒ නිසා තමයි මට බස්නාහිර පළාත් සභා මැතිවරණයේදී පළමුවැනියා වෙන්න පුළුවන් වුණේ; කොළඹ දිස්ත්‍රික්කයෙන් මැතිවරණයට ඉදිරිපත් වුණු නවකයන් අතරින් වැඩිම ඡන්ද ප්‍රමාණයක් ගන්න පුළුවන් වුණේ. මේ ජනතාව නොවෙයි, අසමඟි. අපි ඒක පැහැදිලිව කියන්න ඕනෑ. මේ ජනතාව තුළ අසමඟියක් නැහැ. ඔවුන් සමඟියි; දූරදර්ශීයි. ඔවුන්ට මේ රට දියුණු වෙන්න ඕනෑ. ඔවුන්ට මේ රට සංවර්ධිත රටක් බවට පත් කරන්න ඕනෑ. හැබැයි, අසමඟි වෙලා තිබෙන්නේ පිල් බෙදුණු, අවස්ථාවාදී දේශපාලනඥයෝය කියන එක අපි පැහැදිලිව කියන්න ඕනෑ. මේ ජනතාව මේ තැනට පත් කරන්නේ මේ දේශපාලනඥයෝය කියන එක අපි කියන්න ඕනෑ.

එක කණ්ඩායමක් කල්පනා කරනවා, බහුතර සිංහල-බෞද්ධ ඡන්ද විතරක් අරගෙන දිනන්න පුළුවන් කියලා. තව කණ්ඩායමක් කල්පනා කරනවා, සිංහල-බෞද්ධ ඡන්ද ටිකක් එකතු කරගෙන, සුළු ජාතික ඡන්ද ටිකක් ගත්තාම ආණ්ඩුවක් පිහිටුවන්න පුළුවන්

[ගරු එස්.එම්. මරික්කාර් මහතා]

කියලා. මෙන්න මේ මත වෙනස් විය යුතුයි. බිම් මට්ටමේ ඉඳලා, - පාසල් කාලයේ ඉඳලාම- සහජීවනය සහ සංහිඳියාව අප තුළ ඇති වෙන්න ඕනෑ. "අපි සියලුදෙනා ශ්‍රී ලාංකිකයෝ" කියන අනන්‍යතාවත් එක්ක ජීවත් වෙන්න අපි පුරුදු වෙන්න ඕනෑ.

අපි මේ කාරණය ගැන කථා කරද්දී, විශේෂයෙන්ම කිව යුතු තවත් දෙයක් තිබෙනවා. ශ්‍රී ලංකා - පාකිස්තාන ක්‍රිකට් කණ්ඩායම් දෙක තරග වදින කොට, පෙළක් කට්ටිය පාකිස්තානයට අත්පුඩි ගහනවා. ඒක සම්පූර්ණ වැරදියි. ඒක එහෙම වෙන්න බැහැ. මොකක්ද එහෙම කියන්න හේතුව? මේ මහ පොළොව, සිංහල වුණත්, දෙමළ වුණත්, මුස්ලිම් වුණත් අප සියලුදෙනා ඉපදුණු මහ පොළොවයි; අප ජීවත් වන මහ පොළොවයි. අප මැරෙන්නේත් මේ මහ පොළොවේයි. ඒ නිසා ගරු අශෝක ප්‍රියන්ත මන්ත්‍රීතුමාගේ යෝජනාවත් එක්ක එකතු වන ගමන් ඉතා ඕනෑකමින් මම යෝජනාවක් කරනවා.

මා මේ කරන්න හදන යෝජනාව සම්බන්ධයෙන් මම දැනටමත් පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. ද්‍රවිඩ මාධ්‍ය සියලු පාසල්වල සිංහල මාධ්‍ය ඒකකයක් තිබෙන්න ඕනෑ. කොළඹ ඩී.එස්. සේනානායක විද්‍යාලයේ තිබෙනවා වාගේ, රාජකීය විද්‍යාලයේ තිබෙනවා වාගේ, සිංහල මාධ්‍ය සියලු පාසල්වල දෙමළ මාධ්‍ය ඒකකයකුත්, සියලු දෙමළ මාධ්‍ය පාසල්වල සිංහල මාධ්‍ය ඒකකයකුත් තිබෙන්න ඕනෑ. එහෙම නැතිව "සංහිඳියාව" කියා විෂයයක් ගෙනාවාට හරි යන්නේ නැහැ. සංහිඳියාව ගැන වේදිකාවේ සුන්දර කතා කිව්වාට හරි යන්නේ නැහැ. සංහිඳියාව ගැන සම්මන්ත්‍රණ පැවැත්වූවාට, සාකච්ඡා පැවැත්වූවාට හරි යන්නේ නැහැ. ගමේ භාෂාවෙන් කියනවා නම්, එය බොක්කටම යන්න ඕනෑ. එය ඇඟේම තිබෙන්න ඕනෑ. එය ඇඟෙන්ම එන්න ඕනෑ. අපට එකට වාඩි වෙලා කන්න පුළුවන් වන්න ඕනෑ. අපට එකට trip එකක් යන්න පුළුවන් වන්න ඕනෑ. අපට එකට වැඩක් කරන්න පුළුවන් වන්න ඕනෑ. අපට එකට රැකියාවක් කරන්න පුළුවන් වන්න ඕනෑ. කොටින්ම කිව්වොත්, එකට බෙදා හදාගෙන ජීවත් වීමේ හැකියාව අපට තිබෙන්න ඕනෑ. මම ඉතාම වගකීමෙන්, ඉතාම පැහැදිලිව කියනවා, මට නම් ඒ පසු බිම මේ දක්වාම තිබෙනවා කියා. අනාගතයේදීත් ඒ පසු බිම තිබේවි කියා මම විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුවේ සිටින උදවිය හරහා තමයි රට පාලනය වන්නේ. මේ පාර්ලිමේන්තුවේ සිටින දේශපාලනඥයන් හරහා තමයි රටේ මෙවැනි අර්බුද නිර්මාණය වන්නේත්, මෙවැනි අර්බුද පාලනය වන්නේත්. ඒ නිසා අප සියලුදෙනා හිතට එකඟව අවංක වන්න ඕනෑ. ඒ අවංකත්වය තුළින් එන වුවමනාවක් අපට තිබෙන්න ඕනෑ. ඒ වුවමනාව වෙනුවෙන් අප කැප වුණොත් සංහිඳියාව ඇති කරන්න පුළුවන් කියන එකයි මගේ විශ්වාසය.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මැතිවරණ ප්‍රතිඵල ගෙන බැලුවාම අපට පැහැදිලිව පෙනෙනවා, අන්තවාදී කල්ලි නියෝජනය කරන අයට ඡන්ද 5,000ක් වත් ගන්න බැහැ කියා. ඒ අය සිංහල අන්තවාදීන් වන්න පුළුවන්, මුස්ලිම් අන්තවාදීන් වන්නත් පුළුවන්. ඒ අය ඡන්ද වැඩිපුර ලබා ගැනීමේ ප්‍රවණතාවක් නැහැ. නමුත් සමහර ප්‍රදේශවල වෙනත් වෙනත් ප්‍රවණතාවන් තිබෙන්න පුළුවන්. මේ ගැන ජාතික මට්ටමින් සිතා කටයුතු කරන්න ඕනෑ. මම විශ්වාස කරනවා, පුත්තලම දිස්ත්‍රික්කය වෙනුවෙන් ගෙනෙන මේ යෝජනාව සම්මත වෙලා, පුත්තලම දිස්ත්‍රික්කයෙන් ආරම්භ කරලා මේ මුළු රටම ඒ ආකාරයට කටයුතු කරලා ආදර්ශවත් දිවයිනක් බවට, මුළු ලෝකයටම පෙන්වන්න පුළුවන් සංහිඳියාවේ රට බවට ශ්‍රී ලංකාව පත් කිරීම අප සියලුදෙනාගේ වගකීමක් වනවා කියා.

අප අනෙක් අනෙක් ප්‍රශ්නවලට විසඳුම් දුන්නාට, අනෙක් අනෙක් පැතිවලින් දියුණු වුණාට වැඩක් නැහැ. කා කොටාගන්නා, ඇන කොටාගන්නා රටක් බවට අපේ රට පත් වුණොත් ලෝකයට යන පණිවුඩය වැරදි එකක් වනවා. එය අපේ රටේ සංචාරක කර්මාන්තයට බලපාන්න පුළුවන්; ආර්ථිකයට බලපාන්න පුළුවන්; අනෙක් අනෙක් ක්ෂේත්‍රවලට බලපාන්නත් පුළුවන්. ඒ නිසා පාසල් කාලයේ සිටම මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම සඳහා අප සියලුදෙනා එකතු වෙලා ක්‍රියා කරන්න ඕනෑ. අප අවස්ථාවාදී දේශපාලනයෙන් එළියට ඇවිත් රටක් හැටියට සිතන්න ඕනෑ කියමින්, මේ යෝජනාව ගෙන ඒම පිළිබඳව ගරු අශෝක ප්‍රියන්ත මන්ත්‍රීතුමාට මගේ ස්තුතිය පළ කරමින් මගේ කතාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

[අ.භා. 12.16]

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා, මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධව. ඒ වාගේම, මම ස්තුතිවන්ත වෙනවා, මා එක්ක එකට සිටින මගේ සහෝදර මන්ත්‍රීතුමා විශේෂයෙන් පුත්තලම දිස්ත්‍රික්කය ජාතික සහජීවනයේ හා සංහිඳියාවේ දිස්ත්‍රික්කය හැටියට නම් කරන්න කියා ඉල්ලා සිටීම සම්බන්ධයෙන්. එලෙස නම් කරන්න කියා ඉල්ලා සිටින්න එතුමාට වාගේම පුත්තලම දිස්ත්‍රික්කයේ අප සියලුදෙනාට අයිතියක් තිබෙනවා. ඒකට හේතුවක් තිබෙනවා. ශ්‍රී ලංකාව පුරා ජීවත් වන අනෙක් විවිධ ජන කොටස් ගෙන බැලුවාම, ඒ සියලු දෙනාට වඩා ඉදිරියෙන් සිටිමින් සමඟියෙන්, සමාදානයෙන් එකට ජීවත් වීමේ පණිවුඩය පුත්තලම දිස්ත්‍රික්කය සමස්ත රටටම, ලෝකයටම දී තිබෙනවා. එතැනදී අප දකින විශේෂත්වයක් තිබෙනවා. පුත්තලම දිස්ත්‍රික්කයේ එහා කෙළවරේ ඉඳලා මෙහා කෙළවර දක්වා දිවෙන ප්‍රදේශය තුළ ජීවත් වන ජනතාව මුස්ලිම් වන්න පුළුවන්, ද්‍රවිඩ වන්න පුළුවන්, සිංහල වන්න පුළුවන්, බර්ගර් වන්න පුළුවන්, විවිධ ආගම්වල අය වන්නත් පුළුවන්, අර කිව්වා වාගේ විවිධ රටවලින් ආ ගෝත්‍රවලට අයත් අය වන්නත් පුළුවන්. හැබැයි ඒ සියලු දෙනා ජීවත් වන්නේ එකටයි. ඒ අය බෙදිලා ජීවත් වන්නේ නැහැ. හැම දාකම උදේ අවදි වුණාට පසුව රාත්‍රී නින්දට යෑම දක්වා කාලය තුළ ඒ අය එකට ජීවත් වන නිසා ඒ අය අතර ප්‍රශ්න මතු වෙලා නැහැ. ඒ අය අතර ප්‍රශ්න අවමයි, අනෙක් ප්‍රදේශවලට වඩා. සුනාමිය ගත්තත්, එදා මේ රටේ පැවැති විවිධ අපරාධ ආදිය ගත්තත් ඒ කිසිදු ප්‍රශ්නයකට ගොදුරු වන්නේ නැතිව බේරුණු දිස්ත්‍රික්කයක් තමයි පුත්තලම දිස්ත්‍රික්කය. ඒ වාගේම, එය ස්වාභාවික ආපදාවලිනුත් බේරුණු දිස්ත්‍රික්කයක්. අපේ දිස්ත්‍රික්කය වෙනත් දිස්ත්‍රික්කවලට වඩා බොහොම ඉදිරියෙන් තිබෙන දිස්ත්‍රික්කයක් හැටියට අපට නම් කරන්න හැකි වන්නේ ඒ නිසායි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂ දෙයක් මම අද මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න ඕනෑ. පුත්තලම දිස්ත්‍රික්කය සහජීවනයේ හා සංහිඳියාවේ දිස්ත්‍රික්කය හැටියට නම් කරන්නය කියා ඉල්ලා සිටිනවා වාගේම, ඒ විධියට නම් කරාවිය කියා අපි විශ්වාස කරනවා. ඒ විධියට නම් කිරීමට පුත්තලම් දිස්ත්‍රික්කයට ඉතාමත්ම සුවිශේෂී වූ හේතුවක් තිබෙනවා. ඒක තමයි අපේ කුවේණි, එහෙම නැත්නම් යක්ෂ, නාග කියන ගෝත්‍ර දෙක ජීවත් වුණු අඩවිය; ඉපදුණු අඩවිය වන තම්බපණ්ණිය පුත්තලම් දිස්ත්‍රික්කයේ පිහිටා තිබීම. පුත්තලම් දිස්ත්‍රික්කයේ කල්පිටිය

කෙළවරේ තමයි තම්බපණ්ණිය පිහිටා තිබෙන්නේ. සමස්ත ශ්‍රී ලංකාවේම නැති රතු පාට පසක් තවමත් ඒ ප්‍රදේශයේ තිබෙනවා. අනුරාධපුර දිස්ත්‍රික්කයත්, පුත්තලම් දිස්ත්‍රික්කයත් යාවෙන තැන, පුත්තලම් දිස්ත්‍රික්කයට විශේෂ වූ, ආවේණික වූ තම්බපණ්ණිය පිහිටා තිබෙනවා. එහෙම නම් ශ්‍රී ලංකාවේ ජනතාව ආරම්භ වුණු තැන එතැනයි. එම නිසා පුත්තලම් දිස්ත්‍රික්කයට සුවිශේෂී වූ අවස්ථාවක් ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා. මොකද, ශ්‍රී ලාංකික ජනතාව ආරම්භ කළ ස්ථානය වන තම්බපණ්ණිය පුත්තලම් දිස්ත්‍රික්කයේ පිහිටා තිබීම නිසා. තම්බපණ්ණිය පිහිටා තිබෙන නිසා වෙන්න ඇති; ශ්‍රී ලාංකිකයන් එතැනින් ආරම්භ වුණු නිසා වෙන්න ඇති අපේ පුත්තලම් දිස්ත්‍රික්කයේ සියලුම ජනතාව සමගියෙන්, සමාදානයෙන් එකට අත්වැල් බැඳගෙන ජීවත් වන්නේ. ආර්ථික වශයෙන් බැලුවත් අපේ ප්‍රදේශයේ ව්‍යාපාරිකයන් ඉන්නවා. රජයේ රැකියා කරන, පෞද්ගලික අංශයේ රැකියා කරන, ධීවර කර්මාන්තයේ යෙදෙන, කෘෂිකර්මාන්තයේ යෙදෙන අය ඒ ප්‍රදේශයේ ඉන්නවා. ඒ ප්‍රදේශය, රටට බත සපයනවා වාගේම විශේෂයෙන්ම පොල් ආශ්‍රිත කර්මාන්ත විශාල වශයෙන් තිබෙන ප්‍රදේශයක්. ඒ වාගේම අන්නාසි වගාව වැනි වගාවනුත් අපේ ප්‍රදේශයේ තිබෙනවා.

අපි සියලු දෙනාම එකට එකතුවෙලා තමයි මේ සියලු දේම කරන්නේ. අපට වර්ග හැටියට වෙන්වෙලා එක එක තැන්වල කථා කරන්න පුළුවන්. අද ජනවර්ග හැටියට එක් එක්කෙනාව අවුස්සලා, ප්‍රශ්න ඇති කරලා සතුටක් විඳින මිලේච්ඡ කණ්ඩායමක් රටේ සිටියත්, පුත්තලම් දිස්ත්‍රික්කය තුළ කාටවත් එවැනි දේවල් කරන්න බැරිවෙලා තිබෙන බව අපි දන්නවා. විශේෂයෙන්ම මට ද්‍රවිඩ, මුස්ලිම් සියලු දෙනාගේම ඡන්ද ලැබුණා. ඒ වාගේම අපේ සහෝදර මුස්ලිම් මන්ත්‍රීතුමාටත් සිංහල ඡන්ද සහ ද්‍රවිඩ ඡන්ද ලැබිලා තිබෙනවා. එහෙම නම් අපි සියලු දෙනාම මේ විධියට ඡන්ද ලබා ගෙන පාර්ලිමේන්තුවට ආවා හා සමානව අපට විශාල අයිතියක් තිබෙනවා, දිස්ත්‍රික්කය තුළ වැඩ කටයුතු කරද්දී සියලු දෙනාටම එක විධියට සලකා වැඩ කරන්න. ඒකත් අපෙන් සිද්ධ වෙනවා. මුස්ලිම් මන්ත්‍රීවරු වෙන්න පුළුවන්, ද්‍රවිඩ මන්ත්‍රීවරු වෙන්න පුළුවන්, සිංහල මන්ත්‍රීවරු වෙන්න පුළුවන් අපේ මන්ත්‍රීවරු අතර කවදාවත් වාද භේදයක් ඇති වෙලා නැහැ. පක්ෂ වෙන්න පුළුවන්, විපක්ෂ වෙන්න පුළුවන්, පක්ෂ විපක්ෂ වශයෙන් අපි තර්ක කර ගත්තත්, අප සියලු දෙනා අතර වර්ග විධියට, ආගම් විධියට කිසිම විධියක තර්කයක් හෝ විතර්කයක් ඇතිවෙලා, අපි අතර ප්‍රශ්නයක් ඇතිවෙලා නැහැ. ජන කොටස් හැටියට අපි සියලු දෙනා එකට වාඩිවෙලා එක පවුලක් හැටියට පුත්තලම් දිස්ත්‍රික්කයේ වැඩ කටයුතු කරද්දී පුත්තලම් දිස්ත්‍රික්කය සමස්ත ශ්‍රී ලංකාවටම ආදර්ශයක් ලබා දෙනවා කියලා අපි හිතනවා.

අද ගරු අශෝක ප්‍රියන්ත මැතිතුමා ඉදිරිපත් කර තිබෙන යෝජනාව කාලෝචිත යෝජනාවක් වනවා පමණක් නොවෙයි, පුත්තලම් දිස්ත්‍රික්කයේ සමස්ත ජනතාවටම ගෞරවයක් වනවා. ඒ සම්බන්ධයෙන් පුත්තලම් දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයකු හැටියට මම ගරු අශෝක ප්‍රියන්ත මැතිතුමාට ස්තුතිවන්ත වෙනවා. මේවා තමයි අපි මන්ත්‍රීවරු හැටියට කළ යුත්තේ. අද බොහෝ දේශපාලනඥයන් කරන්නේ මොනවාද? තමන්ට බලය ලබා ගන්න ඕනෑ නිසා ජනතාව කුලප්පු කරමින්, රටේ තිබෙන භෞතික සම්පත් ටික විනාශ කරමින්, එහෙම නැත්නම් සමාජයීය වශයෙන් අපේ තිබෙන එකමුතුකම විනාශ කරමින්, රටේ ජනතාවට හිමිවෙන්න තිබෙන අයිතීන් විනාශ කරමින් තමන්ට බලය ලබා ගැනීම සඳහා ආත්මාර්ථකාමී චේතනාව මත මේ රට විනාශ කරමින් ඉන්න එකයි. ඒ නිසා ඒ විනාශ කරමින් ඉන්න යුගය අවසාන කරන්න නම්, සංහිඳියාව, සහජීවනය කියන එක ඉතාමත්ම වැදගත් වෙනවා. පක්ෂ අතර මොන වාද භේද තිබුණත් ජන කොටස් හැටියට, ජන වර්ගයන් අතර, ආගම් අතර බෙදීම් තිබුණත් ඒ සියල්ලම අතහැර දමා සියලු දෙනාම එකට එකතු කර ගෙන, එකට ජීවත් වන ජන සමාජයක් සමස්ත රට තුළම නිර්මාණය කරන්න ඕනෑ. ඒ නිර්මාණය කිරීම පුත්තලම් දිස්ත්‍රික්කයෙන් ආරම්භ කරමුය කියා යෝජනාවක් හැටියට මා මෙම යෝජනාවට එකතු කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අවස්ථාවේ මම විශේෂ ඉල්ලීමක් කරනවා. තම්බපණ්ණිය, කුවේණි ඉපදුණු තැන, කුවේණි මේ රටේ පරපුර ආරම්භ කළ තැන. හැබැයි, එදා විජය රජතුමා විසින් නාග සහ යක්ෂ ගෝත්‍ර දෙක අවසාන කරලා, නැවතත් ඉන්දියාවෙන් ඒ අය ගෙනැල්ලා රාජ්‍ය පටන් ගත්තාය කියලා තමයි ඉතිහාසයේ තිබෙන්නේ. ඒ පටන් ගත්ත පටන් ගැනිල්ල තමයි සමස්ත ශ්‍රී ලංකාව තුළම ව්‍යාප්ත වෙලා, ජාතියක් හැටියට, ශ්‍රී ලාංකිකයෝ හැටියට අද අපි මේ රට තුළ කටයුතු කරන්නේ. ඒ නිසා තම්බපණ්ණියත් මේ සහජීවනයට එකතු කරන්නය කියා මම විශේෂයෙන් ඉල්ලීමක් කරනවා. ඒ අනුවත් පුත්තලම් දිස්ත්‍රික්කය විශේෂත්වයේ ලා කටයුතු කරන්නය කියා පුත්තලම් දිස්ත්‍රික්කයේ සමස්ත ජනතාව වෙනුවෙන් අපි ඉල්ලා සිටිනවා. ඒ නිසා නැවත නැවතත් ගරු අශෝක ප්‍රියන්ත මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙමින් ඉදිරියේදී මේ කටයුත්ත සමස්ත ශ්‍රී ලංකාව තුළම ව්‍යාප්තවෙලා ලස්සන රටක්, යහපත් රටක් නිර්මාණය වේවිය කියා බලාපොරොත්තු වෙමින් මගේ කථාව අවසන් කරනවා. මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟට, ගරු මොහමඩ් නවවි මැතිතුමා.

[අ.භා. 12.24]

**ගරු මොහොමඩ් නවවි මහතා**
(மாண்புமிகு முஹம்மட் நவவி)
(The Hon. Mohamed Navavi)
Thank you very much, Mr. Deputy Speaker, for giving me this opportunity.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ දිස්ත්‍රික්කය ගැන මෙවැනි යෝජනාවක් ගෙන ඒම සම්බන්ධයෙන් ගරු අශෝක ප්‍රියන්ත තරුණ මන්ත්‍රීතුමාට මගේ ස්තුතිය පුද කරන්න ඕනෑ. හැබැයි, කියන්න කනගාටුයි, පුත්තලම් දිස්ත්‍රික්කය නියෝජනය කරමින් මන්ත්‍රීවරු නව දෙනෙක් මේ පාර්ලිමේන්තුවේ සිටියත්, මේ අවස්ථාවට සහභාගි වන්නේ මන්ත්‍රීවරු තුන් දෙනෙක් විතරයි.

So, I am indeed very happy that the Hon. Asoka Priyantha brought in this Private Members' Motion.

Mr. Deputy Speaker, as a Member representing the Puttalam District, I would like to say that we have set an example for the whole nation because communities belonging to various religions live together peacefully in the Puttalam District without any problem. There were a lot of problems to minority communities right around the country. But I am happy to say that none of such problems have arisen in our district, because the religious leaders and political leaders of all communities there get together and guide the people. This, I am sure, is an example to the rest of the country.

[ගරු මොහොමඩ් නවවි මහතා]

I would like to mention that famous places of worship are situated in Puttalam. The famous Thalawila Catholic Church and Pallekandal Catholic Church are situated in Puttalam. I think, these two churches are the biggest churches after the Madu Church. The famous Udappuwa Temple and the Munneswaram Temple of the Hindus' are also situated in our district. Most of the Buddhists do not know about the famous rock temple in Anamaduwa which has been completely carved out of rocks. However, a large number of devotees visit there. We also have a famous mosque in Puttalam.

Why I am saying these things is to tell you how we all are united religious wise. I would like to mention this fact since the Hon. Sagala Ratnayaka is also present here. He too knows that. Whatever problem occurred in other parts of Sri Lanka in the last two months, none of such incidents occurred in Puttalam. That is because we work together and live in unity. We have a religious leaders' committee consisting of clergies from all religions in our area. Therefore, if any problem crops up, they are there to help us and guide us. I think this type of practice can be carried out in other districts too.

As the Hon. Hector Appuhamy told, Prince Vijaya landed in our area. That is the place known as "Thammannawa" which is located in the Vilpattu area. Therefore, the communities in Sri Lanka descended from our area. Kuveni also lived in our area. In addition to that, I would like to say that Ibn Battuta, the famous traveler who came to Sri Lanka, also landed in Puttalam. So, the Muslim community also descended from our area.

In addition, I must say that except tea and rubber, all other crops are found in Puttalam. Business wise, agricultural wise or fisheries wise, we all work together. As you know even electricity is generated from the Norochcholai Coal Power Plant. So, it is in this kind of an area that we live and it is this kind of support that we give to the rest of the country.

As you know, there is a famous Muslim girls' school called "Fathima Girls School" in Puttalam. When I was in the Provincial Council, we started Sinhala medium education in Tamil medium schools. In other parts of the country, they do not have Sinhala medium education in Tamil medium schools and Tamil medium education in Sinhala medium schools. Therefore, setting an example, we started Sinhala medium education in Tamil medium Muslim schools. I am really happy, today, that school has Sinhala medium up to GCE A/L and last year, three Tamil -speaking Muslim girls who studied in Sinhala medium have entered the university. Sir, all these problems begin because of lack of communication. The Tamil and the Muslim children who are studying in Tamil medium do not converse in Sinhala and the Sinhala medium students do not converse in Tamil. So, this is the main problem.

I am happy to say that it has changed a lot. Most of the Tamil and the Muslim students in Puttalam are studying in Sinhala and the Sinhala students are also studying in Tamil. So, if we can extend what we are doing in the Puttalam District to other districts, I am sure, these unwanted, unnecessary problems created by a few people - he maybe a Sinhalese, a Tamil or a Muslim - can be brought to an end and a better understanding can be created among all communities. So, we will get together, improve and increase the unity of this country in the future.

Therefore, once again, I thank the Hon. Member - he is a young Member - who brought in this Motion. As a Member of Parliament from Puttalam District, I am sure that what we are doing will be carried on and no problem will never ever crop up in Puttalam. I also hope this will be extend to the other districts too.

Thank you very much.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
යෝජනා අංක 10, පා.190/'17, ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය.

## පෙර පාසල් අධ්‍යාපනය නඟා සිටුවීම සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙළක් සකස් කිරීම
### முன்பள்ளி கல்வியை மேம்படுத்துவதற்கான முறைசார்ந்த வேலைத்திட்டமொன்றைத் தயாரித்தல்
### FORMULATING A METHODICAL COURSE OF ACTION TO UPLIFT PRE-SCHOOL EDUCATION

[අ.භා. 12.32]

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා:

> "රටට වැඩදායී යහපත් පිරිපුන් පුද්ගලයන් බිහි කිරීමේ මූලික තෝතැන්න වන පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන විශාල සංඛ්‍යාවක් රට පුරා පැවතියද, ඉන් බහුතරයක් නිසි ප්‍රමිතියකින් හා ක්‍රමවේදයකින් තොරව පවත්වා ගෙන යෑම හේතුවෙන්, දරුවන්ගේ පෞරුෂ වර්ධනයේත්, සාරධර්ම හා මූලික අධ්‍යාපන පෙළගැස්මේත් ඍණාත්මක බවක් දක්නට ලැබෙන හෙයින්, පෙර පාසල් අධ්‍යාපන මධ්‍යස්ථානවල භෞතික පහසුකම් පවත්වා ගැනීම, සුදුසුකම් සහිත පාලිකාවන් පත් කිරීම, ඉගැන්වීමේ ක්‍රියාවලියේ ගුණාත්මකභාවය සුරැකීම සඳහා ඔවුන් පුහුණු පාඨමාලා සඳහා යොමු කිරීම මෙන්ම, මධ්‍යස්ථාන පාලිකාවන් සඳහා නිශ්චිත වැටුප්/දීමනා ලබාදීම මඟින් ඔවුන්ගේ අනාගත සුරක්ෂිතභාවය ඇති කිරීම තුළින් පෙර පාසල් අධ්‍යාපනය නඟා සිටුවීම සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දරුවෙකු මවකගේ කුස පිළිසිඳ ගෙන ගත කරන කාලයත්, උත්පත්තිය ලැබීමෙන් පස්සේ වසර පහක් දක්වා ගත වන කාලයත් මනුෂ්‍ය ජීවිතයේ බුද්ධි වර්ධනයේ වැදගත්ම අවධිය විධියට සැලකෙනවා. ඒ අවධියට අපි

කියනවා, "පූර්ව ළමාවිය" කියලා. මෙතැනදී මේ පූර්ව ළමාවියට, එහෙම නැත්නම් බුද්ධිය වර්ධනය වන කාලයට බලපාන සාධක දෙකක් අපි දකිනවා. එකක් තමයි, ආරය. අනික් එක තමයි, පරිසරය. 'ආරය' කියන්නේ දෙමව්පියන්ගෙන් ගෙනෙන ජානවලින් ලැබෙන දේ. 'පරිසරය' කියන්නේ තමන් වටා තිබෙන ස්වාභාවික පරිසරය හා ඇසුරු කරන්නන්. ඒ කියන්නේ දෙමව්පියන්, ගුරුවරුන්, ඒ වාගේම පවුලේ අනෙක් අයත්. ඒකට හොඳම උදාහරණයක් තමයි, බෞද්ධ සාහිත්‍යයේ තිබෙන ගිරා දෙමව්පිය දෙදෙනෙකුට දාව උපදින ගිරා පෝතකයන් දෙදෙනෙකුගේ කථාව. එම ගිරා පෝතකයන් දෙදෙනාගෙන් කෙනෙක් සොරමුළක් ළඟටත්, අනෙකා තපසුන් ළඟටත් වැටිලා හැදෙන හැටි ඒ කථාවේ කියැවෙනවා. එකම ජාන තිබුණත්, පරිසරය විසින් ඒ අයගේ පැවැත්ම වෙනස් කරනවාය කියන එකට හොඳම උදාහරණයක් තමයි ඒ කථාව. එම නිසා මේ පූර්ව ළමාවිය සංවර්ධනය අවස්ථාව, ඉතා විශාල වග කීමකින් යුතුව විශාල කාර්ය භාරයක් හරහා දරුවෙකුගේ ජීවිතයේ පදනම සකස් කරන අවස්ථාව විධියට මා දකිනවා. එහිදී මේ පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවලට විශේෂ කාර්යභාරයක් තිබෙනවා. එහිදී කෙරෙන්නේ දැනුම, කුසලතා, ආකල්ප ලබා දෙමින් මේ දරුවන් සමාජයානුයෝජනය කිරීමයි. දරුවෙකු සමාජයට ගැළපෙන පුද්ගලයෙකු විධියට සකස් කරන්නේ කොහොමද කියන එක තමයි මේ පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයකින් සිද්ධ වන්න ඕනෑ.

භෞතික සම්පත්වල වාගේම, මානව සම්පත්වලත් පවතින යම් යම් දුර්වලතා නිසා මේ පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන තුළින් අපි බලාපොරොත්තු වන කාර්යභාරය මේ පුංචි දරුවන් වෙනුවෙන් සිද්ධ වනවාද කියන කාරණය අපට ගැටලුවක් ලෙස පවතිනවා. වෙලාවකදී මවක විධියට, තවත් වෙලාවකදී හෙදියක විධියට, තවත් වෙලාවකදී ගුරුවරියක විධියට විශාල කාර්යභාරයක් කරන පෙර පාසල්, එහෙම නැත්නම් පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන පාලිකාවන් විශාල වැඩ කොටසක් මේ රට වෙනුවෙන් සිද්ධ කරනවාය කියන එකත් මා මේ වෙලාවේ බොහොම ගෞරවයෙන් මතක් කරනවා. නමුත්, මෙන්න මේ පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන අද රට පුරා හතු පිපෙන්නා වාගේ ඇති වී තිබෙන බව අපි දකිනවා.

මා මුලින් සඳහන් කරපු විධියට ඒවායෙන් සමාජයානුයෝජනයම සිද්ධ වනවාද, එහෙම නැත්නම් වාණිජ අරමුණින් මේවා කටයුතු කරනවාද කියන කාරණය ගැන අපි මේ වෙලාවේ විශේෂ අවධානයක් යොමු කරන්න ඕනෑ. මොකද, අපි දකිනවා ඒ සමහර පාලිකාවන්ට මූලික සුදුසුකම්වත් නැහැ කියලා. සමහර වෙලාවට මේක ස්වයං රැකියාවක් බවට පත් වෙලා තිබෙනවා. එක වසමක පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන දෙක තුනක් තිබෙනවා. රැකියාවක් නැතිව සිටින තරුණිය, ආදායම් මාර්ගයක් නැතිව සිටින කාන්තාව, ළමයින් කීප දෙනෙකු එකතු කර ගෙන පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක් පටන් ගන්නවා. හුදෙක් ඒ තමන්ගේ වාණිජ අරමුණ ඉෂ්ට සිද්ධ කර ගන්නයි. එම නිසා මම මෙතැනදී විශේෂ කරුණක් විධියට මේ පාලිකාවන්ගේ මූලික සුදුසුකම් පිළිබඳව මතක් කරනවා. ඒ අය අනිවාර්යයෙන්ම අධ්‍යාපන මනෝ විද්‍යාව ඇතුළත් වුණු පාඨමාලාවක් හදාරා තිබිය යුතුයි කියලා මා සඳහන් කරනවා. ඒත් එක්කම, මේ මධ්‍යස්ථාන පවත්වා ගෙන යන ගොඩනැගිලි ගත්තොත්, ඒ බොහෝ ඒවා අනාරක්ෂිත පරිසරවල තිබෙන, දරුවන්ට නුසුදුසු තැන්වල තිබෙන, දරුවන්ට ප්‍රියමනාප නොවන තැන්වල තිබෙන ගොඩනැගිලි. ඒ වාගේම, ඒ සමහර ගොඩනැගිලිවල ඒ දරුවන්ට අවශ්‍ය ප්‍රමාණයට ඉඩ කඩ නැහැ. සමහර පන්ති කාමර ඇතුළේ හිර වුණු ස්වභාවයක් තිබෙන බවත් අපි දකිනවා.

අවුරුදු පහෙන් ඉහළ, එහෙම නැත්නම් 1 වසරේ ඉඳලා 13 වසර දක්වා පන්තියක උපරිම වශයෙන් ඉන්න පුළුවන් දරුවන් සංඛ්‍යාව 40ක් බව රජය විධියට අප පිළිගන්නවා. නමුත් පෙර පාසල්වල එම සීමාව ඉක්මවා දරුවන් සිටින බව අපි දකිනවා. පන්තියක ළමුන් 40ක් නොවෙයි, එම ප්‍රමාණය ළමයින් 20කට සීමා කර ගන්න පුළුවන් නම්, දරුවන් හොඳින් හඳුනාගෙන, දරුවන්ට අවශ්‍ය සමාජානුයෝජනය ලබා දෙන්න කටයුතු කරන්න පුළුවන් කියන කාරණය ගුරුවරියක් විධියට මා දකිනවා. ඒ එක්කම, බොහෝ පෙර පාසල්වල ශාරීරික ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය විධිමත් සහ ක්‍රමවත් ආරක්ෂිත සෙල්ලම් මිදුල්, ඒ වාගේම පරිසරයට අනුගත වීමට අවශ්‍ය කරන වටපිටාවක් නැහැ කියන කාරණය මම මතක් කරනවා. මානව සම්පත ගත්තොත්, මම කලින් කිව්වා වාගේ බොහොමයක් පාලිකාවන්ට - උපදේශිකාවන්ට- විධිමත් මූලික සුදුසුකම් හා පුහුණුවීම් නැහැ.

තව කාරණයක් පිළිබඳව කියන්නට ඕනෑ. බොහොමයක් පාලිකාවන්ගේ විශ්‍රාම දිවිය සුරක්ෂිත නැති බව අපි දන්නවා. රජයෙන් වැටුප් ලබන පාසල්වල උගන්වන ගුරුවරියන්ට විශ්‍රාම වැටුපක් ලැබුණත්, දරුවාගේ මූලික අඩිතාලම සකස් කරන පෙර පාසල් පාලිකාවගේ විශ්‍රාම දිවිය සුරක්ෂිත නැහැ. 2014 නොවැම්බර් මස ඉදිරිපත් කළ අය වැයෙන් වාගේම, 2015 ජනවාරි මස ඉදිරිපත් කළ අය වැයෙනුත් එම පාලිකාවන්ට රුපියල් 2,500ක දීමනාවක් ලබා දෙන්න මේ ගරු සභාව තුළ සම්මත වුණා. මා දන්නා තරමින් එම මුදලවත් මේ වන තුරු ලබා දීලා නැහැ. ඒ අය සඳහා පිළිගත්, ඒ අයට සෑහීමකට පත් වෙන්න පුළුවන් විධියේ දීමනාවක් ලබා දීම සුදුසුයි කියලා මම යෝජනා කරනවා. මේ අය ජීවන අරගළයකයි යෙදිලා ඉන්නේ. එතකොට පෙර පාසල්වල ඉගෙන ගන්නා දරුවන්ගෙන් අය කර ගන්න මුදලේ සීමාව ඉක්මවා යනවා. අපේ රටේ දෙමවුපියන් තමන්ගේ දරුවන් වෙනුවෙන් හොඳම දේ ලබා දෙන්න තමයි කටයුතු කරන්නේ කියා අපි දන්නවා. ඒ නිසා ඔවුන් ඉල්ලන දේවල් ලබා දීමේ දී අපේ දෙමවුපියන් ලොකු අසීරුතාවන්ට පත් වනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මධ්‍යම පළාත් සභාව තුළ පමණක් මේ වනකොට පූර්ව ළමා විය සංවර්ධන ප්‍රඥප්තියක් ගෙනැල්ලා තිබෙනවා. එවැනි ආකාරයට පූර්ව ළමා විය සංවර්ධන ප්‍රඥප්තියක් ගෙන ඒම සම්බන්ධයෙන් ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු ඒ වෙනුවෙන් සහයෝගය දැක්වූ සියලු දෙනාට මේ අවස්ථාවේදී මගේ ස්තුතිය පුද කරනවා. නමුත්, ඒ තුළිනුත් පෙර පාසල් පාලිකාවන්ගේ දැවෙන ගැටලු සම්බන්ධයෙන් මේ වනතුරු පිළියම් යොදලා නැහැ. ඒ අය සතුටට පත් වුණේ නැත්නම්, ඒ අය යටතේ ඉන්න පුංචි දරුවන්ගෙන් සමාජානුයෝජනයක් සිදු වනවාද කියන ප්‍රශ්නය මා මේ වෙලාවේ දී මතු කරනවා. පවත්නා ප්‍රතිපත්ති, රෙගුලාසි නිසි පරිදි ක්‍රියාත්මක කරන්න කියන එකයි මා මේ අවස්ථාවේදී යෝජනා කරන්නේ. එම මධ්‍යස්ථාන නිරන්තර අධීක්ෂණයකට ලක් කිරීම, ඒ වෙනුවෙන් කාර්ය මණ්ඩලයක් යෙදවීම මඟින් පාලිකාවන් දිරිගැන්වීම, උපදේශිකාවන් සඳහා මූලික සුදුසුකම් තීරණය කිරීම, පිළිගත් විශේෂඥ උපදෙස් මත සැකසුණු පොදු පාඨමාලාවක් -විෂය නිර්දේශයක්- ලබා දීම, උපදේශිකාවන් සඳහා නිශ්චිත වැටුපක් නිර්දේශ කිරීම හා එය රජයේ මැදිහත් වීමෙන් ලබාදීම සුදුසුයි කියා මා හිතනවා. ඒ වාගේම, එම ස්ථාන නඩත්තු කිරීම සඳහා නිශ්චිත පොදු වැඩ පිළිවෙළක අවශ්‍යතාවකුත් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මුලින් සඳහන් කළා වාගේ ගමක පෙර පාසල් කීපයක් තිබෙනවා. මේ පෙර පාසල් සියල්ලම එකතු කරලා, පුංචි ළමා මනසට ගැළපෙන විධියේ ප්‍රියජනක ස්ථානයන් බවට ඒවා පත් කරමින්, පවතින පාසලට අනුයුක්තව, සුදුසුකම් සපුරාලන පාලිකාවන්ගෙන් සමන්විත වන පරිදි, සියලු පහසුකම් සහිතව වසමකට එකක් හෝ පූර්ව ළමා විය

[ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය ]

සංවර්ධන මධ්‍යස්ථාන පිහිටු විය යුතු බවත්, අධ්‍යාපන අමාත්‍යාංශය හා ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශයේ පූර්ණ මැදිහත් වීම මත ඒවායේ පරිපාලනය ගෙන යා යුතු බවටත් මම මේ සභාවට යෝජනා කරනවා. මට කථා කිරීමට අවස්ථාව ලබාදීම සම්බන්ධයෙන් ස්තුති වන්ත වනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
යෝජනාව ස්ථිර කිරීම, ගරු තිලකරාජා මන්ත්‍රීතුමා,

[பி.ப. 12.41]

**ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා**
(மாண்புமிகு மயில்வாகனம் திலகராஜா)
(The Hon. Mylvaganam Thilakarajah)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, முன்பள்ளிக் கல்வியை மேம்படுத்துவதற்கான முறைசார்ந்த வேலைத் திட்ட மொன்றைத் தயாரிக்கும் நோக்கோடு, கௌரவ உறுப்பினர் ரோஹினி குமாரி விஜேரத்ன அவர்கள் முன்வைத்திருக்கும் தனிநபர் பிரேரணையை நான் ஆமோதிக்கின்றேன். அவர் ஓர் ஆசிரியர் என்கின்ற வகையில் தன்னுடைய அனுபவங் களையும் கொண்டு, ஒரு தாய் என்கின்ற வகையில் பிள்ளை களின் உணர்வுகளை மதித்து, ஒரு பாராளுமன்ற உறுப்பினர் என்கின்ற வகையில் இந்த நாட்டின் எதிர்காலச் சந்ததியின ருக்குப் பொருத்தமான ஒரு கல்வி முறையை வழங்க வேண்டும் என்ற நோக்கோடு முன்மொழிந்திருக்கும் இந்தப் பிரேரணை, இன, மத, மொழி பேதம் கடந்து நாட்டிலுள்ள அனைத்துப் பிரஜைகளும் ஏற்றுக்கொள்ள வேண்டிய - பின்பற்ற வேண்டிய நடைமுறைகளை உள்ளடக்கியிருக்கின்றது என்கின்ற வகை யில் இது மிகவும் வரவேற்கத்தக்கது.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, எமது நாடு பல்வேறு விடயங்களுக்கு உலகிலே பிரசித்தி பெற்றிருக் கின்றது. குறிப்பாக இலவச வைத்திய சேவை, இலவசக் கல்வி என்பன அரசாங்கத்தினால் வழங்கப்படுவது, பிற நாடுகள் மத்தியில் வரவேற்கக்கூடிய விடயமாகப் பார்க்கப்படுகின்றது. இந்த நாட்டிலே தரம் 1இலிருந்து பல்கலைக்கழகம் வரை இலவசக் கல்வி நடைமுறையில் இருக்கின்றபோதும்கூட, பல்கலைக்கழகக் கல்வி வரை இலவசமாகக் கல்வி பெறக்கூடிய மாணவர்களுக்கான ஆரம்பக் கல்வி என்பது இலவசக் கல்வியாக இல்லை என்பது தொடர்பாக நாங்கள் இந்த உயரிய சபையின் கவனத்தை ஈர்க்க வேண்டியிருக் கின்றது. மிக ஆரம்ப காலத்திலே, ஒரு பல்கலைக்கழக மாணவர் கூட பகுதிநேர வேலை செய்துகொண்டு தனது கல்வியைத் தொடர முடியும். ஆனால், ஆரம்பப் பாடசாலை களுக்குச் செல்லவேண்டிய ஐந்து வயது வரையான அந்தக் குழந்தைகளுக்கு ஆரம்பத்தில் - அவர்களின் மூளை வளர்ச்சிக் குள்ளாகக்கூடிய அந்தக் காலப்பகுதியில் - முறையான கல்வி வாய்ப்பைப் பெற்றுக்கொடுக்க வேண்டும் என்பதுதான் அனைவரினதும் பொறுப்பாக இருக்கின்றது.

நமது நாட்டின் கல்வி முறைமைக்குள் துரதிஷ்டவசமாக இந்த ஆரம்பக் கல்விமுறை இலவசக் கல்வியாக இல்லாமல், முழுக்க முழுக்கத் தனியார் வசம் ஒப்படைக்கப்பட்டிருக்கின்ற, தனியார் சுயாதீனமாக மேற்கொள்கின்ற ஒரு கல்வி முறையாகக் காணப்படுகின்றது. நமது முறைமையிலே அவ்வாறு இல்லாததன் காரணமாக, ஒரு தொழில் வாய்ப்புக் காகவோ வணிக நோக்கத்துக்காகவோ இதனைப் பொறுப்பேற்று நடத்தும் தனியார் துறையினர் இருக்கின்ற பட்சத்தில், அதற்கு அப்பால் இந்தக் குழந்தைகளை நல்ல பிரஜைகளாக உருவாக்க வேண்டும் என்ற தன்னார்வத்தோடு செயற்படுகின்ற பல பாடசாலைகளையும் நாங்கள் பார்க் கின்றோம். அத்தகைய பாடசாலைகளை ஊக்குவிக்க வேண்டும் என்பதுதான் இந்தப் பிரேரணையின் மிக முக்கிய மான நோக்கமாக இருக்கின்றது. எனவே, இந்த ஆரம்பக் கல்வியை ஒரு முறைமைக்குள் கொண்டுவர வேண்டும். அவ்வாறு முறைமைக்குள் கொண்டுவருவதனூடாக நாட்டிலே பாலர் பாடசாலைகளை - ஆரம்பப் பாடசாலைகளை ஒரு முறையான திட்டத்திற்குள் நடைமுறைப்படுத்துவதற்கான ஒழுங்குவிதிகளை உருவாக்க வேண்டும் என்ற விடயத்தைக் கௌரவ உறுப்பினர் அவர்கள் தனது பிரேரணையிலே முன்வைத்திருக்கின்றார்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இந்தக் கட்டத்திலே நான் மிக முக்கியமான ஒரு விடயத்தை இந்தச் சபையின் கவனத்திற்குக் கொண்டுவர விரும்புகின்றேன். அதாவது, இந்த நாடு முழுவதிலும் பாலர் பாடசாலைகள் தனியாரால் நடத்தப்பட்டு வருகின்றபோதிலும், பெருந் தோட்டப் பகுதிகளிலே அவற்றை ஆரம்பிக்கின்ற பொழுது அதற்கான அனுமதி பெறுவது அல்லது அதனை நடத்துவது தொடர்பாகப் பல்வேறு சிக்கல்கள் காணப்படுகின்றன. நான் ஏற்கெனவே இந்தப் பாராளுமன்றத்தில் மிக முக்கியமான பிரேரணை ஒன்றை முன்வைத்திருக்கின்றேன். அதாவது, பெருந்தோட்டப் பகுதிகளிலே வசிக்கக்கூடிய மக்களுக்குப் பிரதேச சபைகளின் சேவை முழுமையாகக் கிடைப்பதில் சட்டச் சிக்கல்கள் இருப்பதன் காரணமாக, அந்த 1987ஆம் ஆண்டின் 15ஆம் இலக்கச் சட்டம் திருத்தப்பட வேண்டும் என்பதான ஒரு பிரேரணையை முன்வைத்திருந்தேன். அது போலத்தான் பெருந்தோட்டப் பகுதிகளிலே நிருவகிக்கக்கூடிய பாலர் பாடசாலைகளை யார் நடத்துவது என்பது தொடர்பில் இன்னும் பல்வேறு பிரச்சினைகள் காணப்படுகின்றன. பெருந்தோட்ட மனித வள அபிவிருத்தி நிறுவனம் இன்னும் தோட்ட முகாமைத்துவத்தின்கீழாக இருக்கக்கூடிய சிறுவர் பராமரிப்பு நிலையங்களின் ஊடாக அவற்றை முன்கொண்டு செல்ல முற்படுகின்றது. அதேபோல தன்னார்வத் தொண்டர் நிறுவனங்களும் தன்னார்வலர்களும் அவற்றை நிர்வகிக்க முற்படுகின்றார்கள். பிரதேச சபை இதற்குரிய அனுமதியைப் பெற்றுக்கொடுக்க வேண்டியிருக்கின்றது. எனவே, இவ் வாறான சிக்கல்கள் இருக்கின்ற கட்டத்தில் தேசிய ரீதியாகக் கொள்கையொன்றை வகுத்து, பாலர் பாடசாலை களை அபிவிருத்தி செய்வதற்கு இந்தப் பிரேரணையின்மூலம் கவனம் செலுத்தவேண்டுமெனக் கேட்டுக்கொண்டு, வாய்ப்பளித் தமைக்கு நன்றி கூறி, விடைபெறுகின்றேன்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟට, ගරු නිහාල් ගලප්පත්ති මැතිතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් වෙන් වී තිබෙනවා.

[අ.භා. 12.45]

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය විසින් ගෙනෙන ලද මේ යෝජනාව ඉතාම සුවිශේෂ, කාලීන යෝජනාවක් බව මා මේ මොහොතේ අවධාරණය කරනවා. අනාගත පරපුරේ, එනම් සිසු පරපුරේ තිඹිරි ගෙය තමයි පෙර පාසල, එහෙම නැත්නම් පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානය. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි කුඩා

කාලයේදී පෙර පාසල් ගැන අසා තිබුණේත් නැහැ; අපි ඒවාට ගියේත් නැහැ. ඔබතුමාට මතක ඇති, අපේ අධ්‍යාපනයේ තිඹිරි ගෙය වුණේ, අපේම ඉස්කෝලේ හෝඩියේ පන්තිය.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
පන්සල.

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
පන්සලේ තමයි අකුරු කියෙව්වේ. පන්සලේ ලොකු හාමුදුරුවෝ තමයි අකුරු කියෙව්වේ. ඊට පස්සේ තමයි ඉස්කෝලෙට ගියේ. හෝඩියේ පන්තිය, එහෙම නැත්නම් පහළ බාලාංශය කියලා තමයි ඒකට කිව්වේ. හැබැයි ඒක තිබුණේ පන්සලේ නොවෙයි, ඉස්කෝලේ; ඉස්කෝලෙට පිටින් නොවෙයි තිබුණේ. ඒ නිසා අපි ඉගෙන ගත්තේ ඒ පාසලේමයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හෝඩියේ පන්තියේදී අපට ඉගැන්වූවේ පුහුණුව ලැබූ ගුරුතුමියක්. අපි එතුමියට කිව්වේ, ලොකු ඉස්කෝලෙ හාමිනේ කියලායි, එහෙම නැත්නම් "ලොකු ටීචර්" කියලායි. හැබැයි අපි එතුමියට හරි බයයි. නමුත් එතුමිය අපට හරිම ආදරෙයි. ඒ වාගේම අපිත් එතුමියට හරිම ආදරෙයි. මීට දශක හතරකට පමණ පෙර තමයි මේ පෙර පාසල්, එහෙම නැත්නම් පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ආරම්භ වුණේ. අද අපේ රටේ සිසු පරපුරේ -අනාගත පරපුරේ- ඉරණම විසඳන තීරණාත්මක, සුවිශේෂී මධ්‍යස්ථානය තමයි මේ පෙර පාසල, එහෙම නැත්නම් පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානය. එතැනින් තමයි දරුවෙක් අගතිය කරා හෝ ප්‍රගතිය කරා යොමු වන්නේ කියන එක මා අවධාරණය කරනවා. එතැනින් වැරදුණොත්, එතැනින් ඇද වැටුණොත්, ඒ දරුවාගේ අනාගතය පිළිබඳව කථා කරන්න වෙනත් තැනක් ඉතුරු වන්නේ නැහැ. ඒ නිසා පූර්ව ළමාවිය මධ්‍යස්ථානය -පෙර පාසල- කියන්නේ ඉතාම සුවිශේෂී, ඉතාම තීරණාත්මක තැනක් බව මා අවධාරණය කරනවා. ඒ නිසාම මේ සඳහා රජයේ, අධ්‍යාපන අමාත්‍යවරුන්ගේ, අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉන්න සියලුම බලධාරින්ගේ සුවිශේෂී අවධානයක් යොමු විය යුතුමයි. නමුත් ඛේදවාචකය තමයි, ඉහත කී සියලුම අය, අධ්‍යාපන අමාත්‍යවරු, අගමැතිවරු, ජනාධිපතිවරු, ඒ වාගේම බලධාරින් -පෞද්ගලිකව හෝ සාමූහිකව- මේ පිළිබඳව තුට්ටුවකටවත් ගණන් නොගැනීම; නොසලකා හැර තිබීම; අයාලෙ යන්න ඉඩ හැර තිබීම. ඒක තමයි අපේ රටේ තිබෙන බරපතළම ඛේදවාචකය. ඒ නිසා මේ පිළිබඳව වැඩි වශයෙන් අවධානය යොමු කරලා, ප්‍රශස්ත මූල්‍ය දායකත්වයක් සපයලා, දරුවන්ගේ මානසික හා ශාරීරික ක්‍රියාකාරිත්වය සමබරව පවත්වා ගත හැකි සරල, විද්‍යාත්මක ක්‍රමවේදයක් පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවලට වහාම හඳුන්වා දිය යුතුයි කියලායි අපි විශ්වාස කරන්නේ.

පෙර පාසලේ පසු බිම ඉතාම වැදගත් වෙනවා. එය ක්‍රමවත් වෙන්න ඕනෑ. ඒ වාගේම ඒ ස්ථානය දරුවන්ගේ මානසික සහ ශාරීරික ක්‍රියාකාරකම් නිදහස්ව, ඉතාම සරලව කරගෙන යන්න පුළුවන්, ඉඩකඩ තිබෙන ස්ථානයක් බවට පත් වෙන්න ඕනෑ. ඒ වාගේම දරුවාගේ මානසික හා ශාරීරික ක්‍රියාකාරකම් වර්ධනයට සෙල්ලම් මිදුල ඉතාම අත්‍යවශ්‍යයි. ඒක පෙර පාසලකට ඉතාම අත්‍යවශ්‍යයි. අපේ රටේ තිබෙන පෙර පාසල්වලින් සියයට 25කවත් සෙල්ලම් මිදුලක් තිබෙනවාය කියලා මම නම් හිතන්නේ නැහැ. එහෙම නැති වුණාම දරුවන් ඉගෙන ගන්නේ නැහැ. දරුවන්ගේ ක්‍රියාකාරකම් හරියාකාරව සිදු වන්නේ නැහැ. ඔවුන් ගර්හිත දරුවන් බවට පත් වෙනවා. ඒ වාගේම ඒ ස්ථානය ඉඩකඩ තිබෙන ස්ථානයක් වෙන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දැකලා තිබෙනවා, අපට අත් දැකීම් තිබෙනවා, සමහර ස්ථානවල සැමන් ටින් අට්ටි ගැහුවා වාගෙයි. එවැනි ස්ථානවල දරුවන් එකිනෙකාට තද වෙලා - කිටි කිටියේ තද වෙලා- තමයි ඉගෙන ගන්නේ. ඒවා කෙරෙහි අවධානය යොමු වෙලාම නැහැ. ඒ වාගේ ස්ථානයකදී දරුවන්ට ඉගෙනීමේ කටයුතු කර ගන්න පහසු තත්ත්වයක් ඇති වෙන්නේ නැහැ.

ඒ වාගේම, ඒ ස්ථානවල අනිවාර්යයෙන්ම දරුවාට ගැළපෙන ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ ස්ථාපිත කළ යුතුයි. ඒ වාගේම සිත් ඇද ගන්නා පරිසරයක් එම ස්ථානවල තිබිය යුතුමයි. එහෙම වුණොත් පමණයි මේ මධ්‍යස්ථානවලින් ලැබෙන මඟපෙන්වීම තුළින් දරුවා සාර්ථක ලෙස අනාගතයට පා පොඩි ඔසවන්නේ. එම නිසා පෙර පාසල් ගුරුවරියට අනිවාර්යයෙන්ම සුවිශේෂී පුහුණුවක් ලබා දිය යුතුමයි. එහෙම නැති වුණොත් ඒ දරුවන්ගේ අනාගතය අඳුරු වෙන්නට ඉඩ තිබෙනවා. එම නිසා රජය, ආණ්ඩුව සහ අධ්‍යාපන බලධාරීන් මැදිහත්වෙලා පෙර පාසල් අධ්‍යාපනය සුවිශේෂී වගකීමක් වශයෙන් තේරුම් අරගෙන ඒ සඳහා අවශ්‍ය සියලුම භෞතික හා මානව සම්පත් ලබා දීලා -ඒ කියන්නේ මූල්‍ය සම්පත් ලබා දීලා- පෙර පාසල් අධ්‍යාපනය ශක්තිමත් කරන්න කියන ඉල්ලීම අපි කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව අපි කරගෙන යන කාලයේ සුවිශේෂී පෙර පාසල් තුනක් ආරම්භ කළා. ඒ තමයි, උද්දකන්දර පෙර පාසල, දඩවිල පෙර පාසල සහ කිරින්ද පෙර පාසල. මේ තුළින් දරුවා පාසලේ පළමු වසරට ඇතුළත් වන විට ඉතාමත්ම සාර්ථක විධියට ඒ අයගේ ශාරීරික, මානසික තත්ත්වයන් වර්ධනය කරලා සූදානම් කරන්නට හැකි වෙලා තිබෙනවා. ඒ වාගේම වෛද්‍යවරු ගෙන්වලා දරුවාගේ සෞඛ්‍ය තත්ත්වයන් සම්බන්ධයෙන් වෙනම file එකක් හදලා ඒ දරුවන් ඇතුළත් වන පාසල්වලට යැව්වා. ඒ විධියට ඉතාමත්ම සාර්ථක පෙර පාසල් ක්‍රියාත්මක වුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම නිසා "හොඳම දේ දරුවන්ට" කියන වාක්‍ය ඛණ්ඩය තොල් මතුර මතුරා ඉන්නේ නැතිව, මේ දරුවන්ගේ අනාගත පැවැත්ම සඳහා ඉතාමත්ම ප්‍රශස්ත හා ප්‍රායෝගික අර්ථයක් ලබාදීමට වර්තමාන යහ පාලන ආණ්ඩුව ක්‍රියාත්මක විය යුතුයි කියන කාරණය අවධාරණය කරමින් මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

[අ.භා. 12.52]

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය ඉදිරිපත් කළ යෝජනාව ඉතාමත්ම කාලෝචිත සහ වටිනා යෝජනාවක්. මේ යෝජනාවටම තවත් වැදගත් කාරණයක් එකතු කරමින් මගේ කථාව පටන් ගන්නට කැමැතියි.

අපි දන්නවා, අද රටේ පාසල් අධ්‍යාපනය රැඳී පවතින්නේ විද්‍යාපීඨ ගුරුවරුන් නිසා බව. මේ විද්‍යාපීඨ සංකල්පය අපේ ගරු අග්‍රාමාත්‍යතුමා අධ්‍යාපන අමාත්‍යවරයාව සිටි කාලයේ ආරම්භ කළ එකක්. එම සංකල්පය තුළ මේ රටේ පාසල් අධ්‍යාපනය ඉතාමත් හොඳින් රැඳී පවතිනවා. රටට අවශ්‍ය විධියේ පාඨමාලාවක් හැටියටයි එදා මේ විද්‍යාපීඨ ඇති කළේ. ඒ වාගේම මම රජයෙන් ඉල්ලීමක් කරන්නට කැමැතියි. අපේ රටේ පෙර පාසල් ගුරුවරුන් පුහුණු කරන්නට රාජ්‍ය ආයතන නැහැ. එම නිසා පළාතකට එක බැගින්වත් පෙර පාසල් ගුරුවරුන් පුහුණු කිරීම සඳහා වන විද්‍යාපීඨ ආරම්භ කළ යුතුයි. එවැනි විද්‍යාපීඨ ආරම්භ කළොත්

[ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා]

අපේ ගරු මන්ත්‍රීතුමිය යෝජනා කළා වාගේ මනෝ විද්‍යාව සහ පෙර පාසල් සඳහා අවශ්‍ය විවිධ විෂයයන් ඒකාබද්ධ වුණු ඉතාමත් හොඳ පාඨමාලාවක් ආරම්භ කිරීමට හැකි වෙනවා.

පෙර පාසල් ගැන කථා කරනවා වාගේම අපි විශ්වවිද්‍යාල ගැනත් කථා කළ යුතුයි. අද උදේ විශ්වවිද්‍යාල ගැන කථා කළ නිසා ඒ සම්බන්ධයෙනුත් පොඩ්ඩක් කථා කිරීමට මම අවසරය ඉල්ලා සිටිනවා. මොකද, මේ පෙර පාසල් යන දරුවාට අවසානයේ යන්නට තිබෙන්නේ රාජ්‍ය විශ්වවිද්‍යාල. රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය පෞද්ගලිකරණය කරන්නට රජය හැටියට අපි කිසිමදාක හිතලාවත් නැහැ; කරන්නෙත් නැහැ. අපි රජය ලෙස ප්‍රතිපත්තිමය තීරණයක සිටිනවා රාජ්‍ය විශ්වවිද්‍යාලවලට දැනට වසරකට ඇතුළත් කර ගන්නා 27,000ක සිසුන් ප්‍රමාණය 2020 වන විට 50,000 දක්වා වැඩි කරනවා කියලා. ඒක තමයි අපේ අනාගත සැලසුම. ඒ වාගේම අද පත්තරයේ පළ වෙලා තිබුණා, පේරාදෙණිය විශ්වවිද්‍යාලය සහ කොළඹ විශ්වවිද්‍යාලය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් අයින් කරලා මුදල් උපයන ආයතන බවට පත් කරනවා කියන කථාවක්. මේ කථාව කොළඹ විශ්වවිද්‍යාලයේ උපකුලපතිතුමා COPE එකේ උසස් අධ්‍යාපනය පිළිබඳ අනු කමිටුවේදී කිව්වා කියන කාරණය තමයි සඳහන් වෙලා තිබුණේ. ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා මගේ නමත් සඳහන් කරමින් මේ ගැන ප්‍රකාශ කළා.

මේ සම්බන්ධයෙන් අපි පැහැදිලිවම කිවයුතුයි. කොළඹ විශ්වවිද්‍යාලයේ උපකුලපතිතුමා ඇතුළු කොළඹ විශ්වවිද්‍යාලයේ ආචාර්ය - මහාචාර්යවරුන් ගෙනැල්ලා අපි කථා කළා.

විශ්වවිද්‍යාල UGC එකෙන් ගලවලා මුදල් උපයන ආයතන බවට පත් කරන්න නොවෙයි කථා කළේ. ආංශික අධීක්ෂණ කාරක සභා ගැන පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. ආංශික අධීක්ෂණ කාරක සභා තිබෙන්නේ මන්ත්‍රීවරුන්ට රජයේ පාලනයට අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයේදී දායක වෙන්නයි. එතකොට අපට විවිධ අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්; අපට සාකච්ඡා කරන්නත් පුළුවන්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමා විවාදයේද ඉන්නේ?

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
මට අවස්ථාව දෙන්න. මේක පෙර පාසල් දරුවන්ට සම්බන්ධ කරුණක්. මොකද, පෙර පාසල් දරුවෝ තමයි ඉගෙන ගෙන අවසානයේ විශ්වවිද්‍යාලවලට යන්නේ. අපි මෙතැනදී පැහැදිලිව සාකච්ඡා කළේ දැනට විශ්වවිද්‍යාලවල තිබෙන ප්‍රශ්න ගැන. විශ්වවිද්‍යාලවල තිබෙන ප්‍රධානම ප්‍රශ්නයක් තමයි, ආචාර්යවරුන්ගේ හිඟය. පුරප්පාඩු තිබෙනවා. නමුත්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ පත් කිරීම් සම්බන්ධව යම් යම් බාධා තිබෙන නිසා එම පුරප්පාඩු සම්පූර්ණ කර ගන්න විධියක් නැහැ. ඊට අමතරව විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ට පර්යේෂණ කරන්න, විශ්වවිද්‍යාලවල අලුතින් පාඨමාලා පටන් ගන්න විවිධ බාධා තිබෙනවා. මේ බාධා ඉවත් කිරීමට සුදුසු ක්‍රමයක් හැටියට කොළඹ විශ්වවිද්‍යාලයේ උපකුලපතිතුමා කියා සිටියා, -සියලු උපකුලපතිවරු එකතු වෙලා කථා කළා- විශ්වවිද්‍යාලවල Autonomy and Governance ගැන පර්යේෂණයක් කළා කියලා. මේ පර්යේෂණය ගැන අපි සාකච්ඡා කළා. මේ අවස්ථාවේදී අපි සාකච්ඡා කළේ Autonomy and Governance කොහොමද විශ්වවිද්‍යාලවලට ලබා දෙන්නේ කියලා. ඒ හැර අපි කිසිම තැනක සාකච්ඡා කළේ නැහැ, විශ්වවිද්‍යාල සම්පූර්ණයෙන් ස්වාධීන කරලා විශ්වවිද්‍යාලවල අලුතින් පාඨමාලා පටන් ගන්න-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා විෂය අදාළව කථා කළා නම් හොඳයි.

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
මම විෂයට එන්නම්. මට විෂයට එන්න පොඩ්ඩක් ඉඩ දෙන්න. එවැනි පාඨමාලා පටන් ගන්න අපි අවස්ථාව හදලා නැහැ. උදාහරණයකට මම කලින් කියපු පෙර පාසල් ගුරුවරුන් - පොඩ්ඩක් ඉන්න, මට අවස්ථාව දෙන්න.-පුහුණු කිරීම වාගේ පාඨමාලා විශ්වවිද්‍යාල ඇතුළේ පටන් ගන්න පුළුවන්. අපට විද්‍යා පීඨ වාගේම, විශ්වවිද්‍යාල ඇතුළේත් මෙවැනි පාඨමාලා පටන් ගන්න පුළුවන්. ඒ අවස්ථාව දෙන්න නම් එම සාකච්ඡාව විශ්වවිද්‍යාල තුළ ඇති විය යුතු වෙනවා. එහෙම වුණොත් විතරයි මේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ සියලුම තැන්වලට බද්ධ වෙච්ච අධ්‍යාපන ක්‍රමයක් යන්නේ. විශ්වවිද්‍යාල සහ පෙර පාසල් ආදී සියලු කාරණා බද්ධ වෙච්ච අධ්‍යාපන ක්‍රමයක් තමයි මේ රටේ තිබුණේ. නොමිලේ අධ්‍යාපනය ලබා ගන්න ක්‍රමවේදය මේ රටේ ස්ථාපිත විය යුතුයි. ඒකට කිසි විටෙක අපි ඇඟිලි ගහන්නේ නැහැ. ඒ වාගේ දෙයක් කරන්න රජයක් හැටියට කිසිම ප්‍රතිපත්තියක් නැහැ. පට්ටපල් බොරු තමයි මේ පත්තරවලින් කියන්නේ. ඊයේ මහින්ද රාජපක්ෂ මහත්මයා, මාත් එක්ක වාදයකට පැටලුණා. ඒවායේ ප්‍රතිඵලද දන්නේ නැහැ, මේ විධියට පත්තරවලින් එන්නේ. සමහර වේලාවට මේ දේවල් දේශපාලන කුමන්ත්‍රණ වෙන්නත් පුළුවන්. අපට මේ පාර්ලිමේන්තුවේ කථා කරන්න, විවාද කරන්න අයිතිය තිබෙනවා. ඒ අයිතිය යටතේ තමයි අපි අධ්‍යාපනය සම්බන්ධයෙන් කථා කරන්නේ; අධ්‍යාපනය සම්බන්ධයෙන් පර්යේෂණ කරන්නේ. එම නිසා පෙර පාසල් දරුවන්ගේ අධ්‍යාපනය, විශ්වවිද්‍යාල දරුවන්ගේ අධ්‍යාපනය ආදී මේ සියලු දේවල් ඒකාබද්ධ වෙච්ච දේවල් හැටියටයි මේ රටේ තිබෙන්නේ. කොළඹ විශ්වවිද්‍යාලයත්, පේරාදෙණිය විශ්වවිද්‍යාලයත් UGC එකෙන් ගලවලා මුදල් උපයන ආයතන බවට පත් කරන්න අපි කිසිම වේලාවක උත්සාහ කරන්නේ නැහැ.

විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ට විශ්වවිද්‍යාල ඇතුළේ වැඩ කරන්න තිබෙන බාධා ඉවත් කරලා, නිදහස ලබා දීම ගැනයි සාකච්ඡා කළේ. මේක වැරදි වැටහීමක්. අපි මේ වැරදි වැටහීම නිවැරදි කළ යුතු වෙනවා. අවසාන වශයෙන් මම යෝජනා කරන පාඨමාලා, ඒ කියන්නේ පෙර පාසල් ගුරුවරුන් පුහුණු කිරීමේ පාඨමාලා අපට ඇත්තටම විශ්වවිද්‍යාල ඇතුළේ පටන් ගන්න පුළුවන්. මේ රටේ පළාත් නවය ඇතුළත තිබෙන පෞද්ගලිකව පාලනය වන පෙර පාසල් ගත්තොත්, එම පෙර පාසල්වල ගුරුවරුන් කොහොමද පුහුණු වුණේ කියන එක, කොහොමද දැනුම ලබා ගත්තේ කියන එක අපි කවුරුත් දන්නේ නැහැ. සමහර විට විවිධ ආයතන, පෙර පාසල් මඟින් නිකුත් කරන ලද සහතික මත පූර්ව ළමා වියේ දරුවන්ට අධ්‍යාපනය ලබා දෙනවා. මෙන්න මේ අය සඳහා පැහැදිලි ප්‍රතිපත්තිමය තීරණයක් ලබා ගත යුතු වෙනවා.

මෙම අවස්ථාවේ මේ ගරු සභාවේ උසස් අධ්‍යාපන ඇමැතිතුමාත් ඉන්නවා. අපි ඇමැතිතුමාට යෝජනා කරනවා විශ්වවිද්‍යාල ඇතුළේ හෝ පාඨමාලා පටන් ගන්න කියලා.

එතකොට අපේ රටේ තරුණ තරුණියන්ට ඉදිරියේදී තමන්ගේ වෘත්තීය මට්ටම වැඩිදියුණු කර ගන්න පුළුවන්. ඒ වාගේ අවස්ථාවල කොළඹ විශ්වවිද්‍යාලය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය වාගේ විශ්වවිද්‍යාල ඔක්කොම නිදහසේ හිතලා අලුතින් පාඨමාලා පටන් ගන්නයි තිබෙන්නේ. එම පරිසරය සෑදිය යුතුයි කියලා මම යෝජනා කරනවා.

[අ.භා. 1.00]

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. පෙර පාසල් අධ්‍යාපනය විධිමත් කිරීම සම්බන්ධයෙන් රෝහිණී කුමාරි මන්ත්‍රීතුමිය ඉදිරිපත් කරන ලද යෝජනාව මමත් ස්ථිර කරනවා. විශේෂයෙන්ම පෙර පාසල් අධ්‍යාපනය ගැන කථා කරද්දී ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවුරුදු තුන, හතර, පහ කියන වයස්වල දරුවෝ තමයි පෙර පාසලට යන්නේ. අද අපේ රටේ තිබෙන පෙර පාසල් ගැන බලනකොට, වැඩි ප්‍රතිශතයක් අපේ රටේ තිබෙන සමාජයීය ප්‍රශ්නවලට ගැළපෙන පරිදි ඒ අවශ්‍ය ප්‍රමිතිය සකස් වෙලා නැහැ. පෙර පාසල් අධ්‍යාපනය ලබා දෙන ගුරුවරියට අවම සුදුසුකමක් කොහේවත් නියම කරලා නැහැ. ඒ වාගේම ඒ අය හදාරලා තිබෙන්න ඕනෑ පාඨමාලා මොනවාද කියන කාරණා සම්බන්ධයෙන් ඇත්තටම රජයක් විධියට මැදිහත් වෙලා වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයි.

උග්‍ර ජාතිවාදී කණ්ඩායම්, උග්‍ර ආගම්වාදී කණ්ඩායම්, උග්‍ර පන්ති භේදය තිබෙන කණ්ඩායම් අද අපි දකිනවා. මේ ප්‍රශ්නවලට අපි පිළිතුරු සෙවිය යුත්තේ මේ දරුවා සමාජයෙන් යම් යම් දේවල් ලබා ගන්නා අවස්ථාවේමයි; සමාජයෙන් ඉගෙන ගන්න පටන් ගන්න වෙලාවේමයි. මූලික අධ්‍යාපනයේ ඉඳන් ඇති වෙලා තිබෙන මේ තත්ත්වයන් එක්ක අපේ රට තුළ මේ වනකොට සහනයක් නැති, සමානාත්මතාවක් දකින්න බැරි, කාටත් එක විධියට සලකන්න බැරි සමාජයකුයි බිහි වෙලා තිබෙන්නේ. එම නිසා අපේ රටේ පෙර පාසල් අධ්‍යාපනය ගැන අපේ මේ ගරු සභාවට අපේ මන්ත්‍රීවරු කරුණු එකතු කළා. ඊට අමතරව මම මේ කාරණය කියන්න කැමැතියි. මේ රටට ගැළපෙන විධියට, රටේ අනාගතය වෙනුවෙන් අපි විසඳිය යුතු ප්‍රශ්න තිබෙනවා. විශේෂයෙන් ජාතීන් අතර ප්‍රශ්න ඇති නොවන්නට, ආගම් අතර ප්‍රශ්න ඇති නොවන්නට, පන්තීන් අතර ප්‍රශ්න ඇති නොවන්නට සියලුදෙනාට සමානාත්මතාවෙන් සලකන සමාජයක් බිහි කරන්නට අවශ්‍ය කරන විධියේ පාඨමාලාවක් දරුවන්ට දෙන්නට පුළුවන් වෙන විධියට ගුරුවරු දැනුවත් කරලා, ගුරුවරුන්ට ඒ දැනුම දීලා සකස් කරන්න ඕනෑ.

මම විශ්වාස කරන්නේ යම් කිසි පරාසයක් තුළ මේ විෂය කරුණු දරුවාට උගන්වන එක නොවෙයි, -අකුරු ලියන්න උගන්වන එකද, ඉංග්‍රීසි වචන කියන්න උගන්වන එකද නොවෙයි,- පුංචි කාලයේ ඉඳන්ම හොඳ ආකල්ප හදන්න ඕනෑ. ඉගෙන ගන්න එක දරුවන්ට තිබෙන බුද්ධි මට්ටමේ හැටියට ඒ ළමයින් ඉදිරියේදී කර ගනීවි. ඒක නිසා හොඳ ආකල්පවලින් සම්පූර්ණ, දැනුම තිබෙන, හොඳ පෞරුෂයක් තිබෙන රටට අවශ්‍ය කරන දරුවෙකු බිහි කරන්නට පෙර පාසල් සම්බන්ධයෙන් අවශ්‍ය කරන විෂය නිර්දේශයක් සකස් විය යුතුයි. ඒ වාගේම පෙර පාසල් හැම තැනම තිබෙනවා. රෝහිණී කුමාරි මන්ත්‍රීතුමිය කිව්වා වාගේ මේක ස්වයං රැකියාවක් විධියට හැමෝම ගෙවල් කිට්ටුව ගෙවල් ටිකක් වට කරගෙන පෙර පාසලක් පටන් ගන්නවා. එහෙම නොවෙයි, ප්‍රමිතියෙන් යුතු පෙර පාසල් ක්‍රමයක් මේ රටේ ඇති කරන්න ඕනෑ.

පෙර පාසල් ගුරුවරුන් මේ ළමයින්ට උගන්වලා සල්ලි හොයාගෙන ජීවත් වෙන ක්‍රමයක් නොවෙයි ඇති කළ යුතු වන්නේ. අපේ හිටපු ජනාධිපතිතුමා -මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා- 2014 අය වැයේදී පෙර පාසල් ගුරුවරුන්ට රුපියල් 2,500ක දීමනාවක් දෙන්න තීරණය කළා. ඒකත් යහපාලන ආණ්ඩුව ආවාට පස්සේ ක්‍රියාත්මක වුණේ නැහැ. මම කියන්නේ රුපියල් 2,500 නොවෙයි, ඊට වඩා සාධාරණත්වයක් කරන්න කියලායි. ඒ ගුරුවරුන්ට ළමයි ගණන එකතු කරගෙන ඒ මත යැපෙන්න ඉඩ දෙන්න හොඳ නැහැ. පෙර පාසල් ගුරුවරුන් විශාල සමාජ මෙහෙවරකුයි කරන්නේ. ඒ අයට අවශ්‍ය දැනුම සහ ඒ අයට අවශ්‍ය පාඨමාලා හදාරන්න අවස්ථාව දෙනවා වාගේම ඒ අයට ජීවත් වෙන්නත් අවශ්‍ය කරන පසු බිම සකස් කළ යුතුයි. අහිංසක කාන්තාවන් තමයි පෙර පාසල් ගුරුවරියන් විධියට ඉන්නේ. ඒක නිසා යම් කිසි දීමනාවක් ලබා දෙන එකත් බොහොම සාධාරණ විධියට කළ යුතුයි කියන යෝජනාව කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

මීළඟට, ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා.

[අ.භා. 1.05]

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙවැනි යෝජනාවක් ඉදිරිපත් කිරීම ගැන ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමියට ප්‍රථමයෙන්ම මගේ ස්තුතිය පුද කර සිටිනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

එතුමියත් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉඳලා නේ පාර්ලිමේන්තුවට ඇවිත් තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

ඒක තමයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එතුමිය දේශපාලනයට පිවිසුණත්, ගුරු වෘත්තිය පිළිබඳව තිබෙන ඇල්ම බැල්ම තවම අඩු කර නැහැ. ඒ නිසාම එතුමිය මෙවැනි හරවත් යෝජනා ගෙන එනවා. මෙවැනි යෝජනා ගෙන එන කොට මීට වග කිව යුතු අමාත්‍යාංශවල අමාත්‍යවරුන් මේ ගරු සභාවේ හිටියා නම්, තමන්ගේ අමාත්‍යාංශයේ වැඩි වර්ධනය සඳහා මේ මන්ත්‍රීවරුන්ගෙන් බොහොම සාධනීය කරුණු එකතු කර ගතහැකිව තිබුණා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමනි, මේක පළාත් සභාවට අයිති විෂයයක් නේද?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

ඒ සම්බන්ධව පළාත් සභා ප්‍රඥප්තියක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. සමහර තැන්වල පළාත් පාලන

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

ආයතන මඟින් පෙර පාසල් පවත්වාගෙන යනවා. නමුත්, මේ පෙර පාසල් අධ්‍යාපනය කියන්නේ අපේ රටේ ජාතික අධ්‍යාපනයට ඇතුළත් විය යුතු සුවිශේෂී කොටසක් කියා අප හිතනවා. එහෙම නැතිව, තැන් තැන්වලින් පෞද්ගලිකව හෝ පළාත් පාලන ආයතන තමන්ගේ හිතු මනාපයට මේ කාර්යය කරන්න ගියොත් රටේ අධ්‍යාපනය ආරම්භ වන තැන තමයි අඩාළ වන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත් දන්නවා, මේ පෙර පාසල් අධ්‍යාපනයට ලෝකයේ වසර සියයකට වැඩි ඉතිහාසයක් තිබෙන බව. වෛද්‍යවරියක හා අධ්‍යාපන විශේෂඥවරියක වුණු මාරියා මොන්ටිසෝරි මැතිනිය තමයි ඉතාලියේ, රෝමයේදී 1907 පමණ කාලයේදී මේ "මොන්ටිසෝරි" අධ්‍යාපනය කියන සංකල්පය ආරම්භ කළේ. අප පෙර පාසල් ගුරුවරුන්ගේ හැකියා සහ ඔවුන්ගේ අධ්‍යාපන විශේෂඥභාවය වැඩිදියුණු කරන්න යෝජනා ගණනාවක් ඉදිරිපත් කළා.

රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමියගේ යෝජනාවේ වැදගත් කරුණු කීපයක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඉන් එකක් තමයි, පෙර පාසල්වල භෞතික පහසුකම් පවත්වා ගැනීම වැඩිදියුණු කිරීමටත්, පෙර පාසල් පාලිකාවන් සඳහා නිශ්චිත වැටුප් සහ දීමනා ලබාදීමටත් කටයුතු කළ යුතුය කියන කාරණයත්. ඇත්තටම මේ යෝජනා ගැන සංකල්ප ගොඩක් ඉදිරිපත් කරන්න අපට පුළුවන්. නමුත්, ආණ්ඩුවක් හැටියට සූදානම් වෙන්න ඕනෑ, ඒ සඳහා අවශ්‍ය කරන මුල්‍ය ප්‍රතිපාදන වෙන් කරන්න. නැත්නම් මෙහි ගුණාත්මක තත්ත්වය ඉහළ නංවන්න හැකියාවක් ලැබෙන්නේ නැහැ.

'පෙර පාසල්' කියන විෂයය අයත් වන ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශයට පසු ගිය අය වැයෙන් වෙන් කළේ රුපියල් මිලියන 100යි. ඒ මුදල වෙන් කළේ පෙර පාසල්වලට විතරක් නොවෙයි. කනගාටුවට කාරණය ඒකයි. රුපියල් මිලියන 100කින් පෙර පාසල්වලටත් මොනවා හෝ කරලා ළමයින් හා කාන්තාවන් වෙනුවෙන් කරන්න පුළුවන් මොනවාද කියන එකයි අපට තිබෙන ප්‍රශ්නය. හැබැයි, එහෙම තියෙද්දි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් මේ මගේ අතේ තිබෙන පරිපූරක ඇස්තමේන්තුවෙන් ඇමතිවරුන්ගේ ගෙවල් තුනක් අලුත්වැඩියාවටත්, ඇමතිවරු දෙදෙනෙකුට වාහන ගන්නත් රුපියල් මිලියන 125කට වැඩි මුදලක් වෙන් කර තිබෙනවා. මම අහන්නේ, මේ ඇමතිවරුන්ට වාහන අරගෙන දැන් ඇති වෙලා නැද්ද කියායි. පසු ගිය ආණ්ඩුව කාලයේත් ඇමතිවරු වාහන පාවිච්චි කළා. රාජපක්ෂ පාලනය තුළ ඇමතිවරු 110ක් හිටියා. ඒ ඇමතිවරු ගියේ පයින් නොවෙයි; බර කරත්තෙන් හෝ ගොන් කරත්තෙන් නොවෙයි. ඔවුන් පාවිච්චි කළ වාහන අමාත්‍යාංශයට තියෙන්න ඕනෑ. මේ පාර්ලිමේන්තුවට පරිපූරක ඉදිරිපත් කර කර, හැම දාම ඇමතිවරුන්ට වාහන ගන්න රුපියල් කෝටි ගණන් වෙන් කර ගන්නවා. එහෙම තියෙද්දි, පෙර පාසල් නඩත්තුවටත්, එම ගුරුවරුන්ගේ යැපීම් දීමනා වෙනුවෙනුත් මුදලක් වියදම් කරන්නේ නැහැ. රුපියල් 2,500කින් පෙර පාසල් භාර ආචාර්යවරියකට මොකක්ද කරන්න පුළුවන්? මම දන්නේ නැහැ, ඒ උපදෙස් දුන්නේ අර රුපියල් 2,500කින් පවුලක් නඩත්තු කරන්න පුළුවන් කියපු නිසාද කියලා. හැබැයි, මේ රුපියල් 2,500ත් අවසානයේ රුපියල් 250ට අඩු වෙලා තිබෙන්නේ. ඔවුන්ට ප්‍රමාණවත් දීමනාවක් දෙන්නේ නැතිව, ඔවුන් මානසිකව තෘප්තියට පත් කරන්නේ නැතිව, ඔවුන් කොහොමද මේ අවුරුදු තුනේ, හතරේ, පහේ දරුවන් වෙනුවෙන් යම් සේවයක් කරන්නේ? ඒ නිසා ඇත්තටම මේ යෝජනාව සාර්ථකභාවයට පත් වෙන්න නම්, ආණ්ඩුව විසින් තීන්දුවක් ගත යුතුව තිබෙනවා. ඒක තමයි, පෙර පාසල් අධ්‍යාපනය ජාතික අධ්‍යාපනයේ කොටසක්ය කියලා හිතලා වැඩ කටයුතු කිරීම. මේ වෙනුවෙන් යම්කිසි ප්‍රශස්ත මුදල් ප්‍රමාණයක් වෙන් නොකර, මෙතැනින් එහා අපට මේ ගැන සාකච්ඡා කරන්න බැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම තව ඉල්ලීමක් කරන්න කැමැතියි. පසු ගිය දිනවල ඇති වුණු ගංවතුර නිසා අපේ දිස්ත්‍රික්කයේ විතරක් බුලත්සිංහල, මිල්ලනිය, අගලවත්ත කියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලත්, පාලින්ද නුවරත් තිබෙන පෙර පාසල් ගණනාවක් විනාශයට පත් වෙලා තිබෙනවා. ඒ බොහොමයක් පෞද්ගලික පෙර පාසල්; දරුවන් 40ක්, 50ක් ඉන්න තැන්. එම දරුවන්ගේ දෙමව්පියන්ගේ අනුග්‍රහයෙන් පමණක් ඒ පෙර පාසල් ප්‍රතිසංස්කරණය කරන්න බැහැ. එම නිසා ඔවුන් යම්කිසි මුදලක්, ආධාරයක් බලාපොරොත්තු වෙනවා. නමුත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් මේ වනතෙක් ඒ පිළිබඳව ප්‍රමාණවත් අවධානයක් යොමු කර තිබෙන බවක් මා දන්නේ නැහැ. දැන් අපට වුවමනාව තිබෙන්නේ මොකක්ද? රටේ අවධානය බොහෝ වෙලාවට යොමු වෙන්නේ විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපනය පිළිබඳව සහ පාසල් අධ්‍යාපනය පිළිබඳවයි. එම නිසා මේ පෙර පාසල් පිළිබඳව තිබෙන අවධානය ඉතාම සීමිත වෙලා තිබෙන්නේ. අපේ ගම්වල සිටින, සමහර විට උසස් පෙළ විභාගය සමත් වුණු, එහෙම නැත්නම් වෙනත් රැකියාවක් නොකරන තරුණියන් මැදිහත් වෙලා, වසර ගණනාවක් තිස්සේ මේ පෙර පාසල් අධ්‍යාපනය ලබා දීම් කරගෙන යනවා. ඔවුන් කරන සේවයට යම් ගෞරවයක් තිබෙන්නත් ඕනෑ. නමුත්, ඊට වඩා එහාට ගිය වැඩ පිළිවෙළකුත් තිබෙන්න ඕනෑ.

අපේ රටේ රැකියා නැති උපාධිධාරීන් ඉන්නවා. අපි මීට කලින් යෝජනාවේ කථා කළා, උපාධිධාරීන්ට රැකියා ලබා දීමේ නිසි ක්‍රමවේදයක් හදන්න ඕනෑයි කියලා. ඒ නිසා විශේෂවේදී උපාධිය ගත්ත -උපාධිධාරීන් සංඛ්‍යාවක් බඳවා ගෙන මේ දරුවන්ගේ මුල් ළමාවිය සංවර්ධනය විධිමත් කිරීම සඳහා යම් වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයි. අවශ්‍ය නම් අපට පුළුවන්, මේ වෙනුවෙන් විශ්වවිද්‍යාලවල අලුත් පාඨමාලා බිහි කරන්නත්. ඒ සඳහා අපේ ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාවට අපේ පූර්ණ සහාය ලබා දෙමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟට, ගරු ජානක වක්කුඹුර මන්ත්‍රීතුමා.

[අ.භා. 1.11]

**ගරු ජානක වක්කුඹුර මහතා**
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය ගෙනා යෝජනාව බොහොම කාලෝචිත යෝජනාවක්. ඒ යෝජනාව ගෙනෙන කොට එක්තරා සිද්ධියක් මගේ මතකයට ආවා. එනම්, පසු ගිය මැයි මාසයේ 25 වැනිදා දවසපුරා වැහැලා, 26 වැනිදා වන කොට මේ රටේ බොහෝ ප්‍රදේශවල ගංවතුර ගලලා කඳු නාය යාම් සිදු වූ අවස්ථාවේ, කලවාන මැතිවරණ කොට්ඨාසයේ වේවැල්කඳුර ප්‍රදේශයේත් නාය යාම හේතුවෙන් 13දෙනකු මිය ගියා. එහිදී කලවාන පෙර පාසල් සංගමයේ සභාපතිතුමිය වන චන්ද්‍රා පනාවල ගුරු මාතාවත්, දරුවන් දෙදෙනාත්, ස්වාමි පුරුෂයාත් -මුළු පවුලම- එයට හසු වී මිය ගියා. එතුමිය අවුරුදු 17ක් පෙර පාසල් ගුරුවරියක හැටියට කටයුතු කළා. එතුමියට නිවන් සුව ප්‍රාර්ථනා කරමින් මේ

යෝජනාව සම්බන්ධයෙන් අදහස් කිහිපයක් ප්‍රකාශ කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ දරුවන් මුලින්ම ගෙදරදී 'අ' යන්න කිව්වාට පස්සේ පෙර පාසලට ගිහිල්ලා යමක් ඉගෙන ගන්නවා. අපි දන්නවා, ඉස්කෝලයට යන්න නිශ්චිත වයසක් තිබෙන බව. හැබැයි, පෙර පාසල්වල ඉතා කුඩා වයසේ දරුවනුත් ඉන්නවා. ගෙවල්වල තියා ගන්න විධියක් නැතිවද කියා මා දන්නේ නැහැ, සමහර අය දරුවා සාමාන්‍යයෙන් ඇවිදින්න පටන් ගන්න කොටම පෙර පාසලට යවනවා. පෙර පාසලට ඇතුළත් කර ගැනීමේ ක්‍රියා පටිපාටියට යම් කිසි ප්‍රමිතියක් තිබෙන්න ඕනෑ. ඉස්කෝලෙට යන්න නියමිත වයස අවුරුදු 5 නම් පෙර පාසලට ඇතුළත් කර ගැනීමටත් එවැනි වයස් සීමාවක් තිබෙන්න ඕනෑ. ඇතැම් දරුවන් අවුරුදු දෙකක් පෙර පාසලට යනවා. ඊටත් වඩා කාලයක් පෙර පාසල් යන දරුවනුත් ඉන්නවා. ඒ නිසා මේ සඳහා යම් කිසි වැඩ පිළිවෙළක් තියෙන්න ඕනෑ. අපි පෙර පාසල්වලට කොච්චර වැඩ පිළිවෙළවල් හැදුවත් ඒවායේ අඩු පාඩු සොයා බලන්නේ නැහැ. පෙර පාසලක් register කරන්න ගියාම කියනවා, දරුවකුට මෙපමණ වර්ග අඩි ප්‍රමාණයක් ඕනෑ; මේ මේ පහසුකම් තිබෙන්න ඕනෑ; මේ මේ විධියට පෙර පාසල් කාමරය හදලා තිබෙන්න ඕනෑයි කියලා. මේවා කවුරුවත් ඉෂ්ට කරලා දුන්නේ නැත්නම් අර අහිංසක දරුවකුගෙන් රුපියල් 150ක්, 200ක් අරගෙන පෙර පාසලක් පවත්වා ගෙන යන්න බැහැ. ඒ නිසා අපි පෙර පාසලකට යම් කිසි මුදලක් දීලා ඒ වැඩ කටයුතු අංග සම්පූර්ණ කර දෙන්න ඕනෑ. අපේ රටේ දරුවන්ගෙන් සියයට 95ක් දැන් පෙර පාසල් අධ්‍යාපනය ලබනවා. පාසල් එන්න ඉස්සෙල්ලා මූලික අධ්‍යාපනය ලබන්නේ පෙර පාසලෙනුයි. ඒකට දැන් වෙනත් විධියේ තරගයකුත් තිබෙනවා.

නගරයේ පෙර පාසල්වලට ගියාම දරුවන් ගණන් හදනවා කියනවා; ඉංග්‍රීසි කථා කරනවා කියනවා. ඒවා පෙර පාසලේ උගන්වන්න කියලා කොහේවත් කියලා නැහැ; ප්‍රඥප්තිවලත් නැහැ. ක්‍රියාකාරකම්, හඳුනා ගැනීම් වාගේ ඒවායි පෙර පාසල් දරුවන්ට කරන්න තිබෙන්නේ. ඒ නිසා මේවා ගැන මීට වඩා හොයා බලා මේ කටයුතු විධිමත් කරන්න ඕනෑ. නගරයේ පෙර පාසල, ගමේ පෙර පාසලට වඩා ලස්සන වෙන්න පුළුවන්; අඩු පාඩු සම්පූර්ණ වෙන්න පුළුවන්. හැබැයි, එකම දේ ඉගැන්වීම වෙන්න ඕනෑ. කොළඹ පෙර පාසල සහ ගමේ පෙර පාසල කියලා syllabus එකේ වෙනසක් වෙන්නේ නැහැ; එකයි තිබෙන්නේ. එහෙම නම් මේ කටයුත්ත විධිමත්ව හරියට කෙරෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පෙර පාසල් විෂයය පළාත් සභාවේ විෂයක් කියලා කියනවා. ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා 2015 වර්ෂය සඳහා 2014 අය වැය ගෙනාපු අවස්ථාවේ අනෙකුත් කාරණා වාගේම පෙර පාසල් පාලිකාව ගැනත් හිතලා ඒ අයට රුපියල් 2,500ක මුදලක් මාස්පතා ගෙවන්න යෝජනාවක් ගෙනාවා; තව බොහෝ දේවල් දෙන්නත් ගෙනා යෝජනා තිබුණා. හැබැයි, 2015 ජනවාරි මාසයේ 29 වැනිදා මේ ආණ්ඩුව ගෙනා අතුරු අය වැයෙන්, රුපියල් 2,500න් එක බින්දුවක් කපලා එය රුපියල් 250 කළා. අද ඒ රුපියල් 250 ගන්න කවුරුවත් යන්නේ නැහැ. මොකද, AGA's office එකට ගිහිල්ලා කොළ පුරවන්න ගියාම රුපියල් 250ට වඩා වැඩි වියදමක් යනවා. ගරු සභානායකතුමා විතරයි මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නේ. ඒ නිසා එතුමාගෙන් හෝ ඉල්ලා සිටිනවා, දැනට අවුරුදු 2කට ඉස්සෙල්ලා ඉදිරිපත් වුණු රුපියල් 2,500ක් ලබා දීමේ යෝජනාවවත් අවම වශයෙන් ක්‍රියාත්මක කරන්නය කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දවස් පහක් පෙර පාසල් යන කොට අඩුම ගානේ සාරි තුනක්වත් ඒ පාලිකාවකට තිබෙන්න ඕනෑ. පෙර පාලිකාවකට ඒ සාරි ටික ගන්නවත් බැහැ, මේ මුදලින්. සමහර දරුවන් සල්ලි දෙන්නේ නැහැ. ඒ අම්මලා, තාත්තලා සල්ලි දුන්නොත් ගන්නවා මිසක, private class එකට වාගේ සල්ලි ගෙවුවාම දෙන කාර්ඩ් එක පෙන්වා ඇතුළට යන ක්‍රමවේදයක් පෙර පාසල තුළ නැහැ.

දරුවා අවුරුද්දම නිකම් යැව්වත් පෙර පාසල් පාලිකාතුමිය තමන්ගේ කටයුත්ත කරනවා. තමන්ගේ ජීවිතයේ හොඳම කාලයෙන් අවුරුදු 15ක්, 20ක් පුංචි දරුවන් වෙනුවෙන් වැය කරලා කීයක්වත් අතට ලැබෙන්නේ නැතිව අන්තිම කාලයේදී ඔවුන් ගෙදර ගිහිල්ලා අනුන්ගෙන් යැපෙන අය බවට පත් වෙනවා. මේ අය වෙනුවෙන් යම්කිසි වැඩ පිළිවෙළක් සකස් කරන්න ඕනෑ. විශ්වවිද්‍යාලවල සිටින උගත් අය, මේ පාර්ලිමේන්තුවේ අපි ඔක්කෝම ඇතුළු මේ රටේ විශාල පිරිසක් පෙර පාසල් ගිය අයයි. නමුත්, අපි මුල අමතක කරලායි හැම තිස්සේම කටයුතු කරන්නේ.

දැන් මේ සභාවේ ඉන්නේ ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා විතරයි. ඇමතිවරු කවුරුවත් දැන් මේ සභාවේ නැහැ. මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු 225ක් ඉන්නවා. නමුත්, දැන් මේ සභාවේ මන්ත්‍රීවරු 10ක් වත් නැහැ. අද උදේ දෙරණ නාලිකාවේ ගියා, "පාර්ලිමේන්තුවේ දවසකට ලක්ෂ ගාණක් වැය කරනවා; මාසයකට දවස් 8යි පාර්ලිමේන්තුව රැස්වන්නේ; මන්ත්‍රීවරු ඒ දවස් අටේවත් පාර්ලිමේන්තුවට එන්නේ නැහැ." කියලා. ඒක බැලුවාම මට මතක් වුණේ, මිය ගිය චන්ද්‍රා අක්කා එක දවසක් අපේ රැස්වීමකදී කියපු කථාවක්. ඇය කිව්වා, "සර්, පාර්ලිමේන්තුවේදී හැමදාම බණින්නේ මොන්ටිසෝරියටයි." කියලා. මම ඇහුවා, "ඇයි?" කියලා. පාර්ලිමේන්තුවේදී කෑ ගහගන්න කොට කියන්නේ, "මොන්ටිසෝරිය වාගේයි." කියලා ලු. ඇය කියනවා, "හැබැයි සර්, මොන්ටිසෝරියේ දරුවෝ ටික හැමදාම මොන්ටිසෝරියට එනවා. පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු ටික පාර්ලිමේන්තුවට එන්නේ නැහැ." කියලා. ඒ කථාව අද ඇත්ත වෙලා තිබෙනවා. මේ සභාව දිහා බැලුවාම අද කවුරුවත් නැහැ නේ. අපි මේ ගැන කොච්චර කිව්වත් ඒක ක්‍රියාවට නැංවෙන්නේ නැහැ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමනි, අඩුම ගණනේ පෙර පාසලක් මෙන්න මේ විධියට තිබෙන්න ඕනෑ කියලාවත් ප්‍රමිතියක් තිබෙන්න ඕනෑ. පෞද්ගලික තැනෙක පෙර පාසලක් තිබෙනවා නම් ඒක කරන්න බැරි වෙයි. හැබැයි, ගොඩාක් පෙර පාසල් තිබෙන්නේ රජයේ තැන්වලයි. එහෙම තැන්වල තිබෙන පෙර පාසල් ඒ ක්‍රමවේදයට හදලා පෙර පාසල් පාලිකාවන්ට අවම වශයෙන් මාසිකව රුපියල් 2,500ක් වත් ගෙවන්න කියලා ඉල්ලා සිටිනවා. අපේ ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය කාලෝචිත යෝජනාවක් ඉදිරිපත් කළා. එතුමිය දීර්ඝ කාලයක් ගුරුවරියක් විධියට කටයුතු කරලා ඒ අත් දැකීම් එක්ක තමයි මේ යෝජනාව ගෙනාවේ. ඒ සම්බන්ධයෙන් ඔබතුමියට ස්තුතිවන්න වෙමින් මම නවතිනවා. ස්තුතියි.

[අ.භා. 1.17]

**ගරු විජිත බේරුගොඩ මහතා**
(மாண்புமிகு விஜித பேருகொட)
(The Hon. Vijitha Berugoda)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය ඉතා වැදගත් යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. පෙර පාසල් නඟාසිටුවීම සහ ඒවායේ ප්‍රමිතිය සකස් කිරීමත්, ඒ ගුරුවරියන්ගේ වැටුප් පිළිබඳව සහ වෙනත් කාරණා සම්බන්ධයෙනුත් තමයි මෙම යෝජනාව ඉදිරිපත් කර

[ගරු විජිත බේරුගොඩ මහතා]

තිබෙන්නේ. උපන් බිමේ අනාගතය වෙනුවෙන් වර්තමානයේ ඉන්න පුංචි දරුවන් සම්බන්ධයෙන් ඉදිරිපත් කරපු මේ යෝජනාව දිහා බැලුවාම, අද අපේ රටේ ළමයි සම්බන්ධ තිබෙන ඛේදවාචකයන් අපට මතක් වෙනවා. ළමා අපයෝජන පිළිබඳව, ළමා අපචාර පිළිබඳව, වීදි දරුවන් පිළිබඳව, සිඟමන් යදින දරුවන් පිළිබඳව සහ සමාජ විරෝධී ක්‍රියාවලට කුඩා දරුවන් යොදා ගන්නා ආකාරය පිළිබඳව දිනපතා පුවත් පත් බැලුවාම අපි දකිනවා. ඒ නිසා මේ රටේ උපන් බිමේ අනාගතය සකස් කිරීමට ඉන්න දරුවන්ට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙන ඒ ඛේදවාචකයන් මුළු මහත් සමාජයම වෙලා ගෙන පවතිනවා. එවැනි අවස්ථාවක "මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන විධිමත් කිරීම" සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබෙන යෝජනාව බොහොම වැදගත්.

මෙවැනි වැදගත් විෂයයක් සම්බන්ධයෙන් කථා කරන මේ වෙලාවේ කාන්තා හා ළමා කටයුතු ඇමතිතුමිය ගරු සභාවේ නැහැ. අනෙක් පැත්තෙන් මේ රටේ අධ්‍යාපනය බාරව කටයුතු කරන අධ්‍යාපන ඇමතිතුමාත් සභාවේ නැහැ. හොඳ වෙලාවට පාර්ලිමේන්තුවේ සභානායකතුමා විධියට උසස් අධ්‍යාපන අමාත්‍යතුමා ගරු සභාවේ ඉන්නවා. එතුමා මේ දේවල් අහගෙන ඉඳලා අඩුම තරමේ මේ යෝජනා වෙනුවෙන් යම් සාධාරණයක් ඉෂ්ට කරයි කියලා අපි විශ්වාස කරනවා. එංගලන්තයේ හිටපු වින්සන්ට් චර්චිල් අග්‍රාමාත්‍යවරයා දෙවැනි ලෝක යුද්ධය අවසන් කරන්න කටයුතු කරපු කෙනෙක් බව අපි දන්නවා. එතුමා යුද්ධයෙන් පස්සේ ඒ රට දියුණු කිරීම පිළිබඳව අංශ 3ක් ගැන අවධානය යොමු කළා. එකක් තමයි "church". අනෙක් එක "children". අනෙක් එක තමයි "chicken". ඒකෙන් අදහස් කරන්නේ සෞඛ්‍ය, ආහාර සහ අධ්‍යාපනයයි. අධ්‍යාපනය කියන එක බොහොම වැදගත්. අධ්‍යාපනයේ මුල් අවස්ථාව තමයි මුල් ළමාවිය සංවර්ධන අවධිය -පූර්ව ළමාවිය සංවර්ධන අවධිය-. මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා මේ පිළිබඳව යම් අවධානයක් යොමු කළ ආකාරය අපි දැක්කා. විශේෂයෙන්ම ළමා සංවර්ධන අමාත්‍යාංශයත් මුලින්ම ආරම්භ කළේ එතුමායි. ඒ හරහා අද වෙනකොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල මුල් ළමාවිය සංවර්ධන නිලධාරින් පත් කරලා තිබෙනවා. ඊට අමතරව ළමා හිමිකම් නිලධාරින් පත් කරලා තිබෙනවා. මේ විධියට විවිධ තනතුරු ප්‍රමාණයක් ඇති කරලා තිබෙනවා.

අද හැම ගමකම මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන තිබෙනවා. බොහෝ දෙමව්පියන් තමන්ගේ දරුවන් ඒ මධ්‍යස්ථානවලට යවනවා. හැබැයි, මේවා එකම ප්‍රමිතියකින් යුක්තව ගුණාත්මක තත්ත්වයෙන් තිබෙනවාද කියන එක ප්‍රශ්නයක්. නමුත් දෙමව්පියන් දරුවන්ව ඒවාට යවනවා. සමහර මධ්‍යස්ථානවල ගුරුවරියන් වශයෙන් හැකියාව තිබෙන, දැනුම තිබෙන උපාධිධාරින් පවා සිටිනවා. මම දන්නවා, මොනරාගල දිස්ත්‍රික්කයේ තිබෙන බොහෝ මුල් ළමා විය සංවර්ධන මධ්‍යස්ථානවල ගුරුවරියන්ට අධ්‍යාපන පර්යේෂණ පුහුණු කිරීමේ ආයතනය විධියට ලංකාවේ තිබෙන ජාතික අධ්‍යාපන ආයතනයෙන් පවා ඩිප්ලෝමා ලබා දීලා තිබෙන බව. ඒ වාගේම විවිධ රාජ්‍ය නොවන සංවිධානවලින් ඩිප්ලෝමාධාරින් විධියට දැනුම සහ ඒ අවබෝධය ලබා ගෙන දරුවන්ට නිවැරදිව මග පෙන්වන කට්ටිය ඉන්නවා. නමුත් සමහර තැන්වල එහෙම නැහැ. ඒ නිසා මේ කාරණයට රජය මැදිහත් වෙන්න ඕනෑ. මේ රටේ අනාගතය සකස් කරන්නේ දරුවන් නම්, මේ රටේ අනාගතය කියන්නේ දරුවන් නම්, දරුවන් වෙනුවෙන් ගන්න ඕනෑ උපරිම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න අවශ්‍යයි. පසුගිය කාලවල අධ්‍යාපනයට සියයට 6ක් වෙන් කරන්න ඕනෑ කියලා කෑ ගැහුවා. ඒ වාගේම පාසල්වලට ගුරුවරු අඩුයි, මානව අවශ්‍යතා සහ භෞතික පහසුකම් නැහැ කියලා බොහෝ ප්‍රශ්න තිබුණා. ඒ නිසා අධ්‍යාපනයට සියයට 6ක් වෙන් කරනවා කියලා කිව්වා. හැබැයි, ඒ සියයට 6 වෙන් කරලා නැහැ. සියයට 6ක් අධ්‍යාපනයට වෙන් කරන්න බලාපොරොත්තුවක් තිබෙනවා නම්, මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ගැනත් අවධානය යොමු කළ යුතුයි. අවධානය යොමු කරලා, මේ රටේ අනාගතය වෙනුවෙන් මේ දරුවන් හැඩගස්වන්න කියන කාරණය මම මේ අවස්ථාවේදී සිහිපත් කරනවා.

මේ යෝජනාව ඉදිරිපත් කරපු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය ගුරුවරියක්. එතුමිය අත් දැකීමෙන්ම දන්නවා, අධ්‍යාපනයේ තිබෙන වටිනාකම. ඒ නිසා මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන පිළිබඳව රජයක් විධියට විශේෂ අවධානය යොමු කරන්න ඕනෑ. එතුමිය කාරණා කිහිපයක් කිව්වා. ඒ තමයි දරුවන්ගේ පරිසරය සහ ආරය. ඒක ඇත්ත. ආරය කියන්නේ දෙමව්පියන්ගේ ජාන ශක්තිය අනුව දරුවන් තුළ උපතින්ම පිහිටා තිබෙන යම් යම් හැකියාවන් සහ විභවතාවයන්. මේ සියලු විභවතාවයන් මතුකරලා, විකසිත කරලා ගන්න පුළුවන් වන්නේ පරිසරයෙන්. ඒ නිසා මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවල පරිසරය සකස් වෙන්නට ඕනෑ. අධ්‍යාපනික පරිසරයක් -ඉගෙනුම් පරිසරයක්- නිර්මාණය වෙලා තිබෙන්න ඕනෑ. හැබැයි, පෙර පාසල්වලට ගියාම ඒ තත්ත්වය තිබෙනවා ද කියන එක ප්‍රශ්නයක්. සමහර මධ්‍යස්ථානවල "නිදහස් ළදරු උයන" කියලා තිබෙනවා. හැබැයි, නිදහසක් නැහැ; පුංචි කාමරයක් තුළ කොටුවෙලා තමයි දරුවන්ට අවශ්‍ය දැනුම ලබා දෙන්නේ. ඒ වාගේම අවශ්‍ය උපකරණ නැහැ. සෙල්ලම් මිදුල, ක්‍රීඩාව සහ විනෝදාත්මක ක්‍රියාකාරකම් මඟින් තමයි දරුවන්ට අවශ්‍ය නිවැරදි මග පෙන්වීම කරලා දරුවන් ප්‍රාථමික අධ්‍යාපනයට ගැළපෙන විධියට සකස් කරන්නේ. නමුත් ඒ පහසුකම් නැහැ.

අනික් පැත්තෙන්, ඒ ගුරුවරු අද මහත් අසහනයට පත් වෙලා තිබෙනවා. මොකද, රජයෙන් වෙන් කරනවා කියපු රුපියල් 2,500 දුන්නේ නැහැ. රුපියල් 250ක් දෙනවා කිව්වා. ඒකත් හරියට ලැබෙන්නේ නැහැ. සමහර පළාත් සභාවල ප්‍රඥප්ති පිහිටුවලා යම් යම් දීමනා දෙනවා. හැබැයි, ඒක ප්‍රමාණවත් නැහැ. ඒ නිසා පුංචි දරුවන් වෙනුවෙන් විශාල වෙහෙස මහන්සියක් දරන ඒ ගුරුවරියන්ට අවශ්‍ය නිවැරදි පුහුණුව, මග පෙන්වීම, ප්‍රමිතිය සහ ඒ අයගේ වැටුප පිළිබඳ විශේෂ අවධානයක් යොමු කිරීම වැදගත් වනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම දීර්ඝව කථා කරන්න උත්සාහ කරන්නේ නැහැ. ඉතා වැදගත් යෝජනාවක් ඉදිරිපත් කර තිබෙන්නේ. ගරු අධ්‍යාපන ඇමතිතුමාත් මේ වෙනකොට මේ සභාවට ඇවිල්ලා තිබෙනවා. එතුමා ළඟත් ගොඩක් සංකල්ප තිබෙනවා. ඒ අතරට පරිගණක ලබා දීම, රක්ෂණ ක්‍රම ආරම්භ කිරීම වැනි සංකල්ප තිබෙනවා. ඒවා හොඳ යෝජනා. ඒවා අපි අගය කරනවා. ඒ නිසා ඔබතුමාගේ විශේෂ අවධානය මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවලට යොමු කරලා ඒවා නගාසිටුවන්න කටයුතු කරන්න. උපන් බිමේ අනාගතය භාරගැනීමට සිටින දරුවන්ගේ අනාගතය හැඩගස්වන්නට ඒ දරුවන්ගේ හැකියාවන් හෙළිදරව් කරලා, ඒ ගොල්ලන්ගේ ශක්තිය සහ දැනුම මේ රටට ප්‍රයෝජනයට ගන්න පුළුවන් වන විධියේ වැඩ පිළිවෙළක් සකස් කිරීමට ඔබතුමාගේ අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිමින් මා නිහඬ වනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 1.25]

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம் - கல்வி அமைச்சர்)
(The Hon. Akila Viraj Kariyawasam - Minister of Education)

ගරු මන්ත්‍රීතුමනි, මේ මුළු විවාදයම වාගේ පාර්ලිමේන්තු පරිශ්‍රයේ සිට මම අහගෙන හිටියා. ඔබතුමා චෝදනාවක් කළා, අධ්‍යාපන ඇමතිතුමාත් සභාවේ නැහැ කියලා. නමුත් පාර්ලිමේන්තු පරිශ්‍රයේ සිට මම අහගෙන හිටියා. ඒ නිසා තමයි ඔබතුමාගේ කථාව අතර ආපසු පැමිණියේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය මෙවැනි කාලෝචිත යෝජනාවක් ගෙන ඒම සම්බන්ධයෙන් මා එතුමියට ස්තුතිවන්ත වනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙය මගේ අමාත්‍යාංශයට අදාළ කාරණයක් නොවෙයි, කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ විෂයයට අයිති කාරණාවක්. පෙර පාසලෙන් දරුවෙකුට මුල් ළමා වියේ පදනම දැම්මට පස්සේ, ඒ දරුවා කෙළින්ම එන්නේ පාසලට. ඒ දරුවා පාසලේ පළමු ශ්‍රේණියට ඇතුළත් කළාට පස්සේ, අධ්‍යාපන අමාත්‍යාංශය වශයෙන් ඒ දරුවාගේ ඉතුරු කාර්ය භාරය භාර ගන්නේ අපි. එම නිසා පළමුවැනි ශ්‍රේණියට ඇතුළු වන දරුවන්ට එතැන් සිට විධිමත් අධ්‍යාපනයක් ලබා දීම සඳහා අපි විශාල වෙනස්කම් ටිකක් කරගෙන යනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසු ගිය කාලයේ ප්‍රාථමික ගුරුවරුන් ලෙස පත් කරනු ලැබුවේ ප්‍රාථමික ගුරුවරුන් ලෙස පුහුණු කළ අය නොවෙයි. බොහෝ වෙලාවට කළේ වෙනත් විෂයයක් උගන්වපු අතිරික්ත ගුරුවරයෙක් හෝ මාරු වීමේ පදනම මත පැමිණි ගුරුවරයෙකුට ප්‍රාථමික අංශයට උගන්වන්න දීපු එක. අපි මේ කාරණය සම්බන්ධයෙන් පුළුල්ව සාකච්ඡා කරලා, ප්‍රාථමික ගුරුවරු විධියට පුහුණු කරලාම ප්‍රාථමික අංශවල අධ්‍යාපනය සඳහා ගුරුවරුන් යොදා ගැනීමට වැඩ පිළිවෙළක් සකස් කරලා, දැන් එය ක්‍රියාත්මක කරගෙන යනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ පළාත් සභාවට පැවරී තිබෙන්නේ උපාධිධාරි සහ ඩිප්ලෝමාධාරි ගුරුවරුන් බඳවා ගැනීමේ බලතල පමණයි. නමුත්, පසු ගිය කාලය පුරා වැරැද්දක් වුණා. ඒ තමයි, විෂයයක් ඉගැන්වීම සඳහා එම විෂයයට පරිබාහිර වෙනත් උපාධිධාරින් බඳවා ගැනීම.

ඇත්ත වශයෙන්ම විය යුත්තේ, විෂයයට අදාළ දැනුම තිබෙන උපාධිධාරින් බඳවා ගැනීමයි. නමුත් සිද්ධ වුණේ, උපාධිධාරින් බඳවා ගැනීමේ හැකියාව තිබෙන නිසා, ඕනෑම විෂයයක් උගන්වන්න උපාධිධාරින් බඳවා ගත්ත එක. ඒ අයට පුහුණුවක් දෙනවාය කියනවා. නමුත්, විධිමත් පුහුණුවක් දෙන්නේ නැහැ. මේ තත්ත්වය තේරුම් අරගෙන දැන් මම කැබිනට් පත්‍රිකාවක් සකස් කරලා තිබෙනවා, ඉදිරියේදී ගුරුවරුන් ලෙස උපාධිධාරින් බඳවා ගන්නේ නම්, අදාළ විෂයයට ගැළපෙන උපාධියක් හෝ එම විෂයය පිළිබඳව ජාතික අධ්‍යාපන ආයතනයෙන් හෝ විද්‍යා පීඨයකින් හෝ විධිමත් පාඨමාලාවක් හදාරලා වසර 3 - 4ක පළපුරුද්දක් තිබිය යුතුයි කියලා. ඒ අනුව, අදාළ විෂයය පිළිබඳ විධිමත් පාඨමාලාවක් හදාරා ඇති අය බඳවා ගැනීමට කටයුතු කරන්නයි අපි හදන්නේ. එහෙම නොවුණොත්, අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ආරක්ෂා කරන්න පුළුවන්කමක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම ප්‍රාථමික ගුරුවරුන්ට විතරක් නොවෙයි, සියලු ගුරුවරුන්ට හැම විෂයයක් සම්බන්ධයෙන්ම පුහුණුව ලබා දෙන්න අපි තීරණය කර තිබෙනවා. ගුරුවරුන් පුහුණු කිරීම සඳහා රජයෙන් රුපියල් බිලියන දෙකක් පමණ අපට වෙන් කර තිබෙනවා. ඒ කටයුත්ත අපි ඉක්මනින් ආරම්භ කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම, තව නොබෝ දිනකින් මේ රටේ රජයේ පාසල්වලද, පෞද්ගලික පාසල්වලද, ජාත්‍යන්තර පාසල්වලද සියලු දරුවන්ට රුපියල් ලක්ෂ දෙකක රක්ෂණාවරණයක් අපි දෙනවා. එම රක්ෂණාවරණය මඟින් ඕනෑම වසංගත රෝගයක් සඳහා -මේ දිනවල බහුලව තිබෙන ඩෙංගු වසංගතය වෙන්න පුළුවන්- පෞද්ගලික රෝහලක නතර වුණත් රුපියල් ලක්ෂයක් දක්වා බිල අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ගෙවනවා. රජයේ රෝහලක නතර වුණොත්, දවසකට රුපියල් දහසක් දෙනවා. මොකද, අනෙකුත් පහසුකම් රජයේ රෝහල්වලින් දෙන නිසා. ඒ වාගේම, ඩිස්පෙන්සරියකින් බෙහෙත් ගත්තත් රුපියල් දසදහසක් දෙනවා. ඒ සඳහා ටෙන්ඩර් කැඳවා, මේ වන කොට ඒ කටයුතු අවසන් කරලායි තිබෙන්නේ. එම ටෙන්ඩරය රජයේ ආයතනයක් වන Sri Lanka Insurance Corporation Limited එකට දෙන්න තමයි අපි තීරණය කරලා තිබෙන්නේ. සාමාන්‍යයෙන් Insurance එකක් කරද්දී නියෝජිතයාට - agent - ලැබෙන සියයට 10ක් තිබෙනවා. අපි කිව්වා, ඒ සියයට 10 අපට දෙන්න කියලා. අපි ඒකෙන් ජනාධිපති අරමුදල වාගේ අරමුදලක් හදනවා. එය අපේ පාසල් පද්ධතියේ ඉන්න දරුවන්ගේ හදිසි ශල්‍යකර්මවලදී ප්‍රයෝජනයට ගන්න පුළුවන්. ඇටමිදුළු බද්ධ කිරීම වාගේ ඒවා වෙන්න පුළුවන්, තවත් එවැනි ශල්‍යකර්මවලදී පාවිච්චි කරන්න දෙන්න කියලා අපි ඒ සියයට 10 ඉල්ලුවා. එහෙම වුණොත්, අපට මේ අවුරුද්දේ රුපියල් මිලියන 270ක් ලැබෙනවා. අවුරුදු 4ක් වන කොට, රුපියල් මිලියන 270 ඒවා 4ක් ලැබෙනවා. එතකොට, ඒ මුදලට තව තව පොලී එකතු වෙලා අපට පාසල් දරුවන්ගේ ශල්‍යකර්මවලට ඒ මුදල යොදා ගන්න හැකියාව ලැබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වසර අවසන් වෙන්න පෙර නියාමක වැඩසටහනක් වශයෙන් tab පරිගණක ලබා දීමේ වැඩ පිළිවෙළ අපි ක්‍රියාත්මක කරනවා. ඒ වාගේම, වසර 13ක අඛණ්ඩ අධ්‍යාපනයේ නියාමක වැඩසටහන අපි සැප්තැම්බර් මාසයේ පටන් ගන්නවා. ගිය වසරේ O/L විභාගය අසමත් වුණු අයටත් අලුතින් විෂයයන් 26ක් හඳුන්වා දීලා, වසර 13ක අඛණ්ඩ අධ්‍යාපනය හඳුන්වා දීලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පෙර පාසල් නඟා සිටුවීම සඳහා මා දන්නා විධියට අපේ කාන්තා හා ළමා කටයුතු ඇමතිතුමියත් අවශ්‍ය නීති කටයුතු කරමින් යනවා. ගරු මන්ත්‍රීවරුන් කිව්වා වාගේ, අද හතු පිපෙන්නා වාගේ පෙර පාසල් පටන් ගන්නවා. මේ යෝජනාව ඉදිරිපත් කරපු ගරු මන්ත්‍රීතුමිය කිව්වා, අද පෙර පාසල් අධ්‍යාපනය ස්වයං රැකියාවක් වෙලා තිබෙනවාය කියලා. එම නිසා අපි නීති - රීති ගෙනැල්ලා, පෙර පාසල් අධ්‍යාපනය විධිමත් කළ යුතුයි. ඒ සඳහා licence එකක් දීලා, හොඳ පුහුණු ගුරුවරුන් පෙර පාසල් අධ්‍යාපනය සඳහා යොදා ගන්න ඕනෑ. මොකද, මුල් ළමා වියේදී තමයි දරුවන්ගේ අධ්‍යාපනයේ පදනම වැටෙන්නේ. ගහක් හැදෙද්දී මුලින්ම ලැබෙන පොහොර ටික සහ සාත්තුව තමයි එම ගහ රුස්ස ගහක් බවට පත් වෙන්න ඉවහල් වෙන්නේ. එම නිසා අපිත් බලාපොරොත්තු වනවා, පෙර පාසල් අවධියේ සිටම, එහෙම නැත්නම් මුල් ළමා අවධියේ සිටම ඒ දරුවන්ට අවශ්‍ය අධ්‍යාපනය ලබාදෙන්න. නමුත් කනගාටුවට කාරණාවක් තමයි, පසු ගිය දශක දෙකක් තිස්සේ ඒවා නොකර දැන් ඒවා ගැන කථා කරන එක. ඒ කාලයේ බොහෝ දේවල් කළ යුතුව තිබුණා.

[ගරු අකිල විරාජ් කාරියවසම් මහතා]

අපි විපක්ෂයේ ඉන්න කාලයේ දශකයට වැඩි කාලයක් මේ කරුණු ඕනෑ තරම් පෙන්වා දුන්නා. නමුත් ඒවා සිද්ධ වුණේ නැහැ. අපේ නව ආණ්ඩුව බලයට පත්වෙලා දෙවන අවුරුද්ද අවසන් වෙන්නේත් අගෝස්තු මාසයේදීයි. මේ වසර ඇතුළතදී මේ නීති - රීති සියල්ලම ගෙනැවිත් අවසන් කරන්න අපි බලාපොරොත්තු වනවා.

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟට, යෝජනාව ඉදිරිපත් කළ ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමියට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.31]

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)
බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. විශේෂයෙන්ම මෙම යෝජනාව වෙනුවෙන් අදහස් ප්‍රකාශ කළ අධ්‍යාපන ඇමතිතුමා ඇතුළු පක්ෂ විපක්ෂ සියලු මන්ත්‍රීවරුන්ට මේ වෙලාවේ මගේ ස්තුතිය පුද කරනවා. මෙහිදී කථා කළ සියලු මන්ත්‍රීවරුන්ගේ අදහස්වලින් අපට පැහැදිලි වනවා, පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානය තුළින් තමයි ළමයාගේ පදනම ගොඩ නැඟෙන්නේ; මනුෂ්‍ය ජීවිතයේ පදනම ගොඩ නැඟෙන්නේ කියලා. මෙතැනදී සිදු වන සමාජානුයෝජනය සිදු නොවීම නිසා, දීර්ඝ කාලීනව යම් යම් තැන්වලදී ඇති වුණු වැරැදීම් නිසා උද්ගත වුණු ප්‍රශ්න අද සමාජගත වෙලා තිබෙනවා. ඒ නිසා ජාතීන් අතර ගැටුම්, ආගම් අතර ගැටුම්, මානසික අවපීඩනයට ඔරොත්තු නොදෙන දරු පිරිසක් බිහිවීම සිද්ධ වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම, පවතින අධ්‍යාපන ක්‍රමය තුළ පිරිමි දරුවන් අතර මං වීම සිදුවෙනවා. මා හිතනවා, මේ සභාවේ ඉන්න මැති ඇමතිවරුන්ගෙන් වැඩි දෙනෙක් වර්ෂය අවසානයේදී පාසල්වල පැවැත්වෙන විවිධ ප්‍රසංගවලට සහභාගි වනවාය කියලා. ඒ විවිධ ප්‍රසංගවල පිරිමි ළමයින්ට තැනක් නැහැයි කියලා අපි දකිනවා. පිරිමි ළමයින්ට ඉදිරිපත් කරන්න අංග ඒවායේ නැහැ. එක්කෝ හින්දි සින්දුවකට, එහෙම නැත්නම් ආදර සින්දුවකට ගැහැනු ළමයින් රඟ දක්වන අවස්ථා තමයි තිබෙන්නේ. මේ රටේ පිරිමි ළමයින් 9, 10 පන්තිවලට එනකොට අධ්‍යාපනය අත් හැර යනවා. පිරිමි ළමයි බොහෝ විට අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය fail වෙනවා. උසස් පෙළ පන්තිවලට එන පිරිමි දරුවන් ප්‍රමාණය අඩු වනවා. මුල ඉඳලාම පිරිමි ළමයා අත් හැරීම එයට හේතුවක් විධියට මා දකිනවා. ඒක පෙර පාසලේ සිටම සිද්ධ වනවා. ඒ නිසායි මා යෝජනා කළේ, අධ්‍යාපනයට අවශ්‍ය භෞතික හා මානව සම්පත් විධිමත්, පිළිගත් ප්‍රමිතිවලට අනුව සංවර්ධනය වෙන්න ඕනෑය කියලා. අධ්‍යාපන ඇමතිතුමා කිව්වා වාගේ අද ඒ සඳහා වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවා නම් මා බොහොම සතුටු වනවා. සුදුසු පාඨමාලා සකස් වෙලා, අධ්‍යාපන සුදුසුකම් සහිත පාලිකාවන් මේ අධ්‍යයන කටයුතු සඳහා යොමු කරන්න ඕනෑය කියා මා යෝජනා කරනවා.

ඒ විතරක් නොවෙයි. අපි දන්නවා, ඒ පාලිකාවන් ළමයින්ගෙන් ලැබෙන දෙයින් ජීවත්වන තත්ත්වයට වැටී සිටිනවාය කියලා. පෙර පාසලේ ඉගැන්වූවේ කවුද කියලා අපටත් දැන් මතක නැහැ. මොකද, අවුරුදු හතරේ, අවුරුදු පහේ වයසේදී තමයි පෙර පාසලට යන්නේ. දැන් දරුවන් නම් අවුරුදු දෙකේ ඉඳලාම පෙර පාසල් යනවා. දෙමවුපියන් ළඟ ඉන්න ඕනෑ කාලයත් පෙර පාසලේ තමයි දරුවා ගත කරන්නේ. පෙර පාසල් ගුරුවරිය විශ්‍රාම ගන්නා වයසේදී ඒ හැමදෙනාටම අමතකවෙලා යන චරිතයක් බවට පත් වනවා. එම නිසා පෙර පාසල් පාලිකාවගේ අනාගතය සුරක්ෂිත කිරීමේ වග කීමකුත් රජයක් හැටියට අපට තිබෙනවා. මොකද, මේ රටේ පදනම සකස් කරන්නේ, මේ රටේ ළමා පරපුරේ පදනම සකස් කරන්නේ, එහෙම නැත්නම් වැඩිහිටි වියට පත්වන පුද්ගලයාගේ පදනම සකස් කරන්නේ පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානය භාරව කටයුතු කරන පාලිකාවයි. ඒ නිසා ඇය සතුටින් තැබීමත් රජයක් හැටියට අපේ වග කීමක් බව නැවත වතාවක් මතක් කරමින්, මේ අවස්ථාව ලබාදීම සම්බන්ධයෙන් ගරු නියෝජ්‍ය කථානායකතුමාට ස්තුතිය පුද කරමින් මා නිහඬ වනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා**
(மாண்புமிகு அப்துல்லா மஹ்ரூப்)
(The Hon. Abdullah Mahrooff)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, what is your point of Order?

**ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා**
(மாண்புமிகு அப்துல்லா மஹ்ரூப்)
(The Hon. Abdullah Mahrooff)
பாராளுமன்ற சம்பிரதாயம் இன்று மீறப்பட்டுள்ளது. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුස්ලිම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සියලුදෙනාටම සිකුරාදා දිනවලට පල්ලියට යන්න ඕනෑ නිසා උදේ 10.30 සිට 12.30 දක්වා පාර්ලිමේන්තුවේ කටයුතු පවත්වාගෙන යන්නත්, ඊට පස්සේ 1.30ට පාර්ලිමේන්තුවේ කටයුතු නැවත පටන් ගන්නත් පාර්ලිමේන්තුවේ පක්ෂ නායකතුමන්ලා තීරණයක් ගෙන තිබෙනවා.

මීට මාස 9කට පෙර මා ඉදිරිපත් කළ පළමුවන පෞද්ගලික මන්ත්‍රී යෝජනාව සාකච්ඡා කරන්න නියමිතව තිබූ දිනයේ, මා කථානායකතුමාට කියලා පල්ලියට ගියා.

එතකොට ගරු කථානායකතුමා මට කිව්වා, පස්වරු 3.00ට එන්න කියලා. මම මෙතැනට එනකොට "බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා එකහමාරට ආවේ නැහැ, ඒ නිසා postpone කළා" කියලා කිව්වා. මම **6**වැනිදා බංගලිදේශයේ ඉඳලා ආවා. Vote of Condolence කියලා **7**වැනිදාත් මේ යෝජනාව postpone කළා. පසුගිය මාසයේ මෙම යෝජනාව ගන්නට යෙදී තිබුණු දිනයේ, former Prime Minister, Hon. Ratnasiri Wickramanayakaගේ Vote of Condolence එක වෙනුවෙන් අතිගරු ජනාධිපතිතුමා කථා කළේ නැති නිසා එතුමාට කථා කරන්න එදින එම ශෝක යෝජනාව ගන්න තිබෙනවා කියලා නැවත වරක් postpone කළා. අද මම පල්ලිය ඇතුළේ ඉන්නකොට දවල් 12.00ට කියලා තිබෙනවා, "අද දින යෝජනා ඉදිරිපත් කිරීමට නියමිත මන්ත්‍රීවරු පස්දෙනෙක් ආවේ නැහැ, ඒ නිසා postpone කරනවා" කියලා. මගේ යෝජනාව very important. ඔබතුමාට මා කියන්න ඕනෑ;

வட மாகாணத்தில் நூற்றாண்டுகளாக வாழ்ந்த முஸ்லிம் சமூகம் 1990ஆம் ஆண்டு விடுதலைப் புலிகளால் - பிரபாகரனால் - பலவந்தமாக வெளியேற்றப்பட்டது. இப்படி யாக வட மாகாணத்திலிருந்து பலந்தமாக வெளியேற் றப்பட்ட முஸ்லிம் மக்களை, தற்போதைய வட மாகாண முதலமைச்சர் விக்னேஸ்வரன் அவர்கள் power இல் இருந்துகொண்டும் மீள்குடியேற்றுவதற்கான நடவடிக் கைகளை எடுக்கவில்லை. 95 சதவீதமான முஸ்லிம்கள் இன்று தங்களுடைய வேலை வாய்ப்பை பெறுவதற்குக்கூட முடியாமல் இருக்கின்றார்கள். ஆறு சுகாதார மையங்களில் புத்தளம் மாவட்டத்திலே வேலை செய்தவர்களையெல்லாம் வடக்குக்கு அழைத்திருக்கிறார். இந்த நேரத்திலே இந்த முக்கியமான யோசனையை -

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ඔබතුමාට යෝජනා කරනවා, මුස්ලිම් මන්ත්‍රීවරුන්ගේ යෝජනා සියල්ලම පළමුවෙන් ගන්න ඕනෑ කියලා. මගේ යෝජනාව ඉක්මනින් ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙනවා නම් හොඳයි. North and North Central Provinces දෙකේම මුස්ලිම් ජනතාවට ලොකු ගැටලු ඇතිවෙලා තිබෙනවා. එම නිසා මගේ යෝජනාව ඉක්මනින් ඉදිරිපත් කරන්න මට අවස්ථාව දෙන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. පල්ලියට යන්න ඉස්සෙල්ලා මුස්ලිම් මන්ත්‍රීවරුන්ගේ යෝජනා ඉදිරිපත් කරන්න අවස්ථාව දෙන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමා ඒ ඉල්ලීම කරනවා?

**ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා**
(மாண்புமிகு அப்துல்லா மஹரூப்)
(The Hon. Abdullah Mahrooff)
ඔව්, මම ඒ ඉල්ලීම කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමා දන්නවා ඇති, පාර්ලිමේන්තු ස්ථාවර නියෝග 34. (2) යටතේ, මන්ත්‍රීවරයාගේ නම ප්‍රකාශ කළායින් පසු අදාළ මන්ත්‍රීවරයා තමාගේ නමින් ඇති යෝජනාව ඉදිරිපත් කිරීමට සභා ගර්භයේ සිටියේ නැත්නම් එදා දවසේ නැවත එම යෝජනාව ඉදිරිපත් කරන්න පුළුවන්කමක් නැහැ කියලා. ඔබතුමා මේ ඉල්ලීම කළ නිසා, ඊළඟ දිනයේ "පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනා" අවස්ථාවේදී පළමුවෙන්ම ඔබතුමාගේ යෝජනාව ඉදිරිපත් කරන්න අවස්ථාව ලබාදෙන්න අපි වග බලාගන්නවා.

**ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා**
(மாண்புமிகு அப்துல்லா மஹரூப்)
(The Hon. Abdullah Mahrooff)
வட புல முஸ்லிம்களுடைய பிரச்சினை மிகவும் பாரதூர மாக இருக்கின்ற காரணத்தினால் எங்களுடைய பிரதிச் சபாநாயகர் அவர்கள் இதனைக் கவனத்திற்கொள்ள வேண்டு மென்று விநயமாகக் கேட்டுக்கொள்கின்றேன்.

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 1.39ට, අද දින සභා සම්මතිය අනුව, 2017 ජූලි මස 25 වන අඟහරුවාදා අ.භා. 1.00 වන තෙක් කල් ගියේය.***

*அதன்படி பி.ப. 1.39 மணிக்கு பாராளுமன்றம், அதனது இன்றைய தீர்மானத்திற்கிணங்க, 2017 யூலை 25, செவ்வாய்க்கிழமை பி.ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Parliament Adjourned accordingly at 1.39 p.m. until 1.00 p.m. on Tuesday, 25th July, 2017, pursuant to the Resolution of Parliament of this day.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.